

# مجالات العبادة في الإسلام

# ඉස්ලාම්හී වන්දනාමාන ක්‍රමය

باللغة السنهالية

# ඉස්ලාමීය
# වන්දනාමාන ක්‍රමය

අල් දාර්හි ප්‍රකාශනයක්

සිංහලෙන්
අබ්දුල් හකීම් මුහියිද්දීන්

නිරීක්ෂණය
මුහම්මදු නාසිම්

ⓒ دار الورقات العلمية للنشر والتوزيع، ١٤٢٥هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

القسم العلمي بالدار
مجالات العبادة في الإسلام./ القسم العلمي بالدار؛ عبدالكريم محي الدين.- الرياض، ١٤٢٥هـ
٧٦ ص، ١٢ × ١٧ سم
ردمك: ٩ - ١ - ٩٥٤٩ - ٩٩٦٠
(النص باللغة السنهالية)
١- العبادات (فقه إسلامي)     أ. محي الدين، عبدالكريم (مترجم)     ب- العنوان
ديوي ٢٥٢     ١٤٢٥/٣٢٦٩

رقم الإيداع: ١٤٢٥/٣٢٦٩
ردمك: ٩ - ١ - ٩٥٤٩ - ٩٩٦٠

حقوق الطبع محفوظة

الطبعة الأولى
١٤٢٥هـ - ٢٠٠٤م

بسم الله الرحمن الرحيم

මහා කාරුනික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්, පැසසුම් සියල්ල සර්වඥාන අල්ලාහ්ට අයත්වේ. මහු ප්‍රශංසා කර මහුගෙන්ම සහාය පතා සිටිමු. අපගේ පාපයන් හට මහු ගෙන්ම පව්සමා අයදිමු. පව් සහ නින්දිත ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද මහුගෙන්ම සහාය පතමු. කරුණාබර අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේද, හෙතෙම නොමග යැවීමට කිසිවෙකුට කළ නොහැකිය. එමෙන්ම අල්ලාහ්ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේද, ඒ තැනැත්තා යහමගට කිරීමට කිසිවෙකුට කළ නොහැකිය. නවද වැඳීමට සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත්, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ කීකරු අනාවැකියා සහ අවසාන වක්තෘවරයා බවත් මම සාක්ෂි දරමි.

මිහිපිට ජීවත්වන මිනිසා අති සම්භාවණීය අන්දමින් නිර්මාණය කර, එහි ජීවත්විය හැකි අන්දමින් සුවහසක් පහසුකම් නිසිරිසි ලෙස සපයා දී, භුක්ති විඳිනු වස් ඒවා තමා සතු කර දුන් එකම එක පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුට පමණක් වන්දනාමානයන් ගරුබුහුමන් කළයුතු බව ස්ථිරසාරව වටහා ගෙන ඇත්තේ අල්ලාහ් දෙවිඳුගේ අසහාය දයාවෙහි පදුවන මුස්ලිම්වරු පමණි.

අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කළ යුතු බව මනා අන්දමින් වටහා ගෙන සිටින අප ඒ හා සමාන තවත් වටිනා කමෙන් අනූනවූ කරුණක්ද මනාව වටහා ගත යුතුව ඇත. එනම් අල්ලාහ්ට කළයුතු වන්දනාමාන කළ යුත්තේ කුමන අන්දමින්ද? එවාට අදාළ නීතිරීති කුමක්ද? වන්දනාමානයන් යනුවෙන් පවසන කළ එයට අන්තර්ගත යුත්තේ කුමන මාදිලියේ කට යුතුද? යන්නන්ය. මන්දයත් වන්දනාමානයට අදාළ කරුණු

සහ විස්තර මනාව වටහා ගෙන සිටින කෙනෙකු මිස ඒවා ගැන දැනුමක් නැත්තෙකු අල්ලාහ්ට කළ යුතු වන්දනාමා නයන් ඍජුව නිදොස්ව කළ නොහැකි යන්න සාක්ෂාත්ය.

තමා පමණක් වන්දනාමාන කළ යුතුය යන එකම ඉලක්ක යක් හේතු කොටගෙන අල්ලාහ් දෙවිඳු මිනිසා මෙලොව නිර්මාණය කර ඇත්නම් අප කෙසේ ඒ වන්දනාමානයන් සිතාන්තව සතුටෙන් ප්‍රියමනාපව කළ යුතුද යන්නද වටහා ගැනීම අපගේ පරම යුතුකමකි. එහෙයින් ඒ වන්දනාමාන යන් කෙසේ පරිසමාප්තව, අනූනව ඉටු කරනවාද යනුවෙන් පැනයක් සහ කුකුසක් අප තුල මතු වන්නේ නම් ඍජු වන්දනාමානය යන රාමුව තුලට ඇතුල්වන කටයුතු මොන වාද යන පැන යන් අප තුල පැන නගින්නේ නිරායාසය කිනි. ඒ මැයෙන් ඉස්ලාම් දහමේ වන්දනාමානයන් යනුවෙන් අප පවසන කළ එය ප්‍රධාන කොටස් දෙකකට වෙන් කර විස්තර කළ හැකිය.

1. වන්දනාමානය යන වදන ඉස්ලාමීය පරමාධිපත්‍ය නීති රීතිද මිනිසාගේ ජීවිතය වෙනුවෙන් වූ සමාජීය නීති පද්ධතියද අන්දතර්ගත වූ සංයෝගයකි.

2. එසේම වන්දනාමාන යනු මිනිසා සම්බන්ධ අභ්‍යන්තර සහ භාහිර සියලු කටයුතු අන්තර්ගත වන්නේය.

ඉස්ලාමීය නීතිරීතිද වන්දනාමනයට අයත් වේ

ඉස්ලාම් දහම පවසන නීතිරීති සියල්ල සපුරාම වන්දනා මානය යනුවෙන් වේ යන්නට සාධනය මතු සඳහන් දේව වැකිය මනා ලෙස පැහැදිලි කරයි. *'මිනිසුනේ! ඔබගේ දෙවිඳු ශ්‍රීපමණක්) නමදිවු'.* (2 : 21)

ඉහත සඳහන් දේව වදනේ පවසන වන්දනාමානයන් ගැනද එහි කොටස් සහ විවිධත්වය ගැනද ඒ වන්දනාමානයන්

සියල්ල දහමේ අන්තර්ගතව තිබේද යන්න ගැනද විද්වත් ඉමාම් ඉබ්නු තෛමියාගෙන් විමසන ලදී. එයට එතුමා මිනිසා කවර හේතුවක් උදෙසා නිර්මාණය විදෝ දහම තුල ඒවා සියල්ල පරිසමාප්ත අන්දමින් අන්තර්ගතවී කරන්නට පහසු කර ඇත යනුවෙන් සෘජුව පිළිවදන් දුන්හ.

එතුමා තව දුරටත් පවසන කළ වන්දනාමානය යනු අල්ලාහ් දෙවිඳු ප්‍රිය වන අභ්‍යන්තර සහ බාහිර සියලු වදන් සහ ක්‍රියාවන් අන්තර්ගතව ඇති බවත්, ඒ මැයෙන් දේව නැමදුම, සකාත් බද්ද, උපවාස ශීලය, හජ්, සත්‍ය පැවසීම, යුතුකම් පරිසමාප්ත අන්දමින්ම ඉටු කිරීම, යහපත් දේ කෙරෙහි අමතා අයහපත් දේ ගැන වළක්වීම, ප්‍රතික්ෂේප කරන්නන් සහ කුහකයන්ට විරුද්ධව සටන් කිරීම, අසල් වැසියන්, අනාථයන්, දුගීන්, මගීන් සහ යාචකයන් සමග කරුණාවෙන් කටයුතු කිරීම, තවද සමාජ වැසියන්, සතුන් සහ පක්ෂීන් වැනි ජීවයන් හා ආදරයෙන් කරුණාවෙන් කටයුතු කිරීම, ප්‍රාර්ථනාව, ධ්‍යානය සහ අධ්‍යාපනය හැදෑරීම වැනි සියල්ල වන්දනාමානය යන රාමුව තුලට ඇතුල් වන්නේය.

එසේම අල්ලාහ් දෙවිඳු සහ ඔහුගේ වක්තෘ වරයාට ප්‍රේම කිරීම, අල්ලාහ් දෙවිඳුගේ කර්ශක අඩුවමට බිය වී තමා කළ අදැමිටුකම් ගැන හෘදයාංගව ඔහුගෙන්ම පව් සමාව අයැද, කිරීමට අණවී ඇති වන්දනාමානයන් ඔහු වෙනුවෙන් පමණක් නිහතමානීව කර, ඔහු පනවන ආඥාවන් වචනයේ පරිසමා ප්ත අන්දමින් පිළිගෙන ඒවා ක්‍රියාවෙහි යොදා ඔහු විසින් තමාට ලබාදී ඇති අප්‍රමාණ අනුග්‍රහයන් සහ වරප්‍රසාද වෙනු වෙන් ස්තුති වන්ත වී, ඔහු විසින් ලියා ඇති නොවන්නට සළස්වා ඇති පෙර මිනුම හෙවත් දෛවය පිළිගෙන තවතවත් ඔහුගේ අනු ග්‍රහයන් අයැද, තම කාර්යයන් සියල්ල ඔහු වෙතම පවරා, අකුසල වෙනුවෙන් ඔහු විසින් සකසා ඇති

නිරයේ ගොරතර වේදනාවට බියවී ජීවත්වීම වැනි සියලු කටයුතු වන්දනාමානයන් සණයෙහිලා සැළකිය හැකිය.

විද්වත් ඉමාම් ඉබ්නු තෛමියා තුමා පවසන අයුරු ඉස්ලාමීය වන්දනාමානය පුළුල් පහසු පරාසයක් තුල නියෝජනය වන අතර, ඉස්ලාමීය අණ කරන දේව වන්දනය, උපවාස ශීලය, සකාත් බද්ද, හජ් කටයුත්ත, ප්‍රාර්ථනාව, පව් සමා අයැදීම, අඛණ්ඩව අල්ලාහ් දෙවිඳු දික්ර් කිරීම තවද මිනිසා තුල අන්තර්ගතව පවතින යහදම් වන සදාචාරය, සත්‍ය කතා කිරීම, යුතුකම් පරිසමාප්ත අන්දමින් ඉටු කිරීම, පොරොන්දු කඩ නොකර ඒවා සම්පූර් ණයෙන්ම ඉටු කිරීම, අල්ලාහ් දෙවිඳු සහ ඔහුගේ වක්තෘ වරයාට ප්‍රේම කිරීම, ඔහුට පමණක් බිය වී කටයුතු කිරීම, සියලු වන්දනාමානයන් ඔහු වෙනු වෙන් පමණක් නිහතමානිව ඉටු කිරීම, තමන් කල පව්වු සහ අදැමිටු වෙනුවෙන් පශ්චාත්තප වී අල්ලාහ් දෙවිඳුගෙන් පව් සමා අයැදීම, ඔහුගේ සියලු නීතිරීති ඉවසුමෙන් පිළි ගැනීම, අල්ලාහ් දෙවිඳු තමාට පිරිනමා ඇති අනුග්‍රහයන් සහ වරප්‍රසාධයන් වෙනුවෙන් ඔහුට ස්තුති වන්ත වීම, ඔහුගේ සියලු මිනුමන් සහ ඉරණම ඒ අයුරෙන්ම පිළි ගැනීම වැනි ඉස්ලාම් දහම ප්‍රසිද්ධ කරන සියලු දේ ඉස්ලා මීය වත් පිළිවෙත් යන රාමුව තුලට ඇත්ල වේ.

ඉහත සඳහන් කළ සියලු දේ වන්දනාමානයන් යනුවෙන් වටහා ගත් අප එහි ප්‍රධාන කරුණු දෙකක්ද මනාව වටහා ගැනීමට බැඳී සිටිමු. ඒවා මෙසේය :

- යහකම් කෙරෙහි අමනා නොහොඳ දෙයින් ඉවත් කිරීම.
- ප්‍රතික්ෂේප කරන්නන්, කුහකයන් සහ ඉස්ලාම් දහමට විරුද්ධ කටයුතු කරන්නන්ට විරුද්ධ කැරලි බැසීම.

ඉබ්නු තෛමියා තම ග්‍රන්ථයක තවත් තැනක සඳහන් කරන විට ඉස්ලාම් දහම පනවන නීතිරීති අප අපගේ ජීවිතයේ අර්ථානුශාරයෙන්ම පිළිපැදිය යුතු අතර ඒ නීති රීති සහ ආඥාවන් අනුව කටයුතු කිරීමට අල්ලාහ් දෙවිඳු කුමණ අන්දමින් නීති සම්පාධනය කර දී ඇත්දෝ ඒවා සහ ඒවාට අදාළ මූලික කොන්දේසිද ආරක්‍ෂා කර පිළිපැදීමට බැඳී සිටිමු. එහෙයින් අල්ලාහ් දෙවිඳු වැඳුම්පිදුම් කිරීම පිණිස වූ ක්‍රම සහ විදි වන මූලික වගන්ති ලෙස කුමක් විධානය කර ඇත්දෝ ඒවාද වන්දනාමාන කටයුතු යනුවෙන් සැළකේ. මෙසේ අප ලෞකිකව කරන සියලු කටයුතු සහ ක්‍රියාවන් ගැන සළකා බලද්දී ඒහි යහපත් ඒවායැයි සැළකෙන සියල්ල වන්දනාමාන සණයෙහි ලා සැලකිය හැකිය. මේ මැයෙන් ගණනය කරන විට වන් දනාමාන යන වදන සියලු මාර්ගයෙන් අල්ලාහ්ගේ අන පනත්, ආඥාවන් හට කීකරු වී පරිසමාප්ත අන්දමින් ඉටුකර ඔහුගේ ප්‍රියමනාපය ලබා ගැනීම සඳහා වූ කටයුතු කිරීමක් යනුවෙන් අර්ථවත් වන බව පවසා ඇත.

## මිනිස් ජීවිතය සපුරාම වන්දනාමානයකි

ඉහත විස්තර කළ කරුණු ආශ්‍රයෙන් විද්වත් ඉබ්නු තෛමියා තුමා පැහැදිලි කළ සියලු දේ වන්දනාමානයන් වන්නේ නම් මිහිපිට වසන මිනිසා එහි තම ජීවිතය කුමන අන්දමින් ගෙවිය යුතුද, ගතකළ යුතුද යන්නද, ඒවා කිරීමට දහම ඔහුට එහි අක්මුල් ගැන මනා ලෙස පැහැදිලි කර දී ඇති බවද වටහා ගන්නේය. එසේ පැහැදිලිව වටහා ගන්නා ඔහු, ඔහුගේ දෛනික ජීවිතයේ තම උවමනාවන් සපුරා ගන්නා අටියෙන් ඔහු ආහාරපාන ගැනීම, ශරීරකෘත උවමනාවන් ඉටු කිරීම, රටක් සහ සමාජයක් පාලනය කිරීම වැනි මෙහි කීනොකී අනන්ත ලෞකික කටයුත්තන්හී නිරත වන විට ඔහු පිළිපැදිය යුතු පිළිවෙත්, පද්ධතීන්, ක්‍රම සහ විදි සියල්ල

උසස් පරමාර්ථයක් කරගෙන අති උසස් අල්ලාහ් වෙනුවෙන් පමණක් යන පරම පිවිතුරුව නිහතමානී චේතනාවෙන් ක්‍රියා කරයි. එසේ උසස් පරමාර්ථයෙන් කටයුතු කරන විට හුදෙක් ඒවා ඔහුගේ උවමනාවන් සපුරා ගැනීම පිණිස කළද ඒවා පිවිතුරු අන්දමින් අල්ලාහ්ගේ ආඥාවන් ඉටුකළ වන්දනා මානයක් යන ඉලක්කය සම්පූර්ණ කළ හා සමාන වන්නේය.

එහෙයින් මිනිසාගේ මඟපෙන්වීම සහ සුභසිද්ධිය වෙනුවෙන් පහළවූ සුර වදන වන අල්කුර්ආනය, මිනිසා තම දෛනික උවමනාවන් සහ අභිලාෂයන් සපුරා ගන්නා රිසියෙන් කරන ක්‍රියාවන්ද, ඒයින් බැහැර වූ දහමාශ්‍රිත නීතිරීතිද, එවැනි අනෙකුත් චාරිත්‍ර සහ ව්‍යවහාරයන් සම්ප්‍රදායයන්ද අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් ඉටුකරන වන් දනාමාන ගණයෙහිලා සැළ කෙන්නේය. එසේම ඉස්ලාමීය ක්ෂේත්‍රයේ තවත් බොහෝ කරුණුද, අල්කුර්ආනයේ දෙවැනි පරිච්ඡේදය වන බකරාහ් විස්තර කර ඇති 'අප ඔබ කෙරෙහි අනිවාර්යය කෙළෙමු' යන වාක්‍ය මගින් අල්ලාහ් ප්‍රියවන සියල්ල වන්දනාමානයන් බව සාක්ෂාත් වෙමින් පවතී. එසේම මිනිස් සමාජය උදෙසා පනවා ඇති එවැනි තවත් කරුණු කීපයක් ගැනද පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි.

*විශ්වාස වන්ත අයවලුනි, ඝාතනය උදෙසා පලිගැනීම පිණිස ඔබට සරිසමාන කරණය නියමිතය.* (2 : 178)

*(විශ්වාස වන්තයිනි) ඔබගෙන් කෙනෙකුට මරණය ආසන්න වූ කළ ඔහු යම් ජේසතක් අතැර යන්නේද ඔහු (තම) දෙමාපියන්ටද, නැදැයන්ටද, ඒ ජේසත් යහසේ වසියියත් හොවත් (අවසාන ඔප්පු) හිමිකම් කර විය යුතුයැයි ඔබට නියම කර ඇත.* (2 : 180)

*විශ්වාස වන්තයිනි, ඔබට පෙර විසූ අය කෙරෙහි උපවාස ශීලය පවරනු ලැබුවාක් සේ ඔබ ශ්‍රද්ධාවන්තයින් වනු වස් ඔබ කෙරෙහිද උපවාසය පවරන ලදී.* (2 : 183)

*සටන් කිරීම එය ඔබට ප්‍රියංකර නොවූවද (ඔබගේ යහපත උදෙසා) ඔබ කෙරෙහි පවරන ලදී. යම් දෙයක් එය ඔබට හොඳව තිබියදී ඔබ එය ප්‍රිය නොකරන්නට පුළුවන. යම් දෙයක් එය ඔබට නරකව තිබියදී ඔබ එය ප්‍රිය කරන්නට පුළුවනි.* (2 : 216)

ඉහත් සඳහන් ශුද්ධවූ අල්කුර්ආන් වදන් මගින් විස්තර වන පලියට පලි ගැනීම, අන්තිම කැමැති පත්‍රය ලිවීම, රමදාන් මාසයේ උපවාස ශීලයේ යෙදීම, අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ව්‍යාභිචාර කර්මයන්හි යෙදෙමින් කටයුතු කරන ප්‍රති ක්ෂේප කරන්නන් සහ කුහකයන්ට එරෙහිව සටන් ප්‍රකාෂ කිරීම වැනි සියලු කටයුත්තන් අල්ලාහ් දෙවිඳු තම අතවැසි යන් කෙරෙහි අනිවාර්යය කර ඇති ඒවාය. අල්ලාහ් දෙවිඳු කුමක් අනිවාර්යය කර තීරණය කර ඇත්දෝ එය මුළුමනින්ම තම ජීවිතයේ පිළිගෙන ක්‍රියාකිරීම අප පරම යුතුකම වේ.

පෙර සඳහන් අල්කුර්ආන් වදන පිරික්සදී වන්දනා මාන යනු මිනිසා දෛනික ඉටුකළ යුතු වන්දනාමාන පිරිසිදු චේථනා වෙන් ඉටු කිරීම, නිසිලෙස සකාත් බද්ද ගෙවීම, රමදාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීම, නිර්ධනයන්ගේ උවමනා උදෙසා ඒවා සපුරාලීම පිණිස උවමනා අනුව දන්දීම, පහසුකම් සහ අවස්ථා ලද කළ හජ් සහ උම්රා කර්තව්‍ය නිමකිරීම, අවස් ථා ලද කළ අල්ලාහ් ධ්‍යාන කිරීම, දික්ර් සහ ප්‍රාර්ථනා කිරීම සහ මෙවැනි අනෙක් සමහර කටයුතුද වන්දනාමානයන් යනු වෙන් පිළිගන්නන් ඒ සමග චරිතවත් පැවැත්මද සෑම අවස්ථා වකදීම විනයානුකූලව හැසි රීමද අල්ලාහ් විසින් අන කර ඇති බව අමතක කරමින් කටයුතු කරති.

එහෙයින් වන්දනාමාන යනු හුදෙක් දෛනික වන්දනය, උප වාස ශීලය, සකාත් බද්ද, හජ් කටයුත්ත, ප්‍රාර්ථනා කිරීම සහ පව් සමා අයැදීම වැනි සුළු කටයුත්තන් හා සීමා නොවන්නේය. එසේම අල්ලාහ් දෙවිඳු පරමාධිපත්‍ය අන්දමින් විධානය කර ඇති විනය සහ යහපත් ගුණධර්මද එලෙසම පිළිපැදීමට සියලු දෙනා බැඳී සිටින බවද වටහා ගත යුතුව ඇත. මෙසේ බලන කළ දහම ගැන මනා ලෙස වටහා ගෙන කටයුතු කරන සමහර ආගම් මාමකයන්ද චරිතවත් විනය සහ යහපත් ගුණදර්මයන් කෙසේ වුවද අල්ලාහ් දෙවිඳු පවසන දෛනික වන්දනාමාන සහ උපවාස ශීලය වැනි අප පෙර සඳහන් කුසල් කර්මයන් කළේ නම් අල්ලාහ් ඉදිරිපිට තමන් බියබැති අනවැසියන් වීමට ප්‍රමාණවත් යැයි ගණනය කරමින් කටයුතු කරයි. නමුදු යථාර්ථය එසේ නොව. අප ඉහත සඳහන් කළ යුතුකම් දහමේ එක්තරා වන්දනාමායේ සමහර කොටසක් පමණක් නියෝජනය කරන අතර ඒවා ඉටුකිරීමෙන් පමණක් දහමේ අනපනත් සහ ආඥාවන් සම්පූර්ණ වූවායැයි තීරණය කළ නොහැකිය. පරමාධිපත්‍ය අනපනත් වලින් සමන්විත වන්දනාමානයන් හැර මිනිස් ජීවිතයේ විවිධ අවස්ථා නියෝජනය වන අවස්ථාවෝචිත යහපත් සහ ගුණ ධර්මයන් වන්දනාමානයන් ලෙස, වන්දනාමාන යන රාමුව තුලට ඇතුලත් කර ඒවා අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු බව අනපනවා ඇත. මිනිසා සමජය තුල ජීවත වන්නේය. එබැවින් අල්ලාහ් දෙවිඳු එවැනි විනයාශ්‍රිත ආචාර්යධර්ම සහ සීල වන්දනාමාන රාමුව තුලට ඇතුලත් කර ඒවා පිළිපැදිය යුතු බව විධානය කර ඇත. එහෙයින් මිනිසා තම ජීවිතය කාලය තුල ඉටුකළ යුතු වන්දනාමානයන් ලෙස නියෝග ලබා ඇති කටයුතු හැර දෛනිකව කරන්නාවූ විනයශීලී, ආචාරශීලී ශික්ෂා කටයුතු සියල්ලම අල්ලාහ් වෙනුවෙන් වූ පවිත්‍ර චේථනාවෙන්

පමණක් ඉටුකරන කළ ඒවා උසස් වන්දනාමානයන් යන සණයෙහිලා සැළකෙයි. එහෙයින් මිනිසාගේ දෛනික ජීවිතය සහ ඒ හා සම්බන්ධ කටයුතු සහ ක්‍රියාවන් සියල්ල සපුරාම වන්දනාමාන වේ.

අල්ලාහ් දෙවිඳුට කීකරුවීමද වන්දනාමානයකි

වත්මනයේ බොහෝ දෙනෙකු අල්ලාහ් දෙවිඳු උදෙසා කරන වන්දනාමානයන් වචනයේ පරිසමාප්ත අන්දමින් කිරීමේ දැණුමකින් තොරව වන්දනාමාන සණයෙහිලා සැළකෙන්නේ කුමක්දයි වටහා ගැනීමට නොහැකිව මංමුලා වී සිටිති. වන්ද නාමානයන් කිරීමට වන්දනාමානයේ නීතිරීති සහ සීමාවන් ගැන මනා දැනුමක් ලබාගැනීම සහ අධ්‍යයනය කිරීම සියලු දනන්ගේ පරම යුතුකමකි. එහෙයින් වන්දනාමන යනු අල්ලාහ් ප්‍රිය වන අල්ලාහ් ආඥා කර ඇති ප්‍රතිපත්තිමය වාචික සහ ක්‍රියා පරිපා ටියෙන් සමන්විත ඒවාය. ඒවාට යටත් වී පිළිගෙන කට යුතු කිරීම අරහයා සුරවදනක් මෙසේ විස්තර කරයි :

*තවද අපි සවන් දුනිමු. කීකරු වීමු. අපගේ හිමියනි, ඔබගෙන් සමාව ඉල්ලමු. (මරණින් පසු) ආපසු අප යවන තැන ඔබ වෙතය' යනුවෙන් මවුන් කීවෝය.* (2 : 285)

ඉහත සඳහන් සුර වදන තුලින් පැහැදිළිව වන්නේ අල්ලාහ්ගේ ආඥාවන් හට පරිසමාප්ත අන්දමින් අන්තර් ගතව යහපත් දේ පිළිගෙනද අයහපත් දැයින් ඉවත් වීද අල්ලාහ් දෙවිඳුට සම්පූර්ණ යටත් වී කටයුතු කිරීම වේ.

අර්ථානුසාරයෙන්ම ඉස්ලාම් දහම පිළිගෙන පිළිපදිනා සත්‍ය විශ්වාස වන්තයෙකු නිරන්තරයෙන්ම අනෙකුත් මුස්ලිම්වරුන් ගෙන් වෙනස් කෙනෙකු වන්නේය. මන්දයත් අල්ලාහ් සහ ඔහුගේ කීකරු වක්තෘ වරයා පිළිගෙන ඒ අන්දමින් තම ජීවිතය ගත කරන්නා කිසිවිටෙක පහත් චින්තවලින් සමන්

විත තම සිතට වහල් වී අල්ලාහ් හැර අල්ලාහ්ගේ නිර්මාණ යන් තම දෙවියා සහ හිමි ලෙස පිළිගැනීමෙන් වළකී එකම එක පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳු කෙරෙහි පමණක් විශ්වාස තබන්නේය. අන් අය දකින දකින සියලු දේ හෝ හිතට නැගෙන දේ තම හිමි ලෙස දෙවිඳු ලෙස පිළිගන්නා අයුරු, කිසිවිටෙක ඔහු එවැනි අදහස් ධාරාවක් හදමනසේ ස්ථිර කර ගැනීමෙන් වළකී පවිත්‍ර අදහසින් කටයුතු කරන්නේය. දහම අනුමත නොකළ ඒවා අන් අය ආගම ලෙසින් පිළි ගන්නා සේ හෙතෙම ආගම අනුමත නොකළ දේ ආගම් ලෙස හෝ අව්‍යාජ සංකල්පයක් ලෙස නොපිළිගන්නේය. අන් අය තම හද මනස චින්තනයට වහල්වනු සේ හෙතෙම තම චින්ත නයට සහ එහි පහත් තෘෂ්ණාවන් හට වහල් නොවෙය. වෙනුවට අල්ලාහ් දෙවිඳු විසින් අනිවාර්යය කර ඇති පිළිවෙත් සම්පූර්ණයෙන්ම ඉටු කර මින්ද, ඔහුට ඔහුගේ හිමිගෙන් ආඥාවූ පනත් සපුරා කරමින්ද උසස් ශ්‍රද්ධා වන්තයෙකු ලෙස වැජඹෙන්නේය.

යමෙකු අල්ලාහ් දෙවිඳුගේ අනපනත් පිළිගෙන ඒ අර්ථානු සාරයෙන්ම තම ජීවිතය තුල කටයුතු කළ යුතු බව පවසද්දී එය කෙසේ විය යුතු වේ නම් සූර වදන වන අල්කුර්ආනය හෙලි දක්වන අල්ලාහ් දෙවිඳුගේ අනපනත් සහ ඔහුගේ වක්තෘ මුහම්මද් (සල්) තුමාගේ අනුශාසනාවන් අනුව දිවි පෙවෙතෙහි කටයුතු කිරීම අල්ලාහ් දෙවිඳු සහ ඔහුගේ කීකරු අනවැසියන් අතර කරගත් රමානීය එනම් විශ්වාස වන්ත පිරිසිදු චේථනාවෙන් හෙබී ගිවිසුමකි.

නුඹේ අනවැසියෙකු වහලෙකු වන මම මගේ මනස පහත් අභිලාෂයන් හට වහල් නොවී ඔබ පවසන පනවන නීති රීතිවලට එකඟවී යටත්වී ඒ අනුව පරිසමාප්ත අන්දමින් කටයුතු කරන බව අර්ථානුසාරයෙන්ම ප්‍රතිඥා වීමද ඒ

ර්මානිය විශ්වාස ගිවිසුමේ තවත් ලක්ෂණ යකි. අල්ලාහ් දෙවිඳු සහ ඔහුගේ කීකරු අනවැසියා වන මිනිසාද ඉහත සඳහන් කළ තුන්කොන් සත්‍ය ර්මානීය ගිවිසුම නිරසාර බව අල්කුර්ආනය අපට මෙසේ කරුණු පැහැදිලි කරයි.

*නවද අල්ලාහ්ද, ඔහුගේ වක්තෘ වරයා යම් කාරණයක් කෙරෙහි තීරණය කළහොත් ඔවුන්ගේ ඒ කටයුත්තෙහි වෙනත් අදහස් දැක්වීමට විශ්වාස වන්ත පිරිමියෙකුට හෝ විශ්වාස වන්ත ස්ත්‍රියකට හෝ අයිතියක් නැත. අල්ලාහ්ටද ඔහුගේ වක්තෘ වරයාටද අකීකරු වුවහොත් ඔහු ප්‍රකට දුර්මාර්ගයෙහිය.* (33 : 36)

*විශ්වාස වන්තයින් හට ඔවුන් අතර (පැන නගින ප්‍රශ්න වලට) විනිශ්චය කරන්නට අල්ලාහ් වෙත සහ ඔහුගේ වක්තෘ වරයා වෙත පැමිණෙන ලෙස ඔවුන් කැඳවනු ලැබූ කල්හී ඔවුන් පවසන්නේ 'අපි සවන් දුනිමු. අපි කීකරු වූයෙමු' යන්න පමණි. සඵල වන්නෝ ඒ අයමය.* (24 : 51)

පෙර සඳහන් අල්කුර්ආන් වැකි කීපය ගැන කරුණු විමසා බලද්දී යමෙකු තමා අල්ලාහ් වෙනුවෙන් පමණක් වන්දනාය කරන බවත්, වාර්ෂික උපවාස ශීලය ඉටුකරන බවත්, ඔහු විසින් අනිවාර්යය කරන ලද හජ් කටයුත්ත නිමකරන බවත් පවසන අතර තමාට තම හදමනස පවසන අන්දමින් කටයුතු කිරීමට නිදහසද ලැබී ඇත යනුවෙන් පවසමින් අල්ලාහ් විසින් තහනම් කරන ලද මත් ද්‍රව්‍ය පාවිච්චි කිරීම, සූබර මාංශ අනුභව කිරීම, තම මුදල් පොලියට දීම, දහමේ යමක් එහි නීති ක්ෂේත්‍ර තුලින් ස්ථිරසාරව පවසා තිබුණද ඒවා තමාට නුවුවමනාය තම ලෞකික පැවැත්මට සහ එහි අභිවෘධියට නුසුදුසුය යනුවෙන් පවසා අත්තනෝමතික අන්දමින් ඉටුකිරීමෙන් ඉවත් වීම, අල්ලාහ් විසින් පහළ කරන ලද අල්කුර්ආනය හැර අන් නීති ක්ෂේත්‍රයේ ඇති නීතිරීති මගින් විනිශ්චය කිරීම

වැනි අන්දමින් කටයුතු කරන්නේ නම් හෙතෙම අල්ලාහ් සහ මහු පවසන ආගමික නීතිරීති පිළිපදින සත්‍ය විශ්වාස වන්තයෙකුගේ සණයෙහිලා සැළකීමට නොහැකිය.

එසේම ඉස්ලාම් දහම පවසන සමහර වන්දනාමාන සහ නීතිරීති වැනි දේ පිළිගෙන ඉටුකරමින් පසුවන කෙනෙකු ඉස්ලාම් දහම පරමාධිපත්‍ය ආඥාවෙන් පවසන අනෙකුත් සමහර විනය, ශික්ෂා නීති පද්ධති සහ සදා චාරයන් අත් හැර හෝ ඒවා පිටුදැක හෝ ඉස්ලාම් දහමේ තහනම් කළ පටසේල සහ රන් ආභරණ වැනි දේ පැළඳගනිමින් ස්ත්‍රීන් සේ වෙස්වලාගෙන කටයුතු කරන්නන් අවංකව අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කරන සත්‍ය විශ්වාස වන්තයින් ලෙස නාමධාරී කිරීමට නොහැකිය. එහෙයින් දේවස්ථානයකට ඇතුල්වී කරන වන්දනාමානයන් සහ දේව නැමදුම්, උපවාස ශීලය සහ හජ් කටයුත්ත වැනි සමහරක් පමණක් වන්දනාමාන යන් ලෙස ගණනය කරමින් අන් කටයුතු සහ අවස්ථාවන් වෙනුවෙන් වූ නීතිරීති සහ ආඥාවන් නොවැදගත් වන්දනා මානයන් යනු වෙන් පවසන්නා නියම විශ්වාස වන්තයෙකු නොවන්නේය. එසේම තමාට සුදුසු හෝ වේවා නුසුදුසු හෝ වේවා ඒවා තම ජීවිතයට උචමනාය යනුවෙන් අධිෂ්ඨාන කරගෙන කටයුතු කරන්නන් කිසිදු වැදගම්මකට නැති හෝ නියම ඉස්ලාමීය රාමුව තුලට ඇතුල් නොවන සාමාන්‍ය මිනිසෙකු බව ඉහත සඳහන් අල්කුර්ආන් වැකිය පැහැදිලි කරයි.

අල්ලාහ්ගේ ඍජුමග හැර අන් මගක් තෝරා ගන්නා අල්ලාහ්ට ආදේශ කළ කෙනෙකු වේ

ඉස්ලාම් දහම මිනිසා විසින් ඉටුකළ යුතු අනන්ත අප්‍රමාණ යුතුකම් පවරා දී ඇති සේම, අප දෛනිකව කරගෙන යන කටයුත්තන්හිද සමහර දේ හලාල් සහ හරාම් යනුවෙන් පැහැදිලි කර වෙන්කර තීරණය කර ඇත. ඒ නීතිරීතිවලට

අනුගතව අනිවාර්යයෙන්ම යටත්වී කටයුතු කළ යුතු යන්න ස්ථාපිතව පවතිද්දී අපගෙන් බොහෝ දෙනකු අවස්ථාවෝචිතව ඇති වන්නාවූ අවස්ථා වන්හී හෝ භුදෙක් පාරිසාරික උවම නාවන් පිණිස හෝ ඒ නීතිරීතීන් මගහරිමින් කටයුතු කරනු අප අනන්තව දැක ඇත්තෙමු. ආගමානුසාරයෙන් බලන කළ එය ඉතා අවාසනාවන්ත සන්සිද්ධියක්යැයි කිව හැකිය.

ඉස්ලාම් දහම පනවන නීතිරීතිවලට කීකරු වී අල්ලාහ් වෙනුවෙන් පමණක් වන්දනාමානයන් ඉටුකර, උපවාස ශීලය රැක, හජ් කටයුත්ත වැනි දේ අර්ථානුසාරයෙන් ඉටු කර එවැනි වන්දනාමානයන් හැර අන් ලෞකික කටයුතු, පවුලේ සමාජ කටයුතු හා සම්බන්ධ වගකීම් ඉටුකිරීමේදී අල්ලාහ් විසින් පණවන ලද නීතිරීති පිටුදැක හෝ උදාසීන කර, තම බලමහිමය අනුව හෝ තම සිත්සේ හෝ අල්ලාහ් හැර අන් අය විසින් සම්පාධන කරන ලද නීතිරීතිවලට අනුගතව කටයුතු කරන්නේ නම් හෙතෙම අල්ලාහ් හැර අන් ව්‍යාජ දෙවි කෙනෙකු වන්දනාමාන කළ කෙනෙකු ලෙසද, අල්ලාහ්ට ඉටු කළ යුතු කටයුතු සහ යුතුකම් නිසිලෙස ඉටු නොකළ කෙනෙකු ලෙසද වන්නේය.

අප වසන, දකින මෙම විශ්වය සහ එහි ඇති අනන්ත අප්‍රමාණ නිර්මාණයන් අල්ලාහ්ට අයත් අල්ලාහ්ගේ නිර්මාණයන් වේ. අල්ලාහ් දෙවිඳු ඒවා පාලනය කරමින් තම අනසක යටතෙහි පවත්වා ගෙන කටයුතු කරන්නේය. ඒවායේ එකම අයිතිකරුවාද එහි පාලනයේ අග්‍ර බලමහිමයාද වන්නේ ඔහුය. ඒ නිර්මාණයන් කළ යුතු යුතුකම් අණ කරමින්ද ඉවත්විය යුතු දේ ගැන අනතුරු ඇඟවා ඒවායෙන් ඉවත් වී කටයුතු කරන ලෙසද නියම කරන්නේ ඔහුය. අනුමත දේ හලාල් ලෙසද නොඅනුමත දේ හරාම් ලෙසද ඉස්ලාම් දහමේ සියලු නීති රීති සම්පාධනය කරන්නේද ඔහුය. එහෙයින් සියලු

නිර්මාණයන් ඔහුගේ අනපනත්වල සම්පූර්ණයෙන්ම කීකරු වී කටයුතු කිරීම අති වැදගත්ය.

අල්ලාහ්ගේ නිර්මාණයක් වන සාමාන්‍ය මිනිසා ඔහුගේ අනුමැතියෙන් තොර යමක් සිත්සේ දහම ලෙස ප්‍රසිද්ධ කිරීමට හෝ නොවන්නට මෙය කළ යුතුය, මෙය නොකළ යුතුය යනුවෙන් නීති පැනවීමට හෝ අනුමත නොකළ දෙයක් අනුමත කිරීමට අවස්ථාවක් උදා කර දීමට හෝ අනුමත කළ දෙයක් තහනම් කර කිරීමෙන් වළකීමට හෝ තමාට අයිතියක් ඇතයි කෙනෙකු තීරණය කරන්නේ නම් හෙතෙම අල්ලාහ් විසින් පනවන ලද සීමාවන් ඉක්මවා ඔහුගේ පරමාධිපත්‍ය නීති මාලාවන් කඩ කළ දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ ඔහු අල්ලාහ්ගේ තරමට තමා උසස් කර ගැනීමට වෙර දැරූ කෙනෙකු බවට පත් වන්නේය.

එසේම ඉහත සඳහන් ආකාරයට තමාට අයිතිවාසිකමක් ඇතැයි පවසන කෙනෙකු ඔහුගේ හදමනස සහ මනෝපය අනුව තමා ප්‍රියවන සියල්ල හලාල් ලෙස හෝ හරාම් ලෙස හෝ කර තම සිතට චින්තනයට හැඟෙන අයුරු නීති සම්පාදනය කර, ඒ අනුව කටයුතු කරන්නේ නම් හෙතෙම අල්ලාහ් විසින් නිර්මාණය කළ, මැවූ යමක් වන්දනාමාන කළ අදැමිටු කළ කෙනෙකු ලෙසද, ඔහු දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ අල්ලාහ්ට සම්පූර්ණ යෙන්ම ආදේශ කළ, ඔහුගේ ඒකීයත්වය ප්‍රතික්ෂේප කළ කෙනෙකු ලෙසද වන්නේය.

පෙරදිනවල ජීවත්වූ මුනිවරුන් පාදිරිවරුන් සහ රිශි වරුන් ඔවුන් තම සිත්සේ දහම අනුමත නොකළ දේ හලාල් යනුවෙන්ද දහම අනුමත කළ දේ හරාම් යනුවෙන්ද ප්‍රසිද්ධියේ ප්‍රචාරය කරමින් එසේ කරන ලෙස දැහැමි පුද්ලගයන් දිරි ගන්වමින්ද කටයුතු කළ විට කිතුනුවන් සහ යුදෙව්වන් ඒවා ඔවුන්ගේ වාග් මාලාව අනුවම පිළිගෙන දහමට පටහැනිව

කටයුතු කරන්නට වූහ. එසේ තම පාදිරිවරුන් සහ මුනි වරුන් ආඥා කළ අයුරු කටයුතු කරන විට ඒවා දහමේ අනුමත කළාද, අනුමත නොකළාද, දැමිටුද, කුසල් ක්‍රියාවන්ද, අදැමිටුද යනුවෙන් තෝරා බේරා කටයුතු කිරීමට උනන්දු නොවූ හෙයින් ඔවුන් අල්ලාහ්ගේ ආඥාවන් හට ඉඳුරාම පිටුපා, ඒ අය තම දෙවියන් ලෙස කර ගත්හ. එසේ ක්‍රියාකරන්නා නිසැකවම අල්ලාහ් දෙවිඳුට ආදේශ කළ කෙනෙකු ලෙස පත්වන බව අල්කුර්ආනය පැහැදිලිව දැනුම් දෙයි. එහෙයින් ඒ පරිශුද්ධ අල්කුර්ආන් වදන පවසන ඒ අනතුරු ඇඟවීම ගැන අපගේ අනෙකුත් සහෝදරයන්ද දැනගත යුතු මනාය. අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

*ඔවුන් අල්ලාහ් හැර තම යතිවරුන්ද, මුනිවරුන්ද මර්යම්ගේ පුත් මසීහ්ද දෙවියන් ලෙස පත් කර ගත්හ. නමුදු ඔවුන් එක් දෙවියෙකු හැර (අන්කිසිවකට) වන්දනාමාන නොකරන ලෙස ආඥා කරන ලද අය වූහ. වැඳීමට සුදුසු දෙවියා ඔහු හැර අන් කෙනෙකු නැත. ඔහු, ඔවුන් ආදේශ කරනා දෙයින් ඉතා පිරිසිදු වන්තායාය.* (9 : 31)

ඉහත සඳහන් අල්කුර්ආන් වැකිය පහළවූ හේතුව ගැන විස් තර කරන විට හමුහම්මද් නබි (සල්) තුමා මෙසේ විස්තර කළහ. එතුමාගේ කලණ මිතුරෙකු වන අදී බින් හාතිම් ඉස්ලාම් දහම පිළිගන්නට පෙර තිව්‍ර කිතුනුවෙකු ලෙස කටයුතු කළේය. මුහම්මද් තුමා ඒක දේවවාදය ගැන ප්‍රචාරය කරන කළ ඔහු එයට පටහැනිව කටයුතු කළ තද කිතුනු වෙකු ලෙස විය. ඔහුගේ පියා හාතිම් අත්තායි පින් දහම් කරන අනුන්ට සළකණ උධාර සිතෙන් සහ විවෘත මනස කින් කටයුතු කළ කෙනෙකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටියේය. එකේශ්වර වාද සංකල්පය ප්‍රචාරය කරමින් මුහම්මද් නබි තුමාගේ ප්‍රචාරයේ යටතට මක්කා වැසියන් පත්වන කළ

එයට බිය වූ ඔහු මක්කාවෙන් පිටවී සිරියාව බලා පිටත් වී ගියේය. ඔහු සිරියාවේ පසුවන කළ ඔහුට නොදැනී ඔහුගේ සහෝදරියෙක්ද ඔහුගේ පවුලේ තවත් සමහර අයද ඉස්ලාම් දහම වැළඳ ගත්හ. ඔහුගේ සහෝදරිය ඉස්ලාම් දහම පිළිගත් පසු මුහම්මද් නබි තුමා ඇයට සමහර තෑගි ප්‍රධානය කළහ. වරෙක තම සහෝදරයා මුණ ගැසුණු ඇය මුහම්මද් නබි තුමාගේ පරාර්ථකාමී ගතිය ගැන ප්‍රශංසාමුඛව කතා කර ඉස්ලාම් දහම පිළිගන්නා ලෙස ඔහුගෙන් ඉල්ලා සිටි අතර ඒ වෙනුවෙන් නිතර නිතර දිරි ගැන්වූවාය. තම සහෝදරියගේ දිරිගැන්වීමෙන් සහ මුහම්මද් තුමාගේ උධාර ගති පැවතුම්වලින් වසී වුනු ඔහු සිරියාවෙන් ආපසු තම පදිංචි ස්ථානය වෙත එන කළ මුහම්මද් තුමා මුණගැසීම පිණිස මදීනා නගරයට ගියේය. කා අතරත් ප්‍රසිද්ධියට පත්ව සිටි අදී බින් හාතිම් මදීනාවට එන බව වූ හොඬුවාව කා අතරත් පැතිරී ගියේ ලැව් ගින්නක් මෙනි. ඔහු මුහම්මද් තුමා මුණ ගැසීමට එතුමා ඉදිරියට ගිය කළ එතුමා මතු සඳහන් අල්කුර්ආන් වැකිය උසුරමින් පසුවන්නට වූහ.

*ඔවුන් අල්ලාහ් හැර තම යතිවරුන්ද, මුනිවරුන්ද මර්යම්ගේ පුත් මසීහ්ද දෙවියන් ලෙස පත් කර ගත්හ. නමුදු ඔවුන් එක් දෙවියෙකු හැර (අන්කිසිවකට) වන්දනාමාන නොකරන ලෙස ආඥා කරන ලද අය වූහ. වැඳීමට සුදුසු දෙවියා ඔහු හැර අන් කෙනෙකු නැත. ඔහු, ඔවුන් ආදේශ කරනා දෙයින් ඉතා පිරිසිදු වන්තායාය.* (9 : 31)

මුහම්මද් තුමා අල්කුර්ආන් වාක්‍යය පාරායනය කිරීම අවසන් කළ විට එයට අවධානය යොමු කරමින් සිටි අදී බින් හාතිම් මේ වාක්‍ය පවසන අන්දමින් කිතුනුවන් තම පාදිරිවරුන් සහ මුනිවරුන් දෙවියෙකු ලෙස කිසිවිටෙක පත් කර ගත්තේ නැතැයි පවසන්නට විය. එය ඇසූ මුහම්මද්

තුමා ඇත්ත, ඔවුන් ඔවුන්ගේ පාදිරිවරුන් සෘජුව වන්දනාමාන කළේ නැත, නමුදු ඔවුන්ගේ කටයුතු සහ ක්‍රියාවන් තම පාදිරිවරුන් වන්දනාමාන කිරීම සමාණයි යනුවෙන් පවසන්නට වූහ. අල්ලාහ් විසින් හරාම් කළ දේ ඔවුන් හලාල් ලෙස ප්‍රකාෂ කළහ. අල්ලාහ් විසින් හලාල් කළ දේ ඔවුන් හරාම් කළහ. දහම ගැන දැනුමක් තිබු ණද තම ග්‍රන්ථවල ඒවා ගැන පැහැදිලිව සඳහන් වී තිබුණද ඔවුන්ගේ ඒ වදන් කිතුනුවන් සම්පූර්ණයෙන්ම පිළිගෙන කටයුතු කළහ. මෙසේ අන්ධානුකරනයෙන් ඔවුන්ට කීකරු වී අල්ලාහ්ට සමාන ඔවුන් වන්දනාමාන කරන හා සමාන කරුණකි යනුවෙන් එතුමා පවසූහ. (අහ්මද්, තිර්මිදි සහ ඉබ්නු ජරීර්)

තවද හුදෛෆා බින් යමානි තුමා සහ ඉබ්නු අබ්බාස් තුමා යන දෙන්නා මෙම අල්කුර්ආන් වැකියට අර්ථ කථනය කරන විට ඔවුන්ගේ පාදිරිවරුන් සහ රිෂිවරුන් අන්ධානුකරනයෙන් සහ අත්තනෝමතික අන්දමින් හරාම් හලාල් යන්න සිත්සේ පිළිපැදූ බව සටහන් කර ඇති බව අල්කුර්ආනයට අර්ථ කථණය කළ ප්‍රබල විද්වතෙකු වන ඉබ්නු කසීර් තුමා විස්තර කරයි. තවද මුහම්මද් තුමාගේ කලණ මිතුරෙකු වන සදීඋ තුමා පවසන විට එදා විසූ කිතුනුවන් ඔවුන්ට දෙවියන් විසින් ආඥාකරන ලද නීතිරීතිවලට කීකරු නොවී ඒවා පිටුදැක ඔවුන් සමග සිටි පාදිරිවරුන් සහ රිෂිවරුන්ගේ අත්තනෝමතික වදන්වලට කීකරු වී ඔවුන්ගේ මනදොල තුටු කරනු වස් කළ වදන් සහ දේශනවලට කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ කීකරු වී ඔවුන් පිළි ගනිමින් ජීවත් වූහ.

*නමුදු ඔවුන් එක් දෙවියෙකු හැර (අන්කිසිවකට) වන්ද නාමාන නොකරන ලෙස ආඥාකරන ලද්දන් වූහ.* (9 : 31)

පරම දෙවිඳු අල්ලාහ් යමක් හලාල් යැයි අනුමත කළා නම් එහි තවත් අදහසකට අවස්ථාවක් නොවන අන්දමින් එය

හලාල් වේ. එසේම හරාම්යැයි පැවසූ විට එය ඒ අන්දමින්ම හරාම් යැයි පිළිගත යුතුය. එහෙයින් අල්ලාහ් විසින් ආඥා කරන ලද අන්දමින් හරාම්, හලාල් වැන්නත් එහි පරිසමාප්ත අන්දමින් පිළිගෙන කටයුතු කිරීම අතවැසියන්ගේ පරම යුතුකම යන්න පෙර සඳහන් අල්කුර්ආන් වදන මනාව පැහැදිලි කරයි. තවත් තැනකද, සම්පූර්ණයෙන්ම පිළිපැදිය යුත්තේ අල්ලාහ් දෙවිඳුගේ අණපනත් පමණක් යන්න සැකෙවින් විස්තර කරන අතර, එහි ව්‍යාංගර්ථය වන්නේ අල්ලාහ් දෙවිඳුට ආදේශ නොකර සම්පූර්ණයෙන්ම කීකර වීම වේ යන්න සුපැහැදිලිය. මතු සඳහන් අල්කුර්ආන් වදනද ඒ කරුණම තවත් ස්ථිරව පහැදිලි කරයි.

*වැඳීමට සුදුසු දෙවියා ඔහු හැර අන් කෙනෙකු නැත. ඔහු (අල්ලාහ් දෙවිඳු) ඔවුන් ආදේශ කරනා දේ වෙතින් ඔහු සුවිශුද්ධය.* (9 : 31)

සමාජ කටයුතුද දැමිවු ක්‍රියාවන්වේ

හුදෙක් ඉස්ලාම් දහමේ වන්දනාමානයන් එක්තරා සීමාව කට සීමා නොකර මිනිසාගේ සිත්සතනද විවර කර හෝ චින්තනයට සීමාකර ගන්න බැරි හෝ පහසුවෙන් වටහා ගන්න බැරි ක්‍රියාවට යොදා ගන්නා වූ කටයුතු පවා අල්ලාහ් වෙනුවෙන් කරන වන්දනාමාන සණයෙහිලා සැළකීමට තරම් විශාල පාරාසයකට අයත් දහමකි.

ඒ වෙසින් පවසතොත් මිනිසා සමාජ සමෘධිය සහ එහි ප්‍රගතිය උදෙසා ඉස්ලාම් දහමේ සීමාවන් තරණය නොකර සිතන සිතුම්, පතන පැතුම් සහ කරන ක්‍රියා වන් සියල්ල දැමිවු වන්දනාමානයන් යන රාමුව තුලට අන්තර්ගත වේ යන්න සාක්ෂාත්‍ය. එසේම ඒවාට ලැබෙන සුවිපාකද උසස් අන් දමින් වන්නේය. නමුදු එසේ යමෙකු කරන ඒ කටයුත්තත් සහ සිතුම්පැතුම් හුදෙක් මිනිසා තෘප්ති කරවන්නට හෝ

මුනිවජාවට හෝ කරන දෙයක් නොවිය යුතුය. එසේ වන් නට එහි කිසිදු ඵලවිපාකයන් බලාපොරොත්තු විය නොහැක.

භුදෙක් මිනිසා දුක්දොම්නසෙන් කරදර වන අයුරු යමක් සිදුවී ඔහු ඒ ක්‍රියාව නිසා මහත්සේ දුකට පත් වන්නේ නම් ඔහුගේ දුක්කරදර සහ දොම්නසෙහි හවුල් වීමෙන්ද, එයට හේතුවූ කෙනා හෝ අවස්ථාවට විරුද්ධ හැකි ලෙස නැගී සිටීමද, ණය තුරස්වලින් පීඩනය වන්නාට තමාට හැකි අයුරු පිටිවහල් වීමද, තම උවමනාවක් පිණිස යන්නාට එයට සරිලන අයුරු ආධාර වීමද, තැනකට යන කෙනෙකු තම මංතොට හෝ තමා යා යුතු ස්ථානයට යා යුතු පිළිවෙලක් ගැන මනා අවබෝධයක් නැතිව පසුවන කළ එයට පිටිවහල් වීමද ඉස්ලාමීය දෘෂ්ටි කෝණය තුළින් අත් වන්නේ විශාල පිනකි. එසේම ලෞකික සහ අධ්‍යාත්මික අධ්‍යාපන කටයුතු වලට උදව් උපකාර කිරීමෙන්ද තමා සතුව දැනුමක් වේ නම් එය අනුන්ට බෙදා දීමෙන්ද, තමා ගමන් කරන මහමගෙහි තමාට හෝ අනුන්ට හෝ බාධාවන අයුරු තිබෙණ දෙයක් ඉවත් කිරීමද, එසේම අනෙක් විවිධ අන්දමේ කටයුත්තන්ද කරන විට ඒවා සියල්ල අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් පමණක් යන පිරිසිදු චේතනාවෙන් ඉටුකරන විට ඇත්තේ අද්විතීය ඵල විපාකයකි. එවැනි සමාජය සහ පරිසරය උදෙසා කරන සියළුවිධ කටයුතු අල්ලාහ් අභියස විශාල සුවිපාකයක් ලබා දෙන පුණ්‍ය කටයුතු බව වෙනත් අදහසක් නැත. මෙමැයෙන් පවසන කළ මිනිසා තමාට අනිවාර්ය වූ වන්දනාමාන සණයට අයත් කුසලන් හැර අන් සියළු සමාජ සහ පාරිසාරික කටයුත්තන් සියල්ලද එය පිරිසිදු චේතනාවෙන් ඉට කරන කළ එයට ඇත්තේ අසහාය පිනකි.

එදිනෙදා කරන පස්වතා නැමදුම, වර්ෂයේ රමළාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීම, වාර්ෂිකව ඉටු කරන සකාත් බද්ද,

දික්ර් කිරීම, උවමනාවන් ඇතිවන විට අල්ලාහ් කෙරෙහි ප්‍රාර්ථනා කිරීම පමණක් කුසල් කර්මය යන රාමුව තුලට ඇතුලත් දැමිටු ක්‍රියාවන් නොව. වෙනුවට වත්මන් සමාජය තුල ඇති විය හැකි අනන්ත අප්‍රමාණ විවිධ සිදුවීම් සහ සම්භාවයන් වේ. එවාට ප්‍රති කර්ම කිරීම සහ සමාජය තුල සිදුවිය හැකි අනේකවිධ ගැටීම් සහ විපරීතයන් නොවන අයුරු ක්‍රියාකිරීම වැනි අවස්ථාවන්හිදී ඒවා අල්ලාහ් වෙනුවෙන් කරණ බව පිරිසිදු චේථනාවෙන් කළ යුතුය. එසේ කිරීමෙන් පමණක් ඒවා කුසල්, දැමිටු ක්‍රියාවන් ගණයෙහිලා සැළකිය හැකි අතර භුදෙක් කරන්නන් වාලේ කිරීමෙන් හෝ ලෞකික ඵලප්‍රයෝජන උදෙසා කිරීමෙන් එය කුසල් කර්මයක් යනුවෙන් කිව නොහැකිය. මන්දයත් එය භුදෙක් මිහිපිට ප්‍රසාධය උදෙසා මුනිවජාවට කරන කටයුත්තක් බැවිනි.

එකිනෙකා සණ්ඩුදබර කරගැනීම සහ නොමනාපයෙන් පසු වීම භුදෙක් සමාජය තුල මිනිසුන් අතර පාෂාණීභූතව පවතින සාමාන්‍ය සිදුවීමක් බවට පත්වී ඇත යන්න සුපැහැදිලිය. එසේ ඇතිවන හබයක් ප්‍රශ්ණයක් සමනයට පත්කිරීම ගැන විස්තර කරන කළ මුහම්මද් නබි තුමා මෙසේ විස්තර කළහ. 'රමළාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීමද, දෛනික පස් වතා වන්දනාමානයද, දුගීන් අතර බෙදා දෙන සදකා නම් දන් බෙදා දීම වැනි දැමිටු ක්‍රියාවලට වඩා කුසලක් සාක්ෂාත් කරගත හැකි යමක් ගැන ඔබලාට කියා දෙන්නදැයි තම කලණ මිතුරන්ගෙන් විසමූ කළ ඔවුන් '*එසේය අල්ලාහ්ගේ වක්තෘ තුමනි*' යනුවෙන් උනන්දුවෙන් පිළිවදන් දුන්හ. එයට මුහම්මද් නබි (සල්) තුමා 'දෙන්නෙක් අතර සාමය ඇති කිරීම වේ. දෙන්නෙක් අතර අවුල් දබර ඇති කිරීම දහම බූගා ඉවත් කිරීම වේ' යනුවෙන් වදාළහ. (අබූදාවුද්, තිර්මිදි සහ ඉබ්නු හිබ්බාන්) තවත් කියමනක එය බූගැම යනුවෙන් ලිහිල්

දෙයක් ලෙස නොපවසමි, එය දහම සහ සත්‍යය සම්පූර්ණ යෙන්ම ඉවත්කර බූගා දැමීම වේයයි සඳහන් වේ. (තිර්මිදි)

එසේම රෝගියෙකු බැහැදැක ඔහුගේ සැපසනීප ගැන විම සන විට අල්ලාහ් දෙවිඳු ඒ උදෙසා කුමණ අන්දමේ ඵලවිපාක ලබා දෙනවාද, එසේ විමසන කළ රෝගියා ලබන සිත්සතුට සහ එසේ විමසීමෙන් කෙතෙක් දුරට රෝගියාගේ හදමනස පිනවන්නේද, සන්සුනක් ලබන්නේද යන්න තවත් තැනක මුහම්මද් නබි තුමා මෙසේ විස්තර කර ඇත. 'ඔබගෙන් කෙනෙකු රෝගාතුරවී සිටින ඔබගේ සහෝදරයෙකුගේ දුක් සැප විමසන්නට යන්නේ නම් කරුණාබර අල්ලාහ් තම ශ්‍රද්ධා වන්ත අතවැසියන් වන සුරදූතයන් ගෙන් කෙනෙකු අමතා 'ඔබගේ සිත කොපමණ සුවඳවත්ද, ඔබ ඇදිවින මාර්ගයද සුවඳවත් වී ඇත, තවද සවර්ගයෙන් අගනා නිවහනක්ද ඔබ සතු කර ගන්නේය. (තිර්මිදි සහ තබරානි)

රෝගියෙකු බැහැදැක ගැනීමේ උදාරකම ගැන තවත් අවස් ථාවක නබි තුමා පවසන කළ ලෙඩෙකුගේ දුක්සැප විමස න්නට යන්නේ කවරෙක්ද ඔහු ඒ ගමණ යන කළ ඔහු කරු ණාන්විත අල්ලාහ්ගේ අනුග්‍රහයෙහි පසු වන්නේය, ඔහු රෝගියා අසල වාඩිවූයේ නම් හෙතෙම අල්ලාහ්ගේ දයාවෙහි සම්පූර්ණයෙන්ම ගිලී පසුවෙයි' යනුවෙන් පැවසූහ. (අහ්මද්)

එසේම පරමාන්ථ දිනයේ අල්ලාහ් දෙවිඳු සහ ඔහුගේ අත වැසියෙකු අතර විය හැකි ගැඹුරු මනෝහාරි සංවා ධයක් ගැනවූ දර්ශනයක් ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ අපට විස්තර කළහ. එතුමා පවසන කළ 'පරමාන්ථ දිනයේ අල්ලාහ් දෙවිඳු තම අතවැසියෙකු අමතා 'මිනිස, මා රෝග තුරුව පසුවන විට ඔබ මා බැහැදැක ගන්න නොපැමිණියේ මන්ද? යනුවෙන් විම සනු ලබනු ඇත. එයට අතවැසියා විශ්මයට පත්වෙමින් 'මගේ දෙවියනි, මෙම මුළු විශ්වය නිර්

මාණය කර එය තම අනසක යටතෙහි තබාගෙන පාලනය කරමින් පසුවන්නේ ඔබයි. ඔබ බලමහිමයි, එසේ වෙද්දී ඔබ කෙසේ රෝගාතුර වන්නද?' යි විමසනු ඇත. එසේ ඔබ රෝගාතුර වූවද අනවැසියා වන මා කෙසේ ඔබ බැහැදැක ගන්නද දුක්සැප විමසන්නද යනුවෙන් විමසනු ඇත. එවිට අල්ලාහ් යමෙකුගේ නමක් සඳහන් කර ඔබ අසවලා දනීද? ඔබ මිහිපිට සිටිද්දී අසවලා රෝගාතුරව පසුවන කළ ඔබ මහු බැහැදැක, ගන්න මහුගේ දුක්සැප විමසන්න නොගියා නොවේද? ඔබ එදා මහුගේ දුක්සැප විමසන්නට ගියේ නම් මහු වෙතින් ඔබ මා ලබා ගනු ඇත' යනුවෙන් පවසනු ලබනු ඇත. එයට පසු 'එම්බල මිනිස, මා ඔබ අභියස පැමිණ මට ආහාර සපයන ලෙස බැගැපත්ව ඉල්ලා සිටියා නොවේද? නමුත් ඔබ මට ආහාර පිදුවේ නැත' යනුවෙන් විමසනු ඇත. එයට මහු 'දෙවඳුනි, මේ විශ්මිත විශ්වය නිර්මාණය කර ඔබ අනසක යටතේ එය පාලනය කරමින් එහි අයට පෝෂණය කරමින් පසුවන කළ කිසි උවමනාවකින් තොරවූ අති බලමහිමයා ඔබ නොවේද? එසේ වෙද්දී ඔබට කුසගිනි ඇති වන්නේ කෙසේද? ඔබ පවසන අයුරු ඔබට කුසගින්නක් ඇති වූවද මේ බෙල හීන වහලා ඔබට ආහාර සැපයීම පිණිස ඔබ වෙත පැමිණෙන්නේ කෙසෙද?' යනුවෙන් විමසනු ඇත. එයට අල්ලාහ් මහු අමතා අනවැසියෙකුගේ නමක් ආමන්ත්‍රණය කර ඔබ මිහිපිට වසන කළ අසවලාට කුසගින්න ඇති වූ විට ඔබ වෙත පැමිණ තමාට ආහාර සපයන ලෙස ඔබගෙන් ඉල්ලා සිටියේ නැත්ද? එසේ මහු ඔබ වෙත පැමිණ ආහාර සපයන ලෙස ඉල්ලා සිටියද, ඔබ මහුට ආහාර සැපයීමෙන් වැළකී සිටියෙහිය. එදා ඔබ මහුට ආහාර සැපයුවේ නම් ඔබ එහිදී මා ලබාගනු ඇත යනුවෙන් අල්ලාහ් පවසනු ඇත. ඉනික්බිති 'මිනිස, මා පිපාසයට පත්වූ අවස්ථාවක පානය කරනු වස් පානීය ජලය ඉල්ලා මම

ඔබ වෙත පැමිණයෙමි. නමුදු ඔබ මට දිය සපයා මා සතුටු කලේ නැත. එයට අතාවැසියා 'මගේ දෙවියනි, ඔබ කිසිදු උවම නාවක් නැති විශ්වයේ අධිපතියා වෙද්දී ඔබට පිපාසයද' යි විශ්මතව විමසනු ඇත. එයට අල්ලාහ් දෙවිඳු යම් අතාවැසි යෙකුගේ නමක් සිහිකර අසවලාට පිපාසය ඇතිවී ඔබ වෙත පැමිණ පානය කිරීම පිණිස බැගෑපත්ව යමක් ඉල්ලා සිටී කළ ඔබ ඔහුට කිසිදු පාණයක්දුන්නේ නැත. ඔබ ඔහුගේ පිපාසය සන්සිඳුවෙ නම් ඔබ ඔහු මගින් මා ලබා ගනු තියනයි යනුවෙන් මුහම්මද් තුමා දෙසූහ. (මුස්ලිම්)

තවත් අවස්ථාවකදී තවත් තැනක මුහම්මද් නබි තුමා පව සන කළ 'කෙනෙකු මහමග ඇවිදගෙන යන කළ ඒමග අනුන් හට බාධාවක් වන විලසින් වූ කටු පඳුරක් දිටී ඔහු එය ඉවත් කළ බැවින් එයට ප්‍රතිවිපාක ලබා දෙනුවස් අල්ලාහ් ඔහුගේ පව් සෂමා කළේය' යනුවෙන් බිනූහ (බුහාරි සහ මුස්ලිම්). තවත් කියමනක, යමෙකු මහමග ඇවිදගෙන යන විට අනුන්ට බාධාවන අයුරු මහමග ගසක අත්තක් තිබෙණු දැක සැබැවින්ම එය මෙසේම තිබෙන්නට හැරියේ නම් එය මේ මගේ ගමන් කරන තවත් සහෝදරයෙකුට හිංසාවක් වන්නට හැකිය යනුවෙන් සිතා එය එතැනින් ඉවත් කළේය. එසේ කළ ඒ පින්දහම නිසා අල්ලාහ් ඔහු ස්වර්ගයට පිවසෙන්නට සැළැසූවේය යනුවෙන් පැවසූ බවද සඳහන් වේ. (මුස්ලිම්)

මුහම්මද නබි (සල්) තුමා දෙසූ බව එතුමාගේ කලණ සුහ දයෙකු වන අබූදර් අල් කිෆාරි තුමා මෙසේ විස්තර කරයි. 'මගේ සමාජයේ වැසියන් මිහිපිට කරන දැමිටු සහ අදැමිටු සියළු කර්මයන් මට පෙන්වනු ලබනු ඇත. එසේ පෙන්වන ලද ක්‍රියාවන්හී මිනිසා අනුන්ට හිරිහැර බාධා වන අයුරු

මහමග ඇති ද්‍රව්‍යයන් ඉවත් කරන කටයුත්තද තිබෙනු මම දුටුවෙමි' යනුවෙන්ද දෙසූහ.

ඉහත අප සඳහන් කළ මුහම්මද් තුමාගේ සුන්නා සංකල්පය තුලින් අර්ථව්‍යාඛ්‍යානය වන්නේ ඉස්ලාම් දහම සියළු මාදිලියේ සත්ක්‍රියාවන් සහ ප්‍රශංසණීය ක්‍රියාපරිපාටීන් කිසිදු විපරීතයකින් තොරව විනීත අන්දමින් ක්‍රියාවෙහි යොදන්නට අණපනවමින් පසුවන බවය. මිනිසා සමහරවිට මහු කරමින් හුන් අදැමිටු ක්‍රියාවන් නිසා නිරයේ ගින්නට ඇතුල් වන්නට නියම වී තිබු ණද ඒ කුදුමහත් විනීත කටයුතු සහ දැමිටු ක්‍රියාවන් උදාසීන නොකර එයට නතුව කටයුතු කළ නිසා මහුගේ පව් සමාවී ස්වර්ගය සාක්ෂාත් කරගන්නට හැකි අවස්ථාවද බහුලය. එහෙයින් මිනිසා මිහිපිට ජීවත්වන විට මහු කළයුතු සමාජ යුතුකම් සහ මහු විසින් ඉටුවිය යුතු ආරක්ෂා විය යුතු අයිතිවාසිකම්ද අපමණ බව ඉස්ලාම් විටින්විට පවසමින් සිටී. අප ඉහත සඳහන් කටයුතුවලට ඉස්ලාමීය සංකල්පය තුලින් වන්දනාමානය සහ දන්දීම යනුවෙන් විවිධ අන්දමින් නාමධාරි කළද ඒවා සියල්ල අල්ලාහ් දෙවිඳු ප්‍රියශීලී වන වන්දනාමානයන් බව සක්සුදක්සේ පැහැදිලිය.

මුහම්මද් නබි තුමාගේ ආප්ත සුහදයෙකු වන අබූදර් අල් කිෆාරි තුමා මෙසේ විස්තර කරයි. 'මම වරෙක මුහම්මද් තුමාගේ අභියසට ගොස් 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, අත වැසියෙකු ගොරතර නිරයේ ගින්නෙන් එතෙර කරන දැමිටු ක්‍රියාවන් කුමක්ද' යි විමසුවෙමි. එයට එතුමා පරිසමාප්ත අන්දමින්ම අල්ලාහ් දෙවිඳු විශ්වාස කිරීම වේ යනුවෙන් පිළිවදන් දුන්හ. අල්ලාහ් දෙවිඳු සම්පූර්ණයෙන්ම විශ්වාස කළ පසුද අප දැමිටු ක්‍රියාවන්හී නිරත විය යුතුද?

අල්ලාහ් දයාන්විත අල්ලාහ් දෙවිඳු ඔබට දුන් දැයෙන් සමහරක් දන් දෙන මැනවි. තම සහෝදරයින්ට හෝ උවමනා

අයට දන්දිය හැකි තරම් වත්කමක් නොවන්නට? එසේ දන්දීමට යමක් නොවන්නේ නම් සුදන ක්‍රියාවන් කෙරෙහි අමතා ඔහු දුදනෙන් ඉවත්වන අයුරු මවදන් දිය යුතුය.

මනා දැනුමක් නැති හෙයින් එසේ සුදන ක්‍රියාව ගැන අනුශාසනා කර දුදන ක්‍රියාවෙන් වළක්වන්නට තරම් අවස්ථාවක් නොහැකි නම් ඔහු කුමක් කළ යුතුද? රැකියාවක් කරන්නටය දැනුමක් නැති කෙනෙකුට දැනුමක් ලබා දිය යුතුය. අල්ලාහ්ගේ වක්තෘ තුමනි එසේ රැකියාවක් ඉගැන් වීමට තරම් දැනුමක් ඔහුට නොවේ නම්? අයුක්තියට පත් වූ කෙනෙකුට යුක්තිය ලැබෙනු වස් පරිසමාප්තව කටයුතු කළ යුතුය. අල්ලාහ්ගේ වක්තෘ තුමනි, අයුක්තිය විරුද්ධව නැගී සිට යුක්තිය සංස්ථාපනය කිරීමට හැකි තරම් ජවයක් නිතර දුබලයෙක් නම්? එවිට මාදෙස තියුණු බැල්මක් හෙලූ වක්තෘ තුමා ඔහු තම සහෝදරයාට යමක් කළ හැකි යතුවෙන් ඔබ සිතන්නේම නැත්ද? යි විමසන්නට වූහ.

එසේ යමක් කරන්නට බැරිනම් අඩුම වශයෙන් තම සහෝ දරයාට දුක්කරදර දීමෙන් හෝ වැළකී සිටිය යුතුය. එය ඇසූ මම අල්ලාහ් වක්තෘ, තුමනි එය පමණක් ඔහු කළා නම් ඔහු ස්වර්ගයට ඇතුල් වනවාද? යි මම විමසුවෙමි.

එයට මුහම්මද් නබි (සල්) තුමා මා පෙර සඳහන් කළ කුමන කාර්යයක නිරත වූවද ඔහු ස්වර්ගයට ඇතුල් වන තුරු මම ඔහුගේ අත අල්ලාගෙන ඔහු ස්වර්ගයට යන තුරු මාද ඔහු සමග යමි. (බෛහකී)

පෙර සඳහන් හදීසය තුලින්, අවස්ථාවෝචිතව කිරීමට අනු ශාසනා කර ඇති අයුරු සෑම මුස්ලිම්වරයෙකුම තම ජීවිතය කාලය තුල හැකි අයුරින් කටයුතු කළ යුතුය. මන්දයත් මිනිස් සමාජයේ සෘධිමතුන් අතරින් අග තැන් හොබවන වක්තෘ මුහම්මද් තුමාගේ ඒ මුදුවදනින් සමන්විත හස්ත

කෘත ඉගැන්වීම්වලින් සාක්ෂාත් වන්නේ කුදුමහත් ජනතා වම එවන් දැමිටු කටයුත්තන් හට තම සම්පූර්ණ අවධානය යොමු කළ බවයි. එවන් විශාල ආනිසංසනයක් ගෙන දෙන ක්‍රියාවන් කිරීම සීමිත කාලයකට හෝ සීමිත අවස්ථාවකට හෝ සීමිත පුද්ගලයන් පමණක් හෝ සීමා කළ නොහැකි අන්ද මින් සීමාරහිතව ඉටුකිරීමේ පදනමක් මත ක්‍රියා විය යුතුය. එසේම ධනපතීන් පමණක් හෝ ගාම්භීර ජවසම්පන්න ශක්තිමත් අය පමණක් හෝ ප්‍රඥාංගුරයන් පමණක් හෝ නොවන්නට තවත් විශේෂ හැදියාවන් හැකියාවන් ලැබූ දනන් පමණක් හෝ මෙසේ ක්‍රියාකර කළ යුතුය යන සීමාසහිත සිතුවිල්ලෙන් වැළකී ධනවතුන්, ධනහීනයන්, ශක්තිමත් සහ දුර්වල අය, ප්‍රඥයන් සහ මුග්ධ යන විපරීතයෙන් තොර කුදුමහත් සියළු දනන් අවස්ථාවොචිතව කටයුතු කිරීමේ ලිහිල් දර්ශකය මත ඒ වගකීම් බැඳී ඇත.

මුහම්මද් තුමා හා සම්බන්ධ වූ ඉහත සඳහන් ඔවදන මිනිසා ඒ අනුව පමණක් කටයුතු කර ඉවත්වීම සෑහේ යනු වෙන් ඉස්ලාම් දහම අර්ථකථනය කළා යැයි කිව නොහැකි අතර ඒහා සමාන අනෙක් දැමිටු ක්‍රියාවන්ද මොනවදැයි තෝරාබේරා ගෙන කටයුතු කළ යුතු බවද දැනුම් දෙයි. එසේ යමෙකු දැමිටු ක්‍රියාවන් ඝතුටෙන් ඉටුකරන කළ එය මහුගේ දේහයේ එක්එක් අවයවයන්හී හන්දිස්ථාන වෙනු වෙන් කරන දනක්පිනක් ලෙස අර්ථ කථනය වන්නේය. ඒ අදහස සහසුද්දෙන්ම පැහැදිලි වන අයුරු මුහම්මද් නබි තුමාගේ කියමනක් අබූහුරෛරා තුමා මෙසේ දැනුම් දෙයි. 'මිනිස් අවයව පද්ධතියේ එක් එක් හන්දිස්ථාන වෙනුවෙන් කළ යුතු පින්දහම් වේ, සෑමදා ඉර උදා වෙයි. දෙදෙනෙකු අතර යුක්තිගරුකව කටයුතු කිරීමද විශාල පින් දහමකි, කෙනෙකුගේ වාහනයට නැගීමට මහුට උදව් කිරීමද පිනකි.

ඔහු ගමන් කරන ඒ වාහනයේ ඔහුගේ ගමන් මල්ල තැබීමට උදව්කිරීම හෝ එය බැස්සීමට උදව්වීමද පිනකි. දේව නැමදුම පිණිස පිටත් වන්නට ඔහු තබණ එක්එක් පියවර ද පිනකි. මඟීන්ට බාධාවන අයුරු මහමග ඇති යමක් එතැනින් ඉවත් කිරීමද පිනකි'. (බුහාරි සහ මුස්ලිම්)

තවත් අවස්ථාවක මුහම්මද් නබි තුමා දෙසූ බව ඉබ්නු අබ්බාස් තුමා මෙසේ විස්තර කරයි : සැම්දින මිනිසා මයිසම් හෙවත් තම ශරීරයේ එකඑක් අවයව පද්ධතිය වෙනුවෙන් (එහි ක්‍රමික ක්‍රියාකාරීත්වය උදෙසා) වන්දනාමන කරගත යුතුය යනුවෙන් මුහම්මද් තුමා දෙසූ කළ එතුමා පවසන්නේ දෛනික දේවනැමදුම යැයි වටහා ගත් එතුමාගේ සුහදයෙකු' 'වක්තෘ තුමනි, ඔබ තුමා මේ දක්වා පවසන ලද දේවලින් මෙය ඉතා දුෂ්කර ක්‍රියාවක් නොවේදයි විමසූ කළ 'ඔබ ඔබ සහෝදරයාට හොඳ දේ ගැන අනුශාසනා කර ඔහු නපුරෙන් වළක් වාලීමට වෙර දැරීමද නැමදුමක් හා සමාන වන්නේය. තම ගමන්මල්ල හෝ ද්‍රව්‍යයන් උසුලා ගෙන යන්න තතනන කෙනෙකුගේ මල්ල උසුලා ගෙන යැමට අතදීමද නැමදුමකි. මඟීන්ට බාධාවන අයුරු මහමග ඇති යමක් එතැනින් ඉවත් කිරීමද නැමදුමකි දෛනික නැමදුම පිණිස පිටත් වන්නට ඔබ තබණ එක්එක් පියවරද නැමදුමකි' යනුවෙන් එතුමා පිළිවදන් දුන්හ. (අහ්මද් සහ ඉබ්නු හුසෛමා)

මුහම්මද් තුමා හා සම්බන්ධ තවත් සම්භවයක් බුරයිදා තුමා මෙසේ විස්ත කරයි : 'මිනිස් ශරීරයේ සන්ධිස්ථාන තුන්සිය හැටකි. එක්එක් සන්ධිස්ථාන වෙනුවෙන් පිනක් කිරීම ඔහුගේ පරම යුතුකමකි යනුවෙන් දෙසූ කළ, වක්තෘ තුමනි, එසේ යුතුකමක් අප කිසිවෙකුට කිරීමට නොහැකි නොවේද යි එතුමගේ කලණ මිතුරෙකු විමසන්නට විය. එවිට මුහම්මද් තුමා ඔහු දෙස බලා ඔබ දේවස්ථානයේ (හෝ

තැනක පසුවන) කළ ඔබට සෙම කෙළතම්බක් පිට කරන්නට උවමනා වී නම් කෙළ ගසා ඒ මත වැලි ටිකක් දමා වසා දැමීමද දනකි. මගීන්ට හිංසාබාධා වන අයුරු මහමග ඇති යමක් එතැනින් ඉවත් කිරීමද දනකි යනුවෙන් පවසූහ. (අහ්මද්, අබූදාවුද්, ඉබ්නු හුසෙමා සහ ඉබ්නු හිබ්බාන්)

එසේම තම සහෝදරයෙකු මුණ ගැසෙන මොහොතක් මොහොතක් පාසාම මදහස මුහුණෙන් ඔහුට මුහුණ දීම සහ පිළිගනීම, ශ්‍රවණය මන්ද කෙනෙකු අසා වටහා ගන්නට තරම් ශබ්ද නගා තමා පවසන්නට බලාපොරොත්තු වන දේ කීමද මංමුලාවී මග සොයා ගන්නට තතනන අන්ධයෙකුට මග පෙන්වීම, තමාගේ කටයුත් තත් ඉටුකර ගැනීමට උවමනා කෙනෙකුට එය ඉටුකර ගැනීම පිණිස උදව් වීම වැනි අනේකවිධ එදිනෙදා කටයුතු කීපයක්ද විස්තර කර ඒවා සියල්ල පින්දහමත් ලෙස මුහම්මද් නබි තුමා දෙසූහ.

යමෙකු මෙසේ තම දෛනික ජීවිතය තුල පෙර සඳහන් යහකම් හරියාකාරව පරිසමාප්ත අන්දමින් ඉටු කරන කළ හෙතෙම අල්ලාහ්ගේ අනුග්‍රහයට සහ ඔහුගේ නොමද තෘප්ති යට පත් වන්නේය. තවද එවැනි යහකම් සහ කටයුත්තත් ඔහු පමණක් අවස්ථවෝචිත අන් අයට පහදා දීමෙන්ද ඒවා කරන ලෙස අවංකව දිරිගැන්වීමෙන්ද හෙතෙම සමාජයට ප්‍රයෝජනවත් කෙනෙකු ලෙසද වන්නේය. මෙසේ අවංකව කටයුතු කරන්නා මුහම්මද් තුමා විස්තර කළ අන්දමට යහකමෙහි සහ දැමිටු කමෙහි ප්‍රමුඛයා ලෙසද දුදන ක්‍රියාවන් වළක්වන සමාජයේ සාමධර්මය නගා සිටුවන සැමට පිහිට වන ප්‍රදීපස්කම්භයක් ලෙසද වන්නේය.

මුස්ලිම්වරයෙකු මෙසේ ඉටු කරන යහකම් සහ දමිටුක මෙන් ලැබෙන පින්දහම මිනිසා නම් වක්‍ර වූ කෙටි සීමාවක් තුලට පමණක් සීමා නොකර එයින් එපිට මිහිපිට වසන

සත්ත්වයන් සහ පක්ෂීන් මෙන්ම අනෙකුත් මැවීම් කෙරෙහිද පරිසමාප්ත උධාර ලෙස ඉටුකිරීමට හැකි අයුරෙන් උත්සුක විය යුතුය. එහෙයින් සත්ත්වයින් සහ පක්ෂීන් කෙරෙහිද කරුණා සහගතව කටයුතු කරන අතර අනෙකුත් මැවීම් වලට හිමි යුතුකම් මුළුමනින්ම ඉටු කිරීම, ඒවාට යම් කරදරයක් වින්නැහියක් උවදුරක් ඇති වීමෙන් වළක්වා ඒවායේ අයිතිවාසිකම් පරිසමාප්ත අන්දමින්ම ඉටු කිරීමට වෙර දැරීමද අල්ලාහ් දෙවිඳුගේ අනුග්‍රහය සහ තෘප්තිය ලැබිය හැකි උසස් ගුණයේ වනදනාමානයන් වේ.

වරෙක මුහම්මද් නබි තුමා තම සහෘදයන් හා පිළිසඳරෙ හි යෙදී සිටින කළ මතු සඳහන් සම්භවය පැවසූහ. 'දවසක්දා සුනඛයෙකු පිපාසය සංසිඳුවා ගන්නට පානීය ජල ස්වල්පයක් නොලැබීමෙන් තම නගුට ලෙලවමින් තෙත පස ලෙව කමින් උන්නේය. ඒ සුනඛයාගේ අවසනාවන්ත අවස්ථාව දැක අනුකම්පාවට පත්ව අවංකව එයට උදව් විය යුතු යැයි සිතූ කෙනෙකු ඒ සුනඛයා තමා සමග ළිඳක් අසලට කැටුව ගියේය. ළිඳ තුල ජලය වූවද එයින් ජලය ගන්නට බාල්දියක් වැනි භාජනයක් නොමැති හෙයින් දසතේ කල්පනා කරන්නට විය. අවසානයේ නුවණක් පහළ වීමෙන් ළිඳ තුලට බැස තමා පැළඳ සිටි පාවැස්ම ගලවා එයට ජලය පුරවාගෙන ගොඩට ඇවිත් සුනඛයාගේ පිපාසය සන්සිඳු විය. තමා පැළඳ සිටි පාවහන මගින් ප්‍රමාණවත් ජලය ලබා ගැනීමට නොහැකි නිසා ඒසේ කීපවිටක්ම ළිඳ තුලට බැස ආපසු පිටට පැමිණ සුනඛයාගේ පිපාසය සන්සිඳුවන්නට තරම් ඔහු කාරුණිකවිය. ඒ අග්‍ර ගුණයේ යහකම නිසා අල්ලාහ් ඔහුගේ සියළු පව් සමා කළේය. ඒ සම්භවයට විමතියෙන් ඇහුම්කන් දීගෙන සිටි සමහරෙක් අල්ලාහ්ගේ 'වක්තෘ තුමනි, සතුන්ට උවටැන් කිරීමෙන්ද එතරම් විශාල පිනක්

වේද?' යනුවෙන් විමසූ කළ 'ඇත්තෙන්ම ඔව්. අවංක අදහසින් සතුන් හට ඒවාගේ යුතුකම් ඉටු කරන විට එහි විශාල පිනක් ලැබේ' යනුවෙන් පිළිවදන් දුන්හ. (බුහාරි)

පෙර සඳහන් මුහම්මද් තුමාගේ අමිල මුදුවදන් තුළින් සහසුද්දෙන්ම සාක්ෂාත් වන්නේ සතුන්ට ඔවුන්ට අයත් උව මනාවන් ඉටුකරන කළ එයට විශාල පිනක් ඇති බවය. ඉස්ලාම් දහම මෙසේ අනපනවන හෙයින් දැමිටුකම්හී නියැළීමට සැලකිලිමත් වන පින්වතුන් සහ වැඩි වැඩියෙන් පිනක් බලාපොරොත්තු වන අයද ඒ වෙනුවෙන් යම්යම් වන්දනාමානයන් පිණිස හුදෙක් දේවස්ථානය තුලට පමණක් සමාධි ගතවී තමා වෙනුවෙන් පමණක් කරන පින්දහමන් එක්තරා සීමාවක් තුලට සීමා නොකර සමාජයට පරිසරයේ අනෙකුත් සත්ත්වයින් සහ ජීවීන් හටද යුතුකම් සහ වගකීම ඉටුකිරීම තුලින්ද තවතවත් පින්දහම් සාක්ෂාත් කරගැනීමට වග බලා ගත යුතුය.

දෛනික කටයුතු පිණිස සමහර කොන්දේසි

මිනිසා බිරිඳ දෙමාපියන් ළමාළපටින් ඇතුල කුඩම්ප දිවියේ රාමුව තුල නෑදෑහිතමිතුරන් සහ අනෙකුත් අය නියෝජනය වන සමාජය තුලද ජීවත් වන්නේය. තමා විසින් දයාන්විත දෙවිඳුට කළයුතු යුතුකම් සම්භාරය මෙන්ම තමා විසින් තම පවුලේ අය සහ සමාජය වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් රාශියක්ද ඔහු වෙත පැවරී ඇත යන්න පැහැදිලිය. ඒ යුතුකම් හුදෙක් තම පවුලේ සාමාජිකයන්ගේ උවමනාවන් ඉටුකරනු වස් වුවද එයට උවමනා ආම්පන්න සපුරා ගනු අරභයා කරන කෙරුම් සහ කියන කියුම් වැනි සියල්ල අල්ලාහ් අභියස පින්දහමන් ලෙස ගණනය වන බව මුහම්මද් නබි තුමා දෙසූහ. එහෙයින් කමතේ සේවයෙහි නියුක්ත ගොවියා හෝ සේවාස්ථානයන්හී සේවය

කරන සේවකයන් හෝ කාර්යාලයක හෝ වෙනත් තැනක උසස් තනතුරක් දරන්නෙක් හෝ ආත්ම පරිශුද්ධතාව යෙන් එක්තරා ක්‍රමවේදයක් අනුව කටයුතු කළ යුතුව ඇත. එසේ හෙතෙම ඒ නීතිරීතිවලට අනුගතව කටයුතු කරන්නේ නම් ඔහු විසින් අල්ලාහ් උදෙසා කරන ඒවා නැමදුමක් ඇදහිල්ලක් සහ අල්ලාහ්ගේ මාර්ගයේ ජීවිත පරිත්‍යාගයෙන් කරන ජිහාද් වැනි අති උසස් තත්ත්වයට පත්වන බව ඉස්ලාම් දහම ස්ථිරසාරව පවසා සිටී. ඒ කොන්දේසි සහ නීතිමාලාවන් මතු සඳහන් ආකාරය වේ.

තමා නිරතවන වෘත්තිය හෝ රැකියාව ඉස්ලාම් දහම විසින් අනුමත කළ එකක් විය යුතු අතර එහි නීතිරීතිද ඉස්ලාමීය නීතික්ෂේත්‍රයට අන්තර්ගතව තිබිය යුතුය. පොලීකරණය සහ නැටුම් කලාව වැනි ඉස්ලාම් දහම තරයේඅනුමත නොකළ වෘතියෙහි යෙදී මුදල් උපයන්නන් තම පවුලේ අය පෝෂණය කරනු වස් අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් කරන වන්දනා මානයට අනුගතව කරන කටයුත්තන් ලෙස ගිණිය නොහැකිය. අල්ලාහ් දෙවිඳු යහපත්ය. යහපත් දේ හැරෙන්නට අන් කිසිවක් අනුමත නොකරන්නේය.

අල්ලාහ්ගේ අණපනත්වලට අනුගතවූ තමාගේ වෘතියේ නියැළී සිටින කළ තමා සහ තම පවුලේ අය නිසිරිසියෙන් නටත්තු කළ යුතුය යනුවෙන්ද සමාජයට යහකම් කර අල්ලාහ්ගේ නීතිරීතිවලට අනුගතව මහපොළොවෙහි පාලනය කටයුතු කර ජීවත්විය යුතු යන අවංක චේතනාව සක්ෂාත් කරගත යුතුය. තමා කරන වෘත්තිය කුමණ එකක් වුවද එහි සේවය සහ කටයුතු මනත්යෙන් තොරව අවංකව ඉටු කළ යුතුය. තම සේවය අවංකව ඉටුකිරීම ගැන මවදන් දෙන කළ මුහම්මද් තුමා මෙසේ දෙසූහ : 'තමා කරන සේවය මනා අන්දමින් නිහතමානීව කළ යුතු බව අල්ලාහ් දෙවිඳු අණ පනවා

ඇත යනුවෙන් මුහම්මද් නබි (සල්) තුමා දෙසූහ. (මුස්ලිම්) තවත් අවස්ථාවක මුහම්මද් තුමා මෙසේද සඳහන් කළහ : 'යමෙකු කරන ක්‍රියාවන් අවංකව සහ සම්පූර්ණව කළ යුතුය යනුවෙන් අල්ලාහ් බලාපොරොත්තු වේ'. (බෛහකි)

තමා කරන වෘත්තිය අල්ලාහ් දෙවිඳුගේ අනපනත් සහ ආඥාවන් උල්ලංඝණය නොකර කිරීමට වග බලාගත යුතුය. තම සහෝදයන්ට අයුක්ති කිරීමෙන් වැළකී අනුන්ගේ සේසත් සහ අයිතිවාසිකම් නිෂ්ප්‍රභා නොකරන චේතනාවෙන් කටයුතු කළ යුතුය. තමා කරන වෘත්ති රැකියා හෝ අන් ඕනෑම කටයුත් තක් වුවද තම ලෝකෝත්තර ජීවිතය වෙනුවෙන් පින්දහම් කිරීමෙන් නොවැළැක්විය යුතුය. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි : *විශ්වාස වනතායිනි, ඔබගේ වටිනා වස්තූද, ඔබගේ ප්‍රියශීලී දරුවෝද, අල්ලාහ් සිහිකිරීමෙන් ඔබ (අවධානය) නොවළක් වත්වා. එසේ කරන්නේ කවරෙක්ද හානියට පත් වූවන් ඔවුන්මය.* (63 : 9)

එසේම තම ජීවිතයේ එදිනෙදා උවමනාවන් ඉටුකිරීමේ දීද සමාජ කටයුතුවලදී තිරන වන කලද ඒවායෙන් කාර්ය බහුලත්වයක්, උද්වේගයක් උවදුරක් ඇති වුවද ශ්‍රද්ධාන්ත යින් තමා විසින් අවංකව අල්ලාහ් කළ යුතු යුතුකම් කිසිසේත් පැහැර නොහරින බව අල්කුර්ආනයම මෙසේ සාක්ෂි දරයි: *(එසේ අල්ලාහ් ධ්‍යානය කරන) මිනිස්සුන් අල්ලාහ් මෙනෙහි කිරීමෙන්ද සලාත්හි නිරතවීමෙන්ද සකාත් (නම් දන්) දීමෙන්ද ඔවුන්ගේ වෙළඳාම්ද, ගනුදෙනුද අතපසු කරන්නේ නැත. හදමතසද බැල්මන්ද බියෙන් අවුල්වන ඒ (පරමාන්ත) දිනයට ඔවුන් බිය වෙති.* (24 : 37)

යමෙකු පෙර සඳහන් ආකාරයට ඒ නීතිරීති ආරක්ෂා කර එයට අනුගතව තම රැකිරක්ෂා කටයුතු වැනි පෞද්ගලික

කටයුත්තන්හී නිරත වන කළද, ඒ රැකියාව වැනි බාහිර කටයුතු තම දෛනික උවමනාවන් සහ යුතුකම් ඉටු කර ගැනීමට ඉවහල් වීමේ දීද හෙතෙම තම ඒ කටයුතු තුළින් ඉතසිතින්, ආත්ම පරිශුද්ධයෙන් අල්ලාහ් වන්දනාමාන කළ අයෙකු ලෙසද වන්නේය. ඉස්ලාම් දහමට අනුගතව තමා කරන ඕනැමයෙක් හෝ කාර්යයක් වුවද ඒවා අවංකව අල්ලාහ් වෙනුවෙන් කරනා බව තිර අධිෂ්ඨානයකින් කරන කළ ඒවා උසස් වන්දනාමානයෙහි ලා සැළකේ.

වරෙක සිදුවූ එක්තරා සම්භවයක් ගැන මුහම්මද් නබි තුමාගේ සහාදයෙකු වන කඅබ් බින් උජ්රා තුමා මෙසේ විස්තර කරයි : 'වරෙක මුහම්මද් තුමා තම කලණ මිතුරන් සමග පිළිසඳරෙහි යෙදී සිටියහ. එවිට ඔවුන් වාඩිවී සිටින ස්ථානය හරහා කෙනෙකු ගමන් කරමින් සිටියේය. ඔහු ගේ ගමනෙහි කඩිසර ගාම්භීර ගතියක්ද ශක්තිසම්පන්න ගතියක්ද පෙනෙන්නට විය. ඔහු දෙස උනන්දුවෙන් අවධානය කළ වක්තෘ තුමාගේ කලණ මිතුරෙකු 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, මොහු අල්ලාහ්ගේ වදන් සහ දහම මිහිපිට සංස්ථාපනය කරනු වස් අල්ලාහ්ගේ මාවතෙහි ජිහාද්ට සහභාගි වූවා නම් කොපමණ හොඳද? යි විමසන්නට විය. තම කලණ මිතුරාගේ වදනට සවන් දුන් මුහම්මද් තුමා 'ඔහු තම ළදරුවන්ට ආහාර සොයා ගියද ඔහු අල්ලාහ්ගේ මාවතෙහි යමින් සිටින්නේය. ඔහු තම වයෝවෘධ දෙමාපියන්ට ආහාර සොයා ගියද අල්ලාහ්ගේ මාවතෙහි යමින් සිටින්නේය. ඔහු තම කුසගින්න නිවා ගනු වස් ආහාර සොයන්නට පිටත්වෙමින් සිටියද ඔහු අල්ලාහ්ගේ මාවතෙහි යමින් සිටියි. නොවන්නට ඔහුගේ කඩිසර ගමන සහ අනෙකුත් තේජසයන් දකින අය ප්‍රශංසාමුඛව කතා කරන්නට හෝ පසසන අටියෙන් හෝ මුනිච්ජාව පිණිස නම් හෝ උඩඟු උද්දාමය

හෝ උද්ධච්ච පිණිස නම් මහුගේ ෂයිතාන්ගේ මාවතෙහි පියමනිමින් සිටින්නේය' යනුවෙන් පැවසූහ. (තබරානි)

එසේම අපගේ පවුලේ සහ නෑදෑහිතමිතුරන්ගේ මිනෑඑපා කම් පිරිමසා ගන්නා අටියෙන් මිහිපිට සැරිසර ඒ වෙනුවෙන් පරිශ්‍රම වීම ගැන සහ එහි ඇති වැදගත්කම ගැන අල්ලාහ් දෙවිඳුගේ වදන අනුව 'අල්ලාහ්ගේ අනුග්‍රහයන් සහ වරප්‍රසාද සොයා යැම්' යනුවෙන් නියෝජනය වෙයි. ඒ ගැන පරි ශුද්ධ වූ අල්කර්ආනය මෙසේ විස්තර කරයි : *(සිකුරාදා) සලාතය නිම වූවායින් පසු භූමියෙහි විසිරී ගොස් අල්ලාහ්ගේ වරප්‍රසාදයන් සොයා ගනිව්.* (62 : 10)

දහම් කටයුතු කරන අවස්ථාවේදී හැර, එයින් ඉවත් වූ පසු තම ලෞකික වරප්‍රසාදයන් සහ අනුග්‍රහයන් සොයා ගැනීම වැරැදි නැත, එයට අනුමැතියක් ඇත යනුවෙන් දයාන්විත අල්ලාහ් දෙවිඳුම අල්කුර්ආනයේ සාක්ෂි දරයි. *ඔබගේ දෙවිඳුගේ අනුග්‍රහයන් (එනම් වෙළඳාම් වැනි වලයන්) සොයා ගැනීම ඔබට වරදක් නොවෙයි.* (2 : 198)

තම යුතුකම් ඉටුකිරීම හා තමාට අවශ්‍ය ආහාර සහ අනෙකුත් ආවතේව පිරිමසා ගැනීම පිණිස පරිශ්‍රමයෙහි යෙදෙන්නා, ඒ වෙනුවෙන් නිරතවීම ගැන විස්තර කරන කළ අල්ලහ්ගේ මාවතෙහි යුද්ධය වෙනු වෙන් පිටවී ගිය අය සමග මහුද සම කර පරිශුද්ධ අල්කුර්ආනය විස්තර කරයි. *අල්ලාහ්ගේ අනුග්‍රහය සොයමින් භූමියෙහි සංචාරණය කරන අයද, අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කරන තවත් අයද ඔබ අතුරෙන් වේ (යන්න අල්ලාහ් දනී).* (73 : 20)

අද මිනිසා දිළිඳුකමේ ශිකරයටම පත්ව සිටියද ඒ කුදුමහත් සැම කෙනෙකුටම පාහේ කළ හැකි පහසු රැකියාව සහ වෘත්තිය ගොවිතැනෙහි යෙදීම සහ ගස් පැල රෝපනය කිරීමයි කිව හැකිය. ඉස්ලාම් දහමේ නීති සහ එහි ආවේණික

ප්‍රදීපස්තම්භාවලිය තුලින් එහි වැදගත්මක, වටිනාකම ගැන පවසන්නේ අති උසස් අන්දමිනි. ඒ කරුණ අළලා තම ශ්‍රවකයින් හට මතුලොව උදෙසා වක්තෘ මුහම්මද් තුමා විසින් දෙන ලද්දේ අසහාය මවදනකි. 'මුස්ලිම් වරයෙකු ගසක් රෝපනය කර නොවන්නට ඇටයක් රෝපනය කර එය වැඩී එයින් මිනිසුන් හෝ සතුන් හෝ පක්ෂීන් හෝ අනුභව කරන්නේ නම් එය ඔහුට සදකා නම් පිනක් හැර අන් එකක් නොවන්නේය. (බුහාරි සහ මුස්ලිම්)

ඒ අදහසම තවත් තැනක, සටහන් වන කළ ඇත්ත පවසා විශ්වාස වන්ත අන්දමින් අවංක චේථනාවෙන් වෙළඳාම් කර වෙළෙඳා පරමාත්ථ දිනයේ වක්තෘ වරුන්, විශ්වාසවන්තයින් සහ අල්ලාහ්ගේ මාවතෙහි සටන් කර වීර මරණ සාක්ෂාත් කරගත් අය සමග පදුවන බවද මුහම්මද් නබි (සල්) තුමා පැහැදිළි කළහ.

මෙවන් අගනා ආගමක සිරිත්විරිත් සහ දැමිටු ක්‍රියාවන් ගැන දැනුමක් තම අසහාය දයාදය කර ගත් කෙනෙකු අල්ලාහ් වෙනුවෙන් වන්දනාමාන වැනි දැමිටු කටයුතුවල යෙදෙමින්, අවස්ථාවෝචිතව තමා සතු දනෙන් අනුන්ට උදව් උපකාර නොකරද මවුන්ගේ කටයුතුවලට පිටිවහල් නොවී සිටීම, එසේම තම දන තවතවත් වැඩි කර ගනු වස් යාචක සහ අනුන්ගෙන් ඉල්ලීම වැනි නීච අන්දමින් කටයුතු කිරීමද ඉස්ලාම් දහම තරයේ හෙළා දකින අතර මවුන් අධම අය බව පවසයි. එසේම තමා ඉස්ලාම් දහමේ වත්පිළිවෙත් සහ වන්නාමාන ඉටුකරන බව පවසමින් මතු සදහන් කටයුතු වලින් ඉවත්වන කළ ඔහු නිසිරිසිව ඉස්ලාමීය දහම පිළිපදින කෙනෙකු විය නොහැකිය. මිනිස් සමාජය තුල ඇති විය හැකි සුවහසක් කටයුතු සහ උවමනා ගැන වටහා ගෙන ඒවාට හැකි අයුරින් පිළියම් යොදමින් තම ශක්තිය සහ සේසත

යොදවමින් කටයුතු කිරීම සත්‍ය මුස්ලිම් වරයෙකුගේ ගතියකි. එසේ කටයුතු කිරීම ඔහුටත් සමාජයටත් එකසේ මහ පරිමාණයේ සුගතියක් වන අතර තම යුතු කම් පිරිසිදු චේතනාවෙන් නිහතමානීව නිම කරන විට එය උසස් ඝණයේ වන්දනාමානයක් ලෙසද වන්නේය.

තම ආශාවන් සන්තර්පනය කර ගැනීම

යමෙකු අප පෙර පිටුවල විස්තරාත්කමව පැහැදිලි කළ දැමිටු ක්‍රියාවන් සහ අනෙකුත් අනුමත සමාජ යුතුකම් සහ උවමනා වන් ඉටුකිරීමට පෙරටුවන කළ ඔහුගේ සිත සහ කය උදෙසා ස්වඋවමනාවන් කීපයක්ද සපුරා ගැනීමේ වැදගත් අවස්ථාව කට හෙතෙම පත් වන්නේය. සමාජ කටයුතු සහ අනෙකුත් ක්‍රියාවන්හී යෙදෙන්නට නම් ඔහු තමා ශක්තිමත් කරගත යුතුව ඇත. එනම් තම ශරීර ශක්තිය වර්ධනය කර ගන්නට, පිදුසිදු චේතනාවෙන් සිත සන්සුන්ව සැප විහරණයෙන් කල් ගෙවන්නට, එසේම තම ශරීරය තුල ඇති කාය පද්ධතීන් නිසිරිසියේ ක්‍රියා කරන්නට ඔහුට පිරිසිදු හොඳ අන්නපාන සහ දම්පතී කායික උවමනාවන් සන්තර්පනය කර ගැනීම් වැනි තවත් කොටසක් තමා සතු කර ගත යුතුව ඇත. ඒවාද යතා අන්දමින් දහමේ නීතිරීතිවලට අනුගතව කරන විට ඒවාද උසස් ඝණයේ වන්දනාමාන ඝණයෙහිලා සැළකේ.

යමෙකු තම කායපද්ධති සන්තර්පනය කර ගතු වතු වස් නිත්‍යානුකූල කායික උවමනාවන්හී යෙදීමද උසස් ඝණයේ වන්දනාමානයෙහිලා සැළකේ. එසේ නිත්‍යානුකූලව ශීලාචාර අන්දමින් තම කායික උවමනාවන් සන්තර්පනය කර ගැනී මටද පිනක් ඇත යි ඉස්ලාම් දහම තිරසාරව පවසා සිටී. එම කරුණ පැහැදිලි කරනු වස් එක් සිදුවීමක් මෙසේ විස්තර වෙයි. වරෙක මුහම්මද් නබි (සල්) තුමා තම කලණ මිතුරන් හා පිළිසඳරේ යෙදී සිටින කළ ඔවුන් අමතා 'මිත්‍රවරුනි, ඔබ

ඔබ නිත්‍යානුකූල බිරිඳත් සමග එක්වී කායික උවමනාවන් සන්තර්පනය කර ගැනීමදට පිනක් වේ' යයි දෙසූහ. එයට සාවධානව ඇහුම්කන් දුන් කලණ මිතුරන් 'වක්තෘ තුමනි, අප අප අඹුවන් හා එක්වන්නේ අපගේ කායික උවමනාවන් සන්තර්පනය කර ගන්නටයි, එයටත් පිනක් වේද?' යි විමසන්නට වූහ. එයට වක්තෘ මුහම්මද් තුමා 'කෙනෙකු ඉස්ලාම් දහම නොඅනුමත කළ අන්දමින් තම කායික උවමනාවන් ඉටු කර ගත් කළ එයට අඩුවමක් වේද? යි හැගුම්බරව විමසූ කළ කලණ මිතුරන් 'ඔව්' යනුවෙන් උත්තර දුන්හ. 'එසේ ඉස්ලාම් දහම නොඅනුමත කළ අයුරින් තම කායික උවමනාවන් ඉටු කර ගන්නාට කෙසේ අඩුවමක් නියම වේද, එය දහම අනුමත කළ අන්දමින් ඉටුකර ගන්නාට මහා පිනක්ද වේ' යනුවෙන් උත්තර දුන්හ. (මුස්ලිම් සහ තිර්මිදි)

මුහම්මද් නබි තුමාගේ පෙර විස්තර කරන ලද ඔවදන අර්ථව්‍යාඛ්‍යාන කළ විද්වතුන් සහ ප්‍රඥයන් යමෙකු තම කායික උවමනාවන් සන්තර්පනය කරන විට තම බිරිඳගේද උමනාවන් සහ අයිතිවාසිකම්ද ඉටුකළ අයෙකු ලෙස වන්නේය. එසේම ඔහු තම කායක උවමනාවන් සන්තර්පනය කර තම දේහයට කළ යුතු යුතුකමක් සම්පූර්ණ කරන අතර දුරාචාරය වැනි අදැමිටු ක්‍රියාවන්ගෙන් තම සිතද මර්මස්ථානයද ආරක්ෂා කර ගන්නේය. මිනිසාගේ මෙවන් මිනැ එපාකම් සහ කටයුතු වලට පවා පිනක් ලබන කළ මිනිසා කෙරෙහි වූ අල්ලාහ් දෙවිඳුගේ දයාව කරුණාව කුමට කියන්නද? මිනිසා තමා නිර්මාණයවූ හේතුව මනාව වටහා ගන්නේ නම් සම්පූර්ණ මිනිස් ජීවිතයම පහසුවෙන්ම වන්දනාමානයක් ලෙස හැඩ ගැහෙන්නේය.

අල්ලාහ් දෙවිඳු තමා මිහිපිට බුක්ති විඳිමින් පාලනය කර මින් යෙහෙන් ජීවත් වන්නට නිර්මාණය කළේයැයි මිනිසා

තම නිර්මාණයේ ඉලක්කය අන්ථානුසාරයෙන්ම වටහා ගත යුතුය. තම ජීවිතය තුල ඒ අල්ලාහ් හැර වැඳීමට වෙනත් දෙවියෙකු නැත, ඔහුගේ තෘප්තිය ඉලක්කය කර ගෙන ඔහුගේ ආඥා සහ අනපනත්වලට අනුගතව ඒ සංකල්පය මිහිපිට සංස්ථාපනය ගත කරනු වස් කටයුතු කිරීමේ අරමුණින් ක්‍රියාවන් කළ ඔහුගේ බස් දෙබස් සහ ක්‍රියාවන් සියල්ල වන්දනාමානය ලෙස සනිටුහන් වන්නේය. මිනිස් නිර්මාණයද ඒ ඉලක්කය ගැන අල්ලාහ් පරිශුද්ධ වූ අල්කුර්ආනය තුලින් මෙසේ පවසයි. *මා ජින් සමූහයද මිනිස් සමූහයද (මට කීකරු වී) මා නැමදුම් කරන්නට මිස මැව්වේ නැත.* (56 : 51)

සර්වබලධාරී දෙවිඳු විසින් පවසන ලද ඉහත සඳහන් දේව වැකිය පිළිගත් බොහෝ මුස්ලිම්වරු තමා දෛනිකව කරගෙන යන සීමිත වේලාවකින් අවසන් වන වන්දනා මනයන් සමහරක් කළා නම් ප්‍රමාණවත් යැයි ගණනය කරති. නමුදු අල්ලාහ් මිනිසාගෙන් බලාපොරොත්තු වන්නේ ඔහුගේ වන්දනා මානයන් එයට වඩා පුළුල් ලෙස විය යුතු බවය. මිනිසා තම ජීවිතයේ විනාඩි කීපයක් පමණක් වන්දනාමානයේ ගෙවන්නේ නම්, ඔහුගේ ජීවිතය විශාල පාරාසයක් අල්ලාහ්ගේ ප්‍රියමනාපයෙන් තොරව ඔහුගේ සතුටෙන් තෘප්තියෙන් ඉවත් වී අනිවාර්යේ ගෙවා දමන්නට සිදුවන බව නොකිව මනාය. ඒ වනාහී නිදා ගන්නා සහ අනෙකුත් සීමිත වේලාවන් හැරෙන්නට මිනිසාගේ දෛනික කටයුතු සියල්ල තුලින් ඔහුගේ සම්පූර්ණ ජීවිතයම අල්ලාහ් දෙවිඳු ප්‍රිමනාප වන අයුරු වන්දනාමානයන් හා සම්බන්ධවීමක් කරගෙන ගෙවා දැමීමක් සිදු විය යුතුය. මේ මැයෙන් බලන කළ අල්ලාහ් තම අත වැසියන්ගෙන් බලාපොරොත්තු වන අයුරු ඔවුන්

තම වන්දනාමානයන් සපුරා නැත යනුවෙන් වූ අඩ හඳ මනසකින් ජීවත්වන බව සහසුද්දෙන්ම පැහැදිලි වේ.

මෙසේ මිනිසා තම සෑම වන්දනාමානයක්ම යම් සීමිත වන්දනාමානයක් ලෙස තක්සේරු ගෙන කටයුතු කරන ආකාරය ගැන ප්‍රබල ඉස්ලාමීය විද්වතෙකු වන මුහම්මද් බින් කස්සාලි තම 'මේ අප දහමයි' යන පොතේ මෙසේ විස්තර කරයි : තමන් ඉස්ලාමියකයන්, ඉස්ලාම් දහම පවසන අයුරු පිළිපදින්නන් යනුවෙන් පවසමින් පැහැර හැරිය නොහැකිය යනුවෙන් සිතා සීමිත වන්දනාමානයන් පමණක් ඉටුකරමින් පසුවන්නන් ඔවුන් ඉස්ලාම් දහම සම්පූර්ණයෙන්ම පිළිපැද දහම පවසන අයුරු ජීවත් වන්නන් යනුවෙන් සැළකිය නොහැකිය. නමුදු මිනිසා උපන්දා සිට විපත දක්වා ඔවුන්ගේ ජීවන මග කෙසේ විය යුතුයි විස්තර කර ඒ ආඥාවේ අර්ථ සාරයෙන්ම ජීවත්වී මියදීම සම්පූර්ණ වන්දනාමාන මග යනුවෙන් ඉස්ලාම් දහම විස්තර කරයි.

අප විවෘතව දකින ලොව සහ දෛනික කටයුතු ක්‍රියා වන අයුරු යම් ඥානයක් සහ විවෘතව අවධානය කරන කළ ඒ කෙසේ ක්‍රියා වනවාද යි එහි යථාර්ථයෙන්ම අපට වටහා ගත හැකිය. උදාහරණයක් වශයෙන් යමෙකු යම් උපකරණයක් නිෂ්පාදනය කරනවා යැයි සිතමු. එසේ නිෂ්පාදනය කරන්නා තමා කොපමණ ප්‍රමාණයක් නිෂ්පාන කර ඇත්ද යනුවෙන් එහි තොගය ප්‍රධාන කරුණක් කොට සළකන්නේ නැත. ඒ වෙනුවට තමා නිෂ්පාදනය කළ නිෂ්පාදනය තමා අපේක්‍ෂා වන අන්දමින් ක්‍රියා කරනවාද, ප්‍රයෝජනය වනවාද යන ඉලක්කය ඔහුගේ නිෂ්පාදනයේ ප්‍රධන අරමුණයි. එසේම බලවත් පරීක්‍ෂණයක් සහ නිරීක්‍ෂණයක් මැද්දේ නිර්මාණය වන ගුවන් යානයන් ක්‍රමානු කූලව අනතුරකට හෝ අකර තැබිබකට හෝ හාජණය නොවී පියාසර කරන අයුරින්ද,

නිෂ්පාදනය වන පැන් පැහැදිලිව අගේට ලියන අන්දමින්ද, එසේම අනෙක් නිෂ්පාදණයන් එහි අරමුණ සහ ඉලක්කය සපුරන අයුරු උසස් තත්වයෙන් නිෂ්පාදනය විය යුතුය. එසේ එහි ඉලක්කය අරමුණ සපුරන්නට හැකි වන්නට ඒ නිෂ්පාදන අලෙවි කරන්නට හෝ එයින් උපරිම ප්‍රයෝජනය ලබා ගන්නට හෝ හැකි වනවා මිස හුදෙක් නිර්මාණය කරනවා යන රිසියෙන් පමණක් නිෂ්පාදණය කරන්නට එහි නියම අරමුණ, ඉලක්කය සාක්ෂාත් කරගන්නට නොහැකිය යන්න සක්සුදක්සේ පැහැදිලිය.

මිනිස් ජීවිතයේ හරය එහි පැවැත්ම ගැන නියම ඉලක් කය ලබා ගැනීමට නම් එහි අරමුණ සාක්ෂාත් කර ගැනීම් පිණිස කළ යුතු බව ඉස්ලාම් දහම බලාපොරොත්තු වේ. එසේම මිනිසා සර්වඥාන අල්ලාහ් දෙවිඳු සදා තමා ගැන අවධානමෙන් සිටී, මහුගේ අවධානයට මුආවී කිසිවක් කර න්නට බැරිය, කියන්නට බැරිය බියෙන් කටයුතු කරන කළ තමා මුහුණ පාන්නට සිදුවන විවිධ මාදිලියේ බාධක, කරදර සහ දුක්දොම්නස් සියල්ල සැකසුරුවම් කර ජයගෙන තම ජීවන ගමණ සෘජුව ඉදිරියට කර ගෙන යා හැකි ජවය ලබන්නේය. එසේ කටුතු නොකරන්නට එහි නියම එලවිපාක සාක්ෂාත් කර ගන්නට බැරි බව වටහා ගත යුතුය. උදාහරණ යක් වශයෙන් යම් නිෂ්පාදනයක් කරන්නට තීරණය කරන්නා එයට උවමනා අමුද්‍රව්‍ය සුදුසු යන්ත්‍රයක් තුලට ඇතුල් කළ විට අවසානයේ එය තමා බලාපොරාත්තු වූ භාණ්ඩයක් ලෙස පරිවර්ථනය වී පිට වන්නේ කෙසේ දෝ එසේම මිනිසාගේ තිරසාර විශ්වාසයද හා එක්මුසුවන වන මහුගේ දෛනික කටයුතුද අවසානයේ ප්‍රයෝන විය සුඵලවිපාක ගෙන දිය හැකි වන්දනාමාන ලෙස පරිවර්ථනය වන්නේය.

මේනයින් බලන කළ තම හිතට සීමා කරන්නට බැරිව ලෞකිය ජීවිතයෙහි එහි සැපසම්පතෙහි ගිලී වල්මත් වී සිටින්නන්ගේ මනෝමය අදහසට අකුල් පහරක් හෙළමින් අල්කුර්ආනය මෙසේ විස්තර කරයි : *(මෙසේ හදමනසට වහල්වී ජීවත් වන) යුදෙව්වන් හෝ කිතුනුවන් හෝ හැර අන් කිසිවෙක් කිසිසේත් ස්වර්ගයට ඇතුල් වන්නේ නැතයි ඔවුන් පවසති. එය ඔවුන්ගේ නිරර්ථක සිතුවිලිය. (මෙම කරුණෙහි) ඔබලා සත්‍යවාදීහු නම් ඔබගේ සාධක ගෙන හැර පානු මැනවි. නොඑසේය. තමා සපුරාම අල්ලාහ්ට සමර්පනය කර තවද දැමිටු කම්වල යෙදෙන්නේ කවරෙක්ද ඔහුට ඔහුගේ ඵලවිපාක ඔහුගේ ස්වාමිහු වෙත වේ. මොවුන්ට බියකුදු නැත. ඔවුහු ළතැවන්නෝද නැත.* (2 : 111-112)

එහෙයින් සත්ක්‍රියාවන් සහ දැමිටු ක්‍රියාවන් ජීවිතයේ එක් තරා සීමාවක් තුලට සමකර සීමා නොකර අපගේ සියළු අව්‍යාජ ක්‍රියාවන් සහ කටයුතු අල්ලාහ්ගේ අණ පනත්වලට අනුගතය ඔහුගේ සීමාවන් සහ බාධාවන් නොඉක්මවා ඔහු බලාපොරොත්තු වන අන්දමින් කටයුතු කරන්නට, නිමා කරන්නට උත්සාහ කිරීම ඉස්ලාම් දහම සහ අල්ලාහ්ගේ ප්‍රිමනාපය සහ අදහස යතුවෙන් විස්තර කළ හැකිය.

අප පෙර සඳහන් කළ ආකාරයට කෙනෙකු තම දෛනික මංපෙත්තා තුල වන්දනාමානයන්හි නිරත වන කළ එහි ඇතිවන බලපෑම සහ විපර්යාසය ඔහුගේ ජීවිතය තුල සම්පූර්ණයෙන්ම පෙරලියක්, කැළඹිල්ලක් සහ පොළඹවීමක් ඇති වන අතර ඔහුගේ හදනමස සහ ක්‍රියාව විශේෂ අරමුණක් උදෙසා නිහතමානීව ක්‍රියා වන්නේය. ඒසේම ඒ කැළඹිල්ල සහ පොළඹවීම තම ජීවිතය තුල පමණක් නොව තම පරිසරය සහ අවට සමාජ තුලද නියෝජනය වන්නට තරම් වෙනසක් ඇතිකරන්නේය. එසේ පෙළඹවීමක් සහ කැළඹි

මක් ගැන විස්තර කරන විට එය මතු සඳහන් කරුණු දෙකක් මත නියෝජනය වන බව වටහා ගත යුතුය.

අප පෙර සඳහන් පරිදි කෙනෙකුගේ සම්පූර්ණ දිවියම වන්දනාමාන අයුරින් ගත වන කළ ඔහුගේ ක්‍රියාවන් සපුරාම අල්ලාහ් දෙවිඳු ප්‍රියශීලී වන අයුරින් හැඩ ගැහෙන්නේය. එසේම ඒ ක්‍රියාවන් අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් සහ අණ පනත් සමග සම්බන්ධවූ එකක් ලෙසද ඒ ක්‍රියාවන්හි යොදන කළ ඒවා අල්ලාහ් වෙනුවෙන් පමණක් පිරිසිදු චේතනාවෙන් කරන බවට වූ බියක්ද මූලික අදහසක් ලෙස ඉලක්කයක් ලෙස කර ගන්නේය. එසේ ඔහු ක්‍රියාවන කළ තමා විසින් නොකරන ලද අනෙකුත් දැමිටු ක්‍රියාවන්හීද තමා නිරත විය යුතුය යන විශාල උනන්දුවක් පිබිදීමක් ඔහු තුල ඇති කර ඔහුගේ පින් පට්ටෝලයද තවතවත් පිනෙන් සණ වන අතර දයාන්විත අල්ලාහ් අභියසට ලංවීමද ඉක්මන් මගක් විවෘත කරන්නේය. තවද ඔහු කරන අනේකවිධ දෛනික ලෞකික කටයුතු අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් පමණක් කර ඔහු වෙතින් පමණක් පිනක් හෝ ප්‍රති විපාකයක් තමා සතු කර ගත යුතුය යන අදහස ඔහු තුල මුදුන්පත් වන විට තමා කරන කටයුතු සියල්ල අවංකව අල්ලාහ්ගේ උසස් සන්තෘෂ්ටිය සහ සොම්නස ලබා ගනු වස් නිවැරැදිව කළ යුතු බවද ඔහුගේ සිත්සතන උනන්දු කරවන්නේය.

එසේ අල්ලාහ් ඉමහත් තෘප්තියට පත්විය යුතුය යනුවෙන් වූ එකම අභිලාෂයෙන් හෙතෙම වන්දනාමානයන් හෝ යුතුකම් හෝ ඉටු කරන කළ ඉඳුරාම අල්ලාහ්ට කීකරු විය යුතුය යන එකම අභිලාෂය ඔහුගේ අදහස් සහ චින්තනය පවතින්නේය. ඒ උසස් අභිමතය උදෙසා ඔහු කටයුතු කරන විට ඔහුගේ කැමැත්ත පිට කරන ක්‍රියාවන් සහ ඔහු කුසීත කමෙන් ඉවත්වී සිටින සියළු දේ අල්ලාහ් වෙනුවෙන් පමණක්

යන පිරිසිදු චේතනාවෙන් නිම කරන අතර ඔහුගේ එලොව මෙලොව සෑම කටයුත්තක්ම ඒ අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් පමණක් කළ යුතුය යන තීරණයකට බසින්නට අවස්ථා සැළසෙන්නේය. ඉලක්කය මුදුන්පත් කරනු වස් කටයුතු කිරීමට පෙළඹෙන කළ ඔහුගේ හදමනස තුල හෝ ඔහුගේ දෛනික කටයුතුවල හෝ කිසිඳු කැළඹිල්ලක් හෝ කරදරයක් හෝ නොවන අයුරු කටයුතු කිරීමට හෝ කල් ගෙවීමට අවස්ථා එළඹෙන්නේය. මන්දයත්

ඔහු උවමනා වේලාවට අල්ලාහ් වන්දනාමාන කර අනෙක් ඉතිරි පැයේ මිනිසුන් විඳින්නෙකු නොව. ඔහු දේවස්ථානයකට වී අල්ලාහ් වන්දනාමාන කර දෙවස්ථානයෙන් පිටවූ කළ පරිභාහිර ජීවිතයේ ලොව සහ එහි දැයට වන්දනාමාන කරන්නෙකු නොව. සතිය දිනක එක් අවස්ථාවක් පමණක් අල්ලාහ් දෙවිඳු වන්දනාමානය කර අනෙක් දිනයන්හි සහ අනෙක් ඔහු හැර අන් ලොකික අවස්ථාවන්ට සහ එහි ඇති දේවලට වන්දනාමාන කරන්නෙක් නොව.

එහෙයින් එවැනි මිනිසා කුමණාකාර පුද්ගලයෙකු වේ නම් හෙතෙම කොහි කෙසේ වූවද කුමණ රාජකාරියක නිරත වී සිටියද ඉතසිතින් නිහතමානීව අල්ලාහ් දෙවිඳු පමණක් වන්දනාමාන කරන්නෙකු වේ. එසේම ඔහු අල්ලාහ්ගේ තෘප් තිය කෙරෙහි උනන්දුවෙන් පසුවන්නෙකි. ඒ තෘප්තිය උදෙසා ඕනෑම කටයුත්තක් කිරීමටද ඔහු පැකිලෙන්නේ නැත. ඔහු කුමන දිසාවක සිටියත් තම සිත අල්ලාහ් කෙරෙහි සම්පූර්ණ යෙන්ම හරවා ගත් කෙනෙකු ලෙස කටයුතු කරන්නෙකි. මේ අදහස පහදනු වස් අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි: *නැගෙනහිර දිසාවත් බස්නාහිර දිසාවත් අල්ලාහ්ට අයත්ය. ඔබ වන්දනය පිණිස කුමණ දිසාවකට හැරුණද*

*එහි අල්ලාහ්ගේ මුහුණය. අල්ලාහ් සර්ව ව්‍යාපකයාය. සියල්ල දන්නේය.* (2 : 115)

අල්ලාහ්ගේ මේ කියමනට අනුගතව සත්‍ය කෙනෙකුගේ හදමනස සැමවිටම අල්ලාහ් සමග සම්බන්ධ වී ඔහුගේ සියළු කටයුත්තන් ඉඳුරාම අල්ලාහ් උදෙසාම ක්‍රියා වන්නේය. එසේ ඍජුව ක්‍රියාවන කළ ඔහුගේ හිත හෝ චින්තනය හෝ ඔහුගේ ජීවිතය හෝ අල්ලාහ්ගේ සිහියෙන් සහ ඔහු කෙරෙහි වූ තිර විශ්වාස යෙන් කිසිසේත් ඉවත වන්නේ නැත. මන්දයත් එසේ අල්ලාහ් කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් පසුවන කළ ඔහු ඒ ඍජු මගෙන් ඉවත් නොවී කටයුතු කිරීමට අල්ලාහ් දෙවිඳුම පිටිවහලක් වන්නේය. එසේ ඔහුට තම පරම පිවිතුරු දෙවිඳුගේ පිටිවහල සහ අනුග්‍රහනය ලබන්නට ඔහුගේ ස්ථාවරය පිරිසිදු චේථ නාවෙන් අල්ලාහ් දෙවිඳු පමණක් වන්දනාමාන කරන කෙනෙකු ලෙසද ඔහුගේ එකම අධිෂ්ඨානය අල්ලාහ් දෙවිඳුගේ තෘප්තිය ලබා ගැනීමද ඔහුගේ මග පෙන්වීම අල්කුර්ආනය තදින් අල්ලා ගැනීම යනුවෙන් ද වේ.

උපතින් සාසනික යුදෙව්වක්ව සිට පසුකලෙක ඉස්ලාම් දහම පිළිගත් ප්‍රබල විද්වතෙකු වන ඔස්ට්‍රියාවේ උපන් මුහම්මද් අසාද් ලියෝපොල්ට් විසින් ලියන ලද 'මක්කාවට මාවත' යන ග්‍රන්ථයේ ඉස්ලාමීය දහම තුල වන්දනාමනයේ වැදගත්කම යනුවෙන් වූ කරුණක් මෙසේ විස්තර කරයි : ඉස්ලාමීය වන්දනාමාන පිළිවෙතේ වන්දනාමානයන් අනෙකුත් දහම්වල වන්දනාමානයන් ලෙස නොවී එයටම ආවේණිකවූ සම්පූර්ණ යෙන්ම පැහැදිලි විශේෂ මගක් තමා සතු කරගෙන ඇත. ඉස්ලාම් අනකරන වන්දනාමාන, දෛනික කටයුතු, උපවාස ශීලය සහ හජ් වැනි සීමිත කටයුත්තන් පමණක් බියබැතියෙන් කිරීමෙන් පමණක් වන්දනාමාන සියල්ල අවසන්වේ යනුවෙන්

හෝ තම යුතුකම අවසන් වී ඇත යනුවෙන් හෝ ගණනය කළ නොහැකිය. වෙනුවට ඉස්ලාමීය වන්දනාමානය යනු සම්පූර්ණ මිනිසා තම ජීවිතය සහ එහි ක්‍රියාපරිපාටි වටා ගෙතුනු සියල්ල අන්තර්ගත එකකි. එහෙයින් මිනිස් ජීවිතයේ අරමුණ සහ ඉලක්කය සපුරාම වන්දනාමානයක් ලෙස ඉස් ලාම් දහම පැහැදිලිව පවසා සිටියි. සෘජු මිනිස් ජීවිතය යනු සීමාසහිත එක් කොටු පවුරක් තුල පමණක් සීමා නොවූ එකක් නොවන අතර විවිධ යුතුකම්වලින් සහ වගකීම් වලින් සමන්විත ලෞකික ජීවිතයේ ක්‍රියා කාරකම් සහ ප්‍රත්‍යක්ෂ කටයුතු සියල්ල එකසේ නියොජනය වියයුතු ක්‍රියායකි.

එසේ යමෙකුගේ දෛනික කටයුත්තු එය අල්ප හෝ කුඩා හෝ වූවද එය ක්‍රියාවෙහි යොදන කළ හුදුමහත් මිනනැම තත්වයකට පත්වූවද ඒවා සියල්ල යමෙකුගේ ජීවිතය තුල සම්පූර්ණයෙන්ම නියෝජනය විය යුතුය. යමෙක් කරන සාවද්‍ය නොවූ සියළු කටයුතු හුදෙක් අල්ලාහ් වෙනුවෙන් කළයුතු වන්දනාමානයන් යුතුකම් යන දෘෂ්ඨියට හසු කරමින් කටයුතු කළ යුතුව ඇත. ඒවා ක්‍රියාවෙහි යොදන කළ ඒ හා සම්බන්ධ යථාර්ථ විවෘත අවංක හදමනසෙන් සහ පිරිසිදු චේථනාව මුල් කරගෙනද කටයුතු කළ යුතු අතර එසේ නැතිව ඒ කටයුතු අල්ලාහ් දෙව්දු අභියස කිසිදු පින්දහමක් ලෙස ගණන් නොගැනේ. තම දෛනික වන්දනාමාන කටයුතු තමා අල්ලාහ් වෙනුවෙන් කළ යුතු යුතුකම්, සියල්ල ජත්‍යන්තර වගකීම් හෝ ජත්‍යන්තර ව්‍යාපෘත්ති එනම් සමාජ උන්නතිය උදෙසා කරන යුතුකමකි යන අදහසක් මුදුන් පත් කරගෙන කටයුතු කළ යුතුය. මේ අවස්ථා මිනිසෙකු තමා තුල විවෘත අති උසස් ඉලක්කය සපුරන අවස්ථාවක් අධිෂ්ඨානයක් කරා උසස් ස්ථානයකට පත් කරන්නේය යන චින්තනයකින් සමන්විතව කළ යුතුය. එහෙයින් සත්‍ය

ඉස්ලාම් දහමේ ඉලක්කයේ එකම දිනුම් කණුව මේ අභිලාෂයන් සම්පූර්ණයෙන්ම සපුරා තෘප්තිමත් වීම වේ. එහෙයින් ඉස්ලාම් දහමේ ද්විතීය අදහසකට කිසිදු ඉඩක් නැත.

එහි මුල්ම අදහස මිනිස් ජීවිතය යනු එය සම්පූර්ණයෙන්ම අල්ලාහ් දෙවිඳුගේ අනපනත් ආඥා අනුව වන්දනාමාන කිරීමෙහි රැඳී ඇත. මිනිස් ජීවිතයේ සීමිත කටයුත්තක් පමණ නොව, යෙහෙන් ඒ තුල ව්‍යාප්ත වී පවතින, තාවකාලිය සුවහසක් ක්‍රියාවක්ම වන්දනාමානයන් ලෙස ඉස්ලාම් දහම පවසා සිටියි. එය හුදෙක් තනි පුද්ගල කටයුත්තක් වූවද සමූහ සමාජ සහ පිටස්තර කටයුත්තක් වූවද ඒවා සියල්ල අල්ලාහ් දෙවියඳු අභියස වන්දනාමානයන්ය.

දෙවැන්න, මිනිස් ජීවිතය හුදෙක් සමාජීය ලෞකික ජීවිතය සහ ශික්ෂාවෙන් පිරුණු ආත්මීය අධ්‍යාත්මික ජීවිතය යනුවෙන් සළකණ විට මිනිස් ජීවිතය අප පෙර සඳහන් උසස් ඉලක්කය, අවසානය කරා ලඟා විය නොහැකිය යන්න සක්සුදක්සේ පැහැදිලිය. එහෙයින් මිනිසා ඔහුගේ දෛනික, ලෞකික කටයුතු සහ ආත්මීය අධ්‍යාත්මීය සෘසතික ශ්‍රධාව පාදක කොට ගෙන ක්‍රියා විය යුතු අතර ඔහුගේ කය සහ ජීවය හෙවත් ආත්මයද සම්මිශ්‍රණය වී ක්‍රියා විය යුතුය. මන්දයත් මිනිසාගේ සෑම කටයුත්තකදීම ඔහුගේ කය සහ ජීවිය නොගිලි හෙන අයුරු විතැන් නොවී එකිනෙකට සම්මිශ්‍රණය වී ක්‍රියාවෙමින් පවතින්නේය.

එසේම අල්ලාහ් ගැනවූ ඒකේශ්වර සංකල්පයද අපගේ චින්තනය හා අපගේ ජීවිතය හා එකට එක්වී අනේකවිධ ප්‍රතිචාරයන් තුලින් සම්මිශ්‍රණය වී නොගිලිහෙන අයුරින් යථාර්ථවතර විය යුතුය. ඒ ස්ථිර චින්තනයකින් තොරව මිනිස් ජීවිතයේ සියළු කටයුත්තන් සහ ක්‍රියාවන් පැහැපත් අධිෂ්ඨානයකින් කරන කටයුත්තක් විය නොහැකිය. ඒ තිර

සාර ප්‍රතිපදාව සහ චින්තනය ඉස්ලාම් දහම සහ අනෙකුත් දහම්වල නීතිරීති අතර උසස් ස්ථානයක් හොබවමින් පැහැදිලිව වෙන්වී පෙනෙයි. එනම් ඉස්ලාම් දහම අසහාය ජීවන මගක් යන මැයෙන් එය මිනිසා සහ විශ්වයේ අධිපතියා අතර වූ කිසිසේත් නොගිලිහෙන අනූන සම්බන්ධය මනාව සැකසුරුවම් කර, පාලනය කර පවසනවා පමණක් නොව, මිනිසා සහ ඔහු ජීවත්වන සමාජය සහ පරිසරය අතර ලෞකික සහ අධ්‍යාත්මික, කටයුත්තත් කුමක්ද වැනි සියල්ල ඍජුව අර්ථානුසාරයෙන්ම විස්තර කරන්නේය.

මිනිසාගේ ලෞකික ජීවිතය ලෝකෝත්තර ජීවිතය හා සන්සන්දනය කරන කළ එය හුදෙක් කම්සැප සුවයෙන් පිරුණු සාමාන්‍ය ජීවිතයක් පමණක් සාක්ෂාත් කර ගන්නට නිමවූ ප්‍රතිපදාවක් නොව. එසේම කිසිදු පෙර සූදානමින් තොරව හෝ ඉලක්කයක් නොවූ තීරණයකින් තොරව හෝ ස්වව හෝ වරක් නොවන්නට වෙනත් අවස්ථාවක වැරදිය හැකි මුග්ධ මිනිසාගෙන් නිර්මාණයක් වූ එකක් යැයි නොබැලිය යුතුය. එසෙත් නොවන්නට හුදෙක් ස්වව ඇතිවූ මැවීමක් ලෙස හෝ හුදෙක් මනොමය ජීවිතයක් උදෙසා නිර්මාණ වූවක් ලෙස හෝ තීරණය කිරීමෙන් වැළකී, හුදෙක් එය විශාල වගකී මකින් සහ පරමාර්තයකින් හෙබී එකක් බව පිළිගත යුතුය. ඒක්තරා උසස් ඉලක්කයක් මුදුන්පත් කර ගනු වස් මිස අනිවාර්යයෙන්ම සිදුවිය හැකි මරණින් මතු ජීවිතය වෙනුවෙන් එය මනොමය තාවකාලික ජීවිතයක් යැයි තකා නොසැළකිල්ලෙන් කටයුතු කිරීමද කිසිසේත් සුදුසු නැත. මිහිපිට මිනිස් ජීවිතයේ උසස් අධිෂ්ඨානයක් සපුරන ජීවිතයක් ලෙස ඒ දෙස බැලීම එහි යතාර්ත ස්ථාවරය වේ. අල්ලාහ්ට කිසිදු පිටිවහලක් නුවුමනාය. උසස් පරමාර්ථයක් උදෙසා කළ

මඟුගේ නිමවුම්ද එකීයයි. එනම් එකම එක අරමුණක් සාක්ෂාත් කරගෙන මිනිස් සමාජය නිර්මාණය වී ඇත.

ඉස්ලාමීය දෘෂ්ටිය තුල මිනිස් ජීවිතයේ හරය අප පෙර සඳහන් කළ අයුරු මුළුමනින්ම පිරිසිදු චේතනාවෙන් අල්ලාහ් වෙනුවෙන් වන්ද නාමානය කිරීම යන්න දෙවැනි අදහසකින් හෝ විකල්ප අදහසකින් තොරව සුපැහැදිලිය. අනෙකුත් දහම් සහ සංකල්පයන් ගැන පවසන කළද, මිනිස් ජීවිතය සඳු රාම පරිපූර්ණ ජිවන මගක් සාක්ෂාත් කරගත හැකි වන්නේ ඉස්ලාමීය ආත්මීය අධ්‍යාත්මික සංකල්පය තුලින්වූ අදහස් සහ නීතිරීතිවලින් පමණක් බව එහි ප්‍රතිපදාවම පැහැදිලිව වාර්ථා කරමින් පවතින්නේය. මිනිස් ජීවිතය විශේෂ දයාදයක් ලෙස ලබා ඇති කායික ආශාවන් සහ කායික උවමනාවන් සම්පූර් ණයෙන්ම දමනය කළ පසු හෝ තමා ගෙන් තුරන් කළ පසු හෝ නොවන්නට ඒ උවමනාවෙන් මියදෙන්නට හැර හෝ ඒ සම්පූර්ණ අවස්ථාව සාක්ෂාත් කර ගත හැකිය මිනිස් ජීවිතයේ අධ්‍යාත්මික ඉලක්කය වෙත සමීප විය හැකිය යනුවෙන් පවසමින් මිනිසා ඒ යථාර්ථ උවමනා වෙන් පසුපසට තල්ලු කර දමා හෝ ඒ අවස්ථාවන් ඉස්මතු නොවන අයුරු ආහාර වලදා හෝ ජීවත්විය යුතුය යනුවෙන් ඉස්ලාම් දහම කිසිසේත් නොපවසයි.

සනාතන ප්‍රතිපතාවන් කීපයක් ඇති මහා භාරතයේ උපත ලද විශාල ප්‍රමාණයක ශ්‍රද්ධාවන්තයින් තමා සතු කර ගෙන ඇති හින්දු දහමේ පවසන අන්දමට මිනිසා උසස් වගකීමක් ඉටුකරනු වස් දයාදයක් ලෙස ලබා ගෙන ඇති විවිධ උවම නාවෙන් හෙබී කයට සහ එහි අවයව පද්ධතීන්ට අඛණ්ඩ මෙවන් පුහුණු සහ දුක්දීමෙන් පසු මිනිස් නිර්මාණයේ ඉලක්කය ලබා ගත හැකි බව ඉස්ලාම් දහම කිසිසේත් ආඥා නොකරයි. එසේම මිනිසාගේ ලෞකික සුවය උවම

තාවත් බලයෙන් උදුරා දමා මිනිසත්වයේ එක් කොටසක් විකෘති කර විනාශ කර හැඟීම් සහ හදමනස පිනවන සන්සුන නැති කොට මිනිස් නිර්මාණයේ ඉලක්කය සපුරා ගත යුතුවෙන් පවසන බුද්ධාගම හා සමාන ප්‍රතිපදවක්ද මෙහි නැත. එවැනි විවිධ විලම්බිත මතවලින් තොරව මිනිස් ජීවිතය තම සාදාරණ සාමාන්‍ය ලෞකික ජීවිතයේ පැවැත්ම තුලින්ම ඒ අසහාය උසස් ඉලක්කය ලබා ගත හැකි බව ස්ථිරසාරව පවසා සිටී. ඒ ලෞකික ජීවිතයේ කායික උවමනා වන්ද සපුරන කළ ඒවාද අල්ලාහ් දෙවිදු වෙනුවෙන් කරන වන්දනාමානයන් ලෙස සැළකෙන්නට නම් මිනිසා මිහිපිට තමාට හැකි අයුරෙන් පරමාධිපත්‍යයා පනවන ආඥාවන්ට අනුගතව එහි එක්එක් අංගයන් පාසා ඒවා වචනයේ පරිසමාප්ත අන්දමින් ඉටු කරන්නට උත්සාහ දැරීමෙන් එහි මල්ඵල සතු ගන්නට හැකිය.

මිනිසාගේ සියළු ක්‍රියාවන් වන්දනාමාන වේ

මෙය ඉස්ලාම් දහම පවසන වන්දනාමානයේ දෙවැනි අධියරය වේ. මුළු මිනිස් ජීවිතයම හුදෙක් අල්ලාහ් දෙවිදු විසින් තහනම් නොවූ අප්‍රිය නොවූ එහි එක් අවස්ථාවක්ම පිරිසිදු චේථනාවෙන් ඉටුකරන විට ඒවා උසස් ගණයේ වන්දනාමාන ලෙස ඉස්ලාම් සාක්ෂාත් කරයි. මේ මැයෙන් මුස්ලිම්වරයෙකුගේ මනස, චින්තනය, වචනය, දසුන, බැල්ම, විමසීම සහ ඔහු දයාදයන් ලෙස තමා සතු කර ගෙන ඇති අනෙකුත් පංචේන්ද්‍රියන් සියල්ල ඉස්ලාම් දහම අනුමත කර ඇති දැයෙහි යොමු කරන කළ ඒවා සියල්ල වන්දනාමාන යන් ලෙස අර්ථකථනය වේ. එසේම පිරිසිදු චේථනාවකින් ඉස්ලාම් දහම වෙනුවෙන් තම කුඩුම්ප දිවිය, රට සහ අනෙ කුත් තමා සතු සේසතෙන් ඉවත් වන කළ, වෙන්වන කළ ඒ වෙන්වීම තුලින් ඔහු විසින් කෙරෙන සියළු කටයුතු

අල්ලාහ් දෙවිඳු උදෙසා කරන උසස් වන්දනාමානයන් ලෙස පිළිගැනේ. එසේ ඔහු කටයුතු කරන මොහොතක් මොහොතක් පාසාම එය අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කරමින් පසුවෙයි යන ලෙස අර්ථකථනය වේ.

සත්‍ය ශ්‍රද්ධාවන්ත මුස්ලිම් වරයෙකු තම නිමවුම, දහම, අල්ලාහ්, ඔහු විසින් නිර්මාණය කරන ලද අහස පොළොව සහ ඒවා අතර වූ අනන්ත අප්‍රමාණ දේ සහ එහි සූක්ෂම නිමවුම ගැන විවෘත හදමනසකින් කල්පනා කරද, මිනිස් ජීවිතයට යහමග පෙන්වනු වස් අනුග්‍රහය වනු වස් පහළ වූ අල්කුර්ආනයද මනා ලෙස වටහා ගෙනද, මිහිපිට පෙර විසූ සමාජ වැසියන් කෙසේ ජීවත් වූවාද, ඔහුන්ගේ ජීවන චර්යා වත් සහ අදහස් උදහස් කෙසේ වීද, ඔවුන් අල්ලාහ් ගේ ආඥාවන් සහ අණපනත් කරමින්ද පිටු දකිමින්ද ඒවාට පටහැනිව කටයුතු කළ හෙයින් කෙසේ විනාශ මුඛයට පත්වීද, කුමණ අන්දමින් ඔවුන් හට දඬුවම් පමුණුවනු ලැබීද යන්න දැන ඒ දැනුම් සම්භාරය අනුව චින්තනය යොමු කර ඔහු මනා දැනමුතුකමක් අවබෝධයක් ලබන්නේය. ඒ දැනමුතුකම් සහ අත්දැකීම් අල්ලාහ් දෙවිඳුට ඔහුගේ අණපනත්වලට බියවී ඔහු වන්දනාමන කිරීම සහ ඔහුගේ ආඥාවන් සහ අණපනත් අනුව ජීවත්වීම පිණිස තම ජීවිතය හැඩ ගන්වා ගෙන ජීවත්වීමට මග පැදෙන්නේය.

එසේම මිනිසා තමාගේ සියළු කටයුතු අල්ලාහ් වෙනුවෙන් කරන ක්‍රියාන් ලෙස පරිවර්ථනය කර ගෙන ඒ අනුව කට යුතු කරන කළ ඔහු අල්ලාහ්ට කීකරු, ඔහුට සමීප හිතවත් අතවැසියෙකු ලෙස වන්නේය. අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් තම යුතුකම් මනා ලෙස ඉටුකළ කෙනෙකු වන්නේය. මෙසේ මුළු මහත් මිනිස් සමාජයම අල්ලාහ්ට කීකරු අතවැසියන් ලෙස වනු වස් අල්ලාහ් දෙවිඳු විසින්ම පහළ කළ දිවිවදන වන

අල්කුර්ආනය වෙත තම බැල්ම, විවෘත සිතින් යුතුව හරවන ලෙස අල්ලාහ් විවෘත ඇතුමකින් අමතයි. ඒ ගැන අල්ලාහ් දෙව්දූම මෙසේ විස්තර කරයි : *මෙම (කුර්ආනයේ උසස්) වාක්‍යයන් ඔවුන් කල්පනා කරනු වස්ද මෙය වෙතින් නුවනැතියන් (නොමද) දැනමුතුකම් ලබනු වස්ද අප මෙම (උසස්) කුර්ආනය ඔබ වෙත පහළ කළෙමු.* (38 : 29)

තවද මිනිස් හදමනස අවංකව අනෙක් නිර්මාණයන් වෙත විවෘත වන අයුරු, ඒ අනුව සත්‍ය සහ යථාර්ථය වටහා ගෙන කටයුතු කරන ලෙසද අල්කුර්ආනය අමතන්නේ ප්‍රඥා ගෝචරවය. ඒ ගැන අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි : *ස්ථිර විශ්වාස වන්තයින්ට භූමියෙහි දෘෂ්ටාන්තයන් වේ. ඔබ තුළද වේ. ඔබලා ඒවා නොදකින්නේද?* (51 : 20 -21)

අල්ලාහ්ගේ අසහාය නිමවීම් ගැන සිතා බලා එහි සූක්ෂම නිමවුම ගැන ඔහුට ස්තුති පූර්ව ප්‍රශංසා කිරීම කෙරෙහි නිකරු අනවැසියන් නිරත වන බව පරිශුද්ධ අල්කුර්අනයම සාක්ෂි දරයි. *ඇත්තෙන්ම අහස් සහ පොළොව නිර්මාණයෙහිද, (කාලය වෙනුවෙන්) රෑ දවල් මාරුවීමෙහිද, නැණැවතුන් හට සාධක වේ. ඔවුන් නැගිට සිටිමින්ද, හිඳිමින්ද, (හාන්සිව්) ඔවුන්ගේ ඇළෙන් හිඳද ඔවුන් අල්ලාහ් සිහි කරන්නෝය. අහස් සහ පොළොව නිර්මාණය ගැන ඔවුන් මෙනෙහි කර 'අපගේ ස්වාමිනි, මේවා සියල්ල ඔබ නිකරුණේ නිර්මාණය කළේ නැත. ඔබ සුවිශුද්ධය. එසේ හොයින් (ජ්වලිත් රුව නිරයේ) ගින්නෙහි (තද) වේදනාවෙන් අප ආරක්ෂා කරනු මැනව්' (යනුවෙන් ප්‍රාර්ථනා කරනු ඇත).* (3 : 190 - 191)

අල්ලාහ්ගේ මැවීම් සහ එහි අනර්ඝත්වය සහ ශ්‍රේෂ්ඨත්වය ගැන චින්තනය යොමු කිරීම, පැයක් දේවවන්දනය කිරීමට වඩා අගනේය යනුවෙන් මුහම්මද් තුමාගේ කලණ මිතුරෙකු වන ඉබ්නු අබ්බාස් තුමා වරෙක පැවසූහ (ඉබ්නු හිබ්බාන්).

තවද මුහම්මද් නබි තුමා දෙසූ බව අබූහුරෙරා තුමා මෙසේ පවසයි. ‘දැනුම සොයා එක් මගක පිටත්ව යන්නේ කවරෙක්ද අල්ලාහ් ඔහුට ස්වර්ගය මාතව ලිහිල් කරන්නේය’ (අහ්මද්). ප්‍රබල ඉස්ලාමීය විත්ව තෙකු වන ඉමාම් ෂාෆිඉ තුමා මෙසේ පවසයි: ‘ආගමික දැනුම අධ්‍යයනය කරනු වස් නිවසින් පිට වන්නා නෆිල් හෙවත් උපරි දේව නැමදුමක් කරනවාටත් වඩා අගනේය’. තවත් විද්වතෙකු වන වහබ් තුමා මෙසේ විස්තර කරයි : ‘මා විද්වත් මාලික් තුමා වෙතින් දැනුම හදාරමින් පසුවන විට මා විවර කර පාඩම් කරමින් සිටි පලකය හකුලා තබා උපරි වන්දනා මානයක් පිණිස නැගී සිටියෙමි. එය අවධානය කළ මාලික් තුමා මට මෙසේ ඔවදන් දුන්හ. ‘ඔබ දැන් කිරීමට සූදානම් වන ක්‍රියාව ඔබ මෙතෙක් වෙලා කරමින් හුන් ක්‍රියටාවට වඩා අගනා එකක් නොව’. (මිද්රාජ් අස්සාලිකීන්)

සත්‍ය මුස්ලිම් වරයෙකු අල්ලාහ් දෙවිඳු වෙත සමීප වනු වස් ඔහු කෙරෙහි ප්‍රයශීලීවී ඔහුට බියවී ඔහුගේ පෙරම්නුම වන හොඳ නොහොඳ සියල්ල සිනාමුසු මුහුණින් ඉවසීමෙන් පිළිගෙන ඔහුගේ කර්කශ අඬුවම්වලට බියවී කටයුතු කළ යුතුය. එසේම ඔහු විසින් තමාට පිරිනමා ඇති අනේකවිධ අනුග්‍රහයන් සහ වරප්‍රසාධයන් වෙනුවෙන් අවංකව ස්තුති වන්ත වී ඔහු ප්‍රශංසා කර තම සියළු කාර්යයන්හී විපාකය ඔහු වෙතම පවරා පිරිසිදු චේථනාවෙන් ඔහු වෙනුවෙන් කටයුතු කරන කළ ඔහුගේ සැම ක්‍රියාවන්හී අල්ලාහ්ට කීකරු වූ අත වැසියෙකු ලෙස වන්නේය. ඒ ගැන විස්තර කරමින් අල්ලාහ් දෙවිඳුම පරිශුද්ධවූ අල්කුර්ආනය තුලින් මෙසේ විස්තර කරයි : *තවද වන්දනාමාන සියල්ල ඔහුට පමණක් සුවිශුද්ධ කරමින් (සියලූ අදැම්වුවලින් ඉවත්වී)*

*සත්මාර්ගය කෙරෙහි සෘජුව නිරතවද ඔවුන් අල්ලාහ් පමණක් නැමදීමට හැර අනවූයේ නැත.* (98 : 5)

ඒ කරුණම තවත් සවිස්තරාත්මකව මිනිසාගේ ජීවිතයේ හරයද කෙසේවිය යුතුදැයි පරිශුද්ධ අල්කුර්ආනයේ තවත් තැනක මෙසේ විස්තර වෙයි : *සැබැවින්ම මගේ සලාත්ද (දේව නැමදුමද), මගේ (මාංශ දානය වැනි) කුර්බානිද, මගේ දිවියද, මගේ මරණ යද, විශ්වය නිර්මාණය කර සංවර්ධනය කරන අල්ලාහ්ටය යැයි (විවෘතව) කියව. ඔහුට සමාන කිසිවෙක් නැත. මම අනවන ලද්දේ මෙය ගැනය. තවද මම ඔහුට කීකරු වූ මුස්ලිම් වරුන්ගෙන් පළමු වැන්නා වෙමි' යි පවසව'.* (6 : 162-163)

තවද අල්ලාහ් දෙවිඳුගේ තෘප්තිය සහ සමීපවීම කෙරෙහි ආශාව දක්වන ඒ ශ්‍රධාවන්ත අනවැසියා හැකිතාක් අයුරෙන් අල්ලාහ් දෙවිඳු දික්ර් කර, ඔහු විසින් පහළ කරන ලද අල්කුර්ආනය පාරායනය කරමින්ද, තම උවමනාවන් පිරිසිදු හදමනස තුලින් වූ චේථනාව සාක්ෂාත් කොටගෙන ඔහු ගෙන්ම ඉල්ලා, පිරිසිදු විවෘත මනසින් ඔහු නිරත නිතර සිහි කර, පිරිසිදු හද සහ වචනයෙන් අල්ලාහ් වන්දනාමාන යෙහි යෙදෙමින් පදූ වන්නේය. සැකෙවින් පවසනවා නම් අල්ලාහ් දෙවඳුගේ කීකරු අනවැසියෙක් අල්ලාහ්ගේ ආඥා වන් පිළිගෙන දෛනික වන්දනාමාන කර, අවස්ථා ලද කළ අනෙකුත් ඇදහිලිද ඉටු කර, තමා මත පැටවී ඇති සමාජ යුතුකම්ද හැකි විලසින් ඉටු කර, දික්ර් ඉස්තිග්ෆාර් සහ දුආ ප්‍රාර්ථනාවන්හිද නොමදව නිරත වන්නේය. ඒ අදහස අල්ලාහ් දිව් වදන තුලින් මෙසේ විස්තර කරයි : *විශ්වාස වන්තයිනි, බොහෝවින්ම අල්ලාහ් දික්ර් (නාම මෙනෙහි) කරව. තවද (වන්දනාමනායන් තුලින්) උයද සහ සවස ඔහු සුවිශුද්ධ කරව.* (33 : 41-42)

තවත් තැනක මෙසේ විස්තර වෙයි : *ඔබගේ සිත්හී අවනත භාවයෙන් හා බියෙන් (සෙමෙන්) වැඩි ශබ්දයකින් තොර හඬින් උදය සවස ඔබගේ හිමි සිහි කරව. (මුහු) අමතක කර කෙනෙකුගෙන් කෙනෙකු ලෙස ඔබ නොවව.* (7 : 205)

තවද මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූහ : 'ඔබගේ නිතරනිතර කුර්ආනය පාරායනය කරන්න. එසේ පාරායනය කරන්නන් හට පරමාත්ථ දිනයේ එය රෙක මදාරු බවට පත් වන්නේය'. (මුස්ලිම් සහ අහ්මද්).

එතුමාගේ සම්බන්ධ තවත් සිද්ධියක් මෙසේ සඳහන් වේ. වරෙක කෙනෙකු මුහමමද් නබි (සල්) තුමා වෙත පැමිණ 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, ඉස්ලාම් දහමේ නීතිරීතින් දුෂ්කර එකක් ලෙසයි මට හැඟෙන්නෙ, මා සැමදා කළ හැකි පහසු දැමිටු ක්‍රියාවක් ගැන මට පහදා දෙන්නේ නම් වඩා හොඳයි' යනුවෙන් ඉල්ලා සිටියේය. එයට වක්තෘ මුහම්මද් තුමා, ඔබ සැම අවස්ථාවකම අල්ලාහ් දික්ර් කරමින් භාවණාවෙහි යෙදෙනු මැවන' යනුවෙන් පිළිවදන් දුන්හ. (තිර්මිදි)

පෙර සඳහන් මුහම්මද් තුමාගේ හදීස් සංකල්පනය අනුව, එතුමා විසින් පවසා දුන් පිළිවෙල අනුව අල්ලාහ් දෙවිඳු භාවණා කිරීම දෙයාකාරයක වේ. ඒවා මෙසේ වේ.

සුබ්හානල්ලාහි වල්හම්දු ලිල්ලාහි වලාඉලාහ ඉල්ලල් ලාහු වල්ලාහු අක්බර්' යනුවෙන් දික්ර් කිරීම වේ.

අනාවැසියා තමාට උවමනා අවස්ථාවන්හී සිතේ උද්වේගය සහ අවිනිශ්චිතභාවය අනුව තම උවමනාවන් සහ විස්තර කර පව්සමා අයැදීම වේ. ඒ ගැන පැහැදිලි කරමින් අල්කුර් ආනය තුලින්ම නිදසුනක් වශයෙන් පෙර දිනක කීකරු අනාවැසියෙකු තම වරද නිසා පව් සමා ඉල්ලා සිටි අයුරු අල්ලාහ් මෙසේ පවසයි: *අපගේ ස්වාමිනි, අප දෙදෙනා අපටම වරද කර ගතිමු. ඔබ අපගේ පව් සමාව කර*

*අපට දයාලු නොවූයේ නම් ඇත්තෙන්ම අප අලාභයට පත්වූ අයගෙන් වෙමු' යි දෙදෙනාම කීවෝය.* (7 : 23)

මේ විලසින් විවිධ අවස්ථාවන්හීදී අල්ලාහ්ගෙන් පවසමා අයැදීම, පිරිසිදු සිතින් මහු භාවණා කිරීම ගැන අවබෝධ නාත්මකව පැහැදිලි කරන මුහම්මද් තුමාගේ හදීසය තුලින් සහ එතුමාගේ ජීවිතය තුලින් විස්තර වන්නේ අපූරු අන්ද මටය. ඒවා අවස්ථාවෝචිත විවිධ කෙටි සහ දීර්ඝ පදවහරෙන් හෙබි ඒවාය. දික්ර් සහ භාවණාවනක්හී හෝ ප්‍රාර්ථනාවන්හී හෝ නිරත වන කළ ඒ පිණිස මිනිසාගේ සිත සහ වචන සම්මිශ්‍රණය වී තිබිය සාන්තදාන්ත විය යුතුය. නින්දට යන කළද, නින්දෙන් නැගිටින කළද, උදේ සවසද, අන්නපාන කරන කළද, ඇඳුම් අඳින කළද, නිවසට ඇතුල් වන කළ, නිවසින් පිටවන කළද, ගමණක් පිටත්වන විටද, වාහනයක නගින කළද, ලෙඩරෝග අවස්ථාවන්හීද, රෝගීන්ට සුවය පතාද, කිහිඹුම් ගිය කළද, උපවාස අවසන් කරන විටද, සභාවක් රැස්වී වෙන්වන කළද, භීෂණය සහ කරදර වැනි අවස්ථාවන් වැනි සෑම අවස්ථාවකදීම උසුරන ප්‍රාර්ථනාවන් වන අතර ඒවා පවසා දුන්නේ වක්තෘ මුහම්මද් තුමාය. මුහම්මද් නබි (ෂල්) තුමා තම ජීවිතය කාලය තුල අඛණ්ඩය උසුරා ආ තවත් සමහර ප්‍රාර්ථනාවන්ද වේ.

එසේම කරන භාවණාවන් සහ අල්ලාහ් සිහිකිරීම් වලින් අති උසස් භාවණාවන් සිහිකිරීම් වන්නේ සිත සහ දිව එක්ලස් කර පිරිසිදු චේථනාවෙන් කරන ඒවාය. භාවණාවක, ප්‍රාර්ථ නාවක යෙදෙන කළ එහිමෙහි තම අවධානය යොමු කරමින්ද තමා උසුරන දෙයටත් දිව සහ මනසටත් කිසිදු සම්බන්ධයක් සන්ධියක් නැතිව එවැනි කට යුත්තක යෙදීම නියම ප්‍රති ඵලයක් ගෙන දෙන්නේ නැත. එහෙයින් අපගේ චින්තන සහ ක්‍රියාවන් ලෞකික හේතුවක් උදෙසා යෙදෙමින් සිටින කළ

දිව පමණක් හසුරුවා කරන භාවණාවන් කිසිදු ප්‍රතිඵලයක් ගෙන නොදෙන්නේය. එසේම කෙනෙකු තම ආශාවන් සහ පිනවන විය යුතු ඉන්ද්‍රියයන් ඒ නියමිත කාලය තුල පම ණක් මර්ධනය කරමින් අනිවාර්යය දෛනික වන්දනාමාන, විශේෂ රෑ කාල වන්දනාමාන, සහ උපවාස ශීලය වැනි කටයුත්තන්හී නිරතවන කළ ඔහුගේ මුළු දේහයම වන්දනා මානයේ යෙදුනු ලෙසද, තමා සතුව ඇති සේසත ගණනය කර ඒවාට අයත් සකාත් නම් නිසිලෙස ගෙවාන කළ, ඔහු තමා සතු සේසතෙන් මසුරු කමෙන් තොරව දෙවිඳු වන්දනාමාන කළ කෙනෙකු ලෙසද වන්නේය.

මෙය පැහැදිළිව විස්තර කරන ඉස්ලාමීය විද්වතුන් දෛනික දේව නැමදුම සහ උපවාස ශීලය වැනි වන්ද නාමානයන් කාය පද්ධතිය සම්බන්ධ වන්නාමානයන් ලෙසදල අනෙක් ඒවා සේසත් සම්බන්ධ වන්දාමාන ලෙසද වෙන්කර විස්තර කරයි. ඉස්ලාම් දහම පවසන කුමන වන්දනාමානයක් හෝ වේවා දැම්වූ ක්‍රියාවන් හෝ වේවා ඒවා කරන විට නියයත් නම් පිරිසිදු චේථනාවෙන් සහ මුහම්මද් තුමාගේ ආදර්ශ මුල් කර ගෙන කළ යුතු බව පවසා සිටියි. එ මැයෙන් බලන කළ මනා දැනුමක් නැති කෙනෙකු හෝ සිහිබුද්ධි යෙන් මන්ද කෙනෙකු කරන වන්දනාමානයන්ද මත්ව සිටින කෙනෙකු කරන වන්දනාමනයන්ද වන්දනාමනයන් ලෙස ඉස්ලාම් දහම කිසිසේත් නොපිළිගනී. ඒ අදහස සාක්ෂාත් කරනු වස් බීමත්කමෙන් මත්ව දේව නැමදුමේ යෙදෙන් නෙක් ගැන අල්කුර්ආනය මෙසේ අවවාදාත්මකව පවසයි : *ඔබ පවසන්නේ මෙයයයි (නො) වැටහෙන (මතෙන් පසු වන) නෙක් (සලාත්හී නිරත නොවව).* (4 : 43)

තවද විවාන හදමනසෙන් ඒ ගැන අවබෝධයකින් ඉස්ලාම් දහම පිළිගත් කෙනෙකු, අන් අය ඒ සත්‍ය මාවත කෙරෙහි

ඇමතීමෙන්ද ඔහුන්ට හොඳ දේ ගැන වටහා දී විස්තර කර, නරක සහ දුදන ක්‍රියාවන් ගැන වටහා දී එයින් ඉවත් කිරීමෙන්ද අල්ලාහ් ප්‍රතික්ෂේප කර දහමට විරුද්ධව නුවුවමනා අන්දමින් කැරළි ගසන්නන් සහ කුහකයන්ට විරුද්ධ සටන් කිරීමෙන්ද මෙම සත්‍ය දහම ප්‍රචලිත වන අයුරු ඇති විය හැකි බාධක නොයෙක් අයුරෙන් කටයුතු කිරීමෙන්ද තම වේලාව සහ ශ්‍රමය යොදා අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කරන කෙනෙකු ලෙස කටයුතු කරන්නේය.

හජ් සහ උම්රා වැනි කටයුත්තන් නිමකිරීම පිණිස නිව සින් පිටවී යැමද, ඉස්ලාම් දහමට පටහැනි නීතිරීති සහ ප්‍රතිපදාවන් ඇති රටක ඒ රටේ ඉස්ලාම් දහම පිළිපදින්නට බැරි කරදරකාරි මර්ධනකාරි අවස්ථාවක් වූ කළ ඒ රටින් පිටවී තම ආගමික කටයුතු පහසුවෙන් කිරීමට හැකි රටක් ප්‍රදේශයක් කරා ගමන් කිරීමද එසේම තමාට සහ අනුන් හට ප්‍රයෝජන විය හැකි දැනුම ලබාගනු වස් තම පවුලේ, කුඩුම්ප සහ ගමේ සාමාජිකයන්ගෙන් වෙන්වී යැමද මහු අල්ලාහ් දෙවිඳු බියබැතියෙන් වන්ද නාමන කරමින් පසුවන වන්දනා මානයක් ලෙස පිළිගැනේ.

වැදගත් වන්දනාමාන

අප සඳහන්කළ සියළු කටයුතු අවංකව පිරිසිදු චේථනාවෙන් වක්තෘ මුහම්මද් නබි තුමාගේ අනුශාසනාව අනුව අල්ලාහ් උදෙසා කරනවිට එවා අල්ලාහ් අභියස වන්දනාමානයන් ලෙස ප්‍රත්‍යක්ෂ වේ. එසේනම් අල්ලාහ් අභියස ප්‍රියශීලී, උසස් ලෙස පිළි ගැනෙන වන්දනාමාන කුමක්දැයි අප තුල ඇති වන කුකුස නොකිව මනාය. ඒ වන්දනාමා නයන් කුමක්ද, අල්ලාහ් අභියස ඒවායේ තත්ත්වය කුමක්ද යන්න දැනගැනීම අපගේ පරම යුතුකමකි.

අප පෙර මතු කළ පැනයට සුදුසු පිළිවදන කුමක්ද යන්න අල්කුර්ආනය සහ හදීස් මනාව අධ්‍යයනය කර පෙර විසූ ශ්‍රද්ධාවන්ත ඉස්ලාමීය විද්වතුන් පැහැදිලිව කරුණු ඉදිරිපත් කර ඇත. එසේ විස්තර කළ කරුණු සහ අදහස් ගැන මනාව අධ්‍යයනය කළ විත්වත් ඉමාම් ඉබ්නුල් කයියුම් ජව්සි තුමා තම අදහසද පැහැදිලිව මෙසේ විස්තර කරයි. 'ඔබම වඳිමු ඔබගෙන්ම උදව් උපකාර පතමු' යනුවෙන් අල්කුර්ආනය විධානය කරන ආඥාව පිළිගෙන ඒ අනුව අල්ලාහ් වන්ද නාමාන කරන්නන් තමා කරන වන්දනාමානයන්හි අල්ලාහ් ප්‍රියමනාප වන වන්දනාමානය කුමක්ද යනුවෙන් ඉස්ලාමීය විශ්‍රැත විද්වතුන් අදහස් දක්වන කළ සිව් කොන්දේසි යටතේ විස්තර කරති. ඒ කොන්දේසි කුමක්ද යන්න දැනගැනීම වන්දනාමානයෙහි නිරත වන අපට ඵලදායී වනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

විසින් ඉටුකිරීමට මදක් අපහසු වන්දනාමානයන් අල්ලාහ් අභියස ප්‍රිමනාප අධික වන්දනාමාන වන්නේය

මෙම පළමුවන කොටසේ අය විස්තර කරන අයුරු අල්ලාහ් අභියස විශාල පිනක් ගෙන දෙන මහු ප්‍රියවන වැඳුම්පිදුම් කුමක් වේ නම් එය කිරීමේදී විශාල පරිශ්‍ර මයක් හෝ කරදරයකට මුහුණුපාමින්නට සිදුවන ඒවාය. තමා ඒ වන්ද නාමනය කිරීමට පෙළඹෙන්නේ නම් ඒ වෙනුවෙන් විශේෂ උනන්දුවක්ද වෙහෙසක් සහ පරිත්‍යාගයක්ද දැරිය යුතුය. මෙසේ විවිධ බාධක මැද්දේ කරන වන්දනාමාන අල්ලාහ් විසින් සතුටෙන් උසස් ලෙස පිළිගන්නා වන්දනාමායන් බව අධිෂ්ඨාන කරගෙන පසුවන කොටසක්ද වෙයි. එසේ කරන වන්දනාමානයන් තම ආශාව සහ ලෞකික උවමනාවෙන් එපිට ඒවායෙන් ඉවත් වී කළ යුතුව ඇත. එහෙයින් තම සියළු ආශාවන් සහ ලෞකික උවමනාවන් සියල්ල දමනය

කර, ඒවායෙන් ඉවත්වී කරන වන්දනාමාන අල්ලාහ් විසින් අනුමත වී ඇත යන්නෙහි මවුන් සතුටු වෙති, ප්‍රීති වෙති.

එසේම ඒ වන්දනාමාන කිරීමට පෙළඹෙද්දී කුමණ පරිශ්‍රමයක් කරද්දෝ ඒ විලසින්ම කිසිදු අඩුවකින් තොරව එයට ප්‍රතිවිපාකද ලබෙන බව තර්ක කරමින් කිරීමට විඩාවක් ඇති විය හැකි දැම්වූ ක්‍රියාවන් තෝරා ගෙන කටයුතු කිරීමට පෙළඹෙති. මවුන්ගේ ඒ අදහස සාධක කරනුවස් වක්තෘ මුහම්මද් නබි තුමා විසින් පවසන ලදැයි කියන බෙලහීන කියමන්ද ඉදිරිපත් කරති. (නමුදු අල්ලාහ් දෙවිදු තම අනවැසියන් හට පහසුව ප්‍රියවනවා මිස දුෂ්කරයක් ගැන කිසිවිටෙක කැමැති නොවෙයි යනුවෙන් අල්කුර්ආනය පැහැදැලිව කියා සිටී) ඉස්ලාම් දහමේ කරන්නට බැරි වන්දනාමානයක් හෝ ක්‍රියාවන් හෝ නැත. අවස්ථාව කාලය අනුව කළ යුතු වැඳුම් පිදුම් වේ. සකාත් වැනි කුසල් මුදල් නැතිව කරන්නට බැරිය. එසේම ප්‍රමාණවත් මුදල් තිබුණද ඒ ගමන වෙනුවෙන් හොඳ ශරීර සෞඛ්‍යයක් නොවන්නට හජ් ඉටුකිරීමට නොහැකිය. මොවුන් මෙසේ ඉටු කිරීමට දුෂ්කර වන්දනාමානයන් තෝරා ගෙන, තම ආත්මය ආරක්ෂා කර තම ආශාවන් දමනය කර ගත් බව උදම් අනමින් තමා ගැන ප්‍රසිද්ධ කර ගන්නට දරන්නේ අති මහත් පරිශ්‍රමයකි. ස්වභාවයෙන්ම මිනිස් සිත සහ කය කුසීතකමෙන් පිරී බොහෝවිට තමාට අයත්, කළයුතු ඒවා පවා පැහැර හරිමින් ක්‍රියා නොවී සිටීමට උත්සාහ කරන්නා සුළු වේ. මිනිසා දුෂ්කර ඒවා තෝරාගෙන ඒවා කිරීමට පෙළඹෙන විට මවුන්ගේ සිත උනන්දුවෙන් ක්‍රියා කරන්නට පටන් ගන්නේය. එහෙයින් එසේ ක්‍රියා වන්නට නම් දුෂ්කරයන් හට මුහුණ දිය යුතුය යන අදහසින් පසුවෙති.

**2 තපෝ ජීවිතය**

ලෞකික ජීවිතයට ඇලුම් නොකර ඒවා කෙරෙහි වූ බාහිර ලක්ෂණයන් කෙරෙහිද සිත යොමු නොකර ඒ ආශාවන් මැඩ ගෙන ඒවා ගැන වැඩි උනන්දුවක් නොකර ඒවායෙන් ඉවත් වී වන්දනාමාන සහ එයට අදාල ඒවා කෙරෙහි පමණක් තම මුළු චින්තනය සහ ඇල්ම යොමු කර කටයුතු කිරීම අල්ලාහ් ඉතා ප්‍රියවන වන්දනාමාන යනුවෙන් මේ කොටසට අයත් වන අය පවසති. තවද ඒ අදහස ගැන වර්ණනා කරමින් කරුණු ඉදිරිපත් කරන්නන් දෙකොටසකට බෙදිය හැකිය.

හුදී ජනයන් : ලොවේ ඇති අලංකාර සහ භුදෙක් එහි තාවකාලික ජීවිතය අනිත්‍ය වන අතර එහි ඇත්තේ මිනිසා සහ මිනිස් සිත නොමග යවන සුළු ස්වභාවයකි. එහෙයින් ලොව සහ එහි අලංකාරයෙන් ඉවත් වී තබෝ ජීවිතයක් තෝරාගෙන කටයුතු කිරීම තම දැමිටු ක්‍රියාවන් පහසුවෙන් කිරීමට එකම මග යනුවෙන් පවසමින් අනුන්ද ඒ කෙරෙහි උනන්දුවක් ඇල්මක් අති කරන්නට මොවුන් දරන්නේ අති මහත් උත්සාහයකි. එසේම ඒසා තපස් ජීවිතයක් ගතකිරීම ඥානය ලබාගැනීමට සහ සිත් එක්තැන් කර ගෙන ආගමික වන්දනාමායන්හී සෘජුව තියැළීමට පහසු මගක් ලෙසද පිළිගනිමින් ඒ අනුව කටයුතු කරන්නට උත්සුක වෙති.

හුදී ජනයන්ට වෙනස් අය : පැවිදත්වය යනු තම සිත සම්පූර්ණයෙන්ම අල්ලාහ් වෙත පවරා ඔහු වෙනුවෙන් වූ කාර්යයන් සෘජුව කරන අතර තම සියළු කටයුතු ඔහු වෙතම පවරා තම වැරදි සහ අදැමිටු ක්‍රියාවන් පිණිස ඔහු ගෙන්ම පව් සමා අයැද ඔහුගේ මනාපය පමණක් අපේක්ෂාවෙන් කටයුතු කිරීම වේ. ඒ අදහස අනුව අල්ලාහ් සදා තමා ගැන අවධානයෙන් පසුවන බව පවසමින් ඒ බිය සිත්සතන තුල පාෂාණිභූත කරගනිමින් තම සිත සහ කය

කිසිදු දෝලනයකින් චලණයකින් තොරව අල්ලාහ් දෙවිඳු සමග යා කර ඔහු වෙත හැකි අයුරෙන් ළං වී තම සිත සහ දිවද ඔහු භාවණා කිරීමෙහි අඛණ්ඩව යොමු කර කටයුතු කිරීම වන්දනාමාන යනුවෙන් කියති. මේ අදහස දරන්නන්ද දෙකොටසකට වර්ග කළ හැකිය.

ඉස්ලාම් දහම වන්දනාමානය උදෙසා සමහර නීතිරීති සම්පාදනය කර ඇත යනුවෙන් වටහා ගත් කළ ඒවා තම ජීවිතය තුල සාක්ෂාත් තරගනීමට වෙර දරන්නේ අතිමහත් පරිශ්‍රමයකිනි. මොවුන් තමන් අල්ලාහ් කෙරෙහි සම්පූර්ණ යෙන්ම යාකර ගැනීමෙන් මදක් වැළකී ලෞකික කම්සැප සුවය කෙරෙහි ලොල් වී එහි අලංකාරයන් කෙරෙහි ප්‍රියමනාපව සිටියද අල්ලාහ්ගේ අනුමත කිරීම සහ වළකීම පිළිගනිමින් ඒවා තම වන්දනාමානයන් තුලට ඇතුලත් කරමින් කටයුතු කිරීමට තරමක උනන්දුවක් දක්වති.

ඔවුන්ගෙන් මදක් වෙනස්වූ කොටසක් : මොවුන් තම සිත සම්පූර්ණයෙන්ම අල්ලාහ් හා යාකර ගත් අය වේ. ගැඹුරු ලෙස අල්ලාහ් භාවණා කිරීමෙහි රැඳී සිටින මොවුන්ගේ සිත් අවධානය ලෞකික සම්භවයන් කිසිවකින් වෙනස් කළ නොහැකි අන්දමින් සම්මිශ්‍රණය වී ස්ථිරසාරව පවතී. තම වන්දනාමාන කටයුත්තන්හී නියළෙන විට ඔවුන්ට උවමනා වන අනෙකුත් ශරීර කෘත උවමනාවන් වැනි දේ කෙරෙහි පවා ඇල්මක් දක්වන්නට උනන්දු නොවී සිටීම මොවුන්ගේ විශේෂ ලක්ෂණයකි. මොවුන් දෙකොටසකට බෙදිය හැකිය. අල්ලාහ් හා නොගිළිහෙන තම සිත තදින් යා කර ගතු වස් විටින්විට වෙනස්වන ගතියෙන් වූ දෛනික කිසිදු අනිවාර්ය හෝ උපරි වන්දනා මානයන්හී තම සිත යොමු නොකරති. මන්දයත් එසේ කිරීමෙන් තම සිත අල්ලාහ් වෙතින් ඉවත් වී තම භාවණාවද විසන්ධි වනු ඇතැයි සිතති.

අල්ලාහ් විසින් අනුමතවූ අවසන් කළ යුතු යම්යම් ආඥාවන් සහ අණපනත් හැකි අයුරු ඉටුකළද තම සිත සහ චින්තනය අල්ලාහ් කෙරෙහි සදා රඳවා ගනු වස් මුහම්මද් තුමා විසින් ආඥා කර අනුශාසනා කර ඇති කරුණු සහ යුතුකම් උදාසීන කර අල්ලාහ් හා තමා යා කර ගැනීම වෙනුවෙන් වූ සමහර ප්‍රාර්ථනාවන් සහ භාවණාව සම්බන්ධ කරුණු සහ දැනුම කෙරෙහි තම සිත වැඩි වැඩියෙන් යොමු කරන්නට කරන උනන්දුව අපමණය.

මෙම සමූහයට අයත් සමහරෙක් තමන් දන්නා තම ප්‍රධාන ශාස්ත්‍රාඥයෙකු වෙත හෝ ගුරුවයෙකු වෙත හෝ ගොස් 'මා අල්ලාහ්ට කිට්ටුවී ඔහුසමග සම්මිශ්‍රණ වී ඔහු වෙතින් මගේ හදමනස සහ කය ඉවත් නොවන විලසින් භාවණාවෙහි යෙදී සිටින කළ දෛනික දේව වන්දනාව පිණිස දේවස්ථානයේ අදාන් ඇමතුම පිළිගෙන දේවනැමදුම කිරීමට දේවස්ථානයට විට අල්ලාහ් හා වූ මගේ තද බැඳීමෙන් වෙන්වන්නට හැකිය. නමුදු දෛනික වන්දනා ඇමතුම පිළිගෙන දේවස්ථානයට නොගොස් මගේ භාවණාවේ අකණ්ඩව පසු වන කළ මගේ භාවණාවේ විසන්ධියක් හෝ කඩඉමක් හෝ ඇති වන්නේ නැත. එහෙයින් මා පිළිපැදීමට දෙවිඳුගේ ප්‍රියමනාපය ලබා ගැනීමට මේ මගෙන් හරිමග කුමක්ද? යි විමසන්නට වූහ. එවිට ඒ ශාස්ත්‍රාඥයා 'ඔබ අල්ලාහ් දෙවිඳුගේ සිහසුනට යටත්ව පසු වන්නෙක්. දෛනික වන්දනාමානය පිණිස අදාන් පවසන කළ නැගිට සිට ඒ ඇමතුමට ප්‍රතිඋත්තර දී පසුව නැවතත් ඔබගේ අවස්ථාවටම හැරෙව්. මන්දයත් අල්ලාහ් වෙනුවෙන් ඔබ කරන භාවණාව තුලින් ඔබ ඔහු හා එක්වීම ඔබ කයේ සහ ආත්මයේ උවමනාවන් උදෙසා නිම කරන අයිතිවාසිකමකි. අල්ලාහ්ගේ ආඥාව හා බැඳුණු අදාන් හට ප්‍රති උත්තර දීම අල්ලාහ්ට අයත්වූ අයිතිවාසිකමකි යනුවෙන්

පවසා, අවසානයේ තම ආත්මයට කළ යුතු යුතුකම තම දෙවිඳුට කළයුතු යුතුකමට වඩා උසස්යැයි සළකා එය තෝරා ගන්නේ කවරෙක්ද හෙතෙම අල්කුර්ආනය 'ඉයියාක නඃබුදු' (ඔබමයි වන්දනාමාන කරන්නේ) යනුවෙන් පවසන සමූහයට අයත් කෙනෙකු නොව යනුවෙන්ද පැවසූහ.

අල්ලාහ් අභියස වැදගත් වන්දනාමන අනුන්ට ප්‍රයෝජන දේ කිරීම වේ

මෙසේ පවසන්නන් තුන්වන පාර්ශවයට අයත් අය වේ. මොවුන්ගේ අදහස පරිදි වන්දනාමානයන්හි උතුම් වන්දනා මානය වන්නේ තමා කරන හුදුමහත් ක්‍රියාවන් සහ අදහස් සියල්ල තමාට පමණක් නොව අනුන්ටද ඵලදායී එකක් විය යුතුය යන්නයි. එසේ කිරීම එය තමන් අල්ලාහ් වෙනුවෙන් කරන ඔහු විසන් ඉතා උසස් අන්දමින් අනුමත කරන අති උසස් වැදගත් වන්දනාමානය යනුවෙන් ඔහුන් අර්ථකථනය කරති. ඔවුන්ගේ අදහස් අනුව දුගීන්ට උදව් උපකාර කිරීම, මිනිසුන්ට උවමනා කාලෝචිත අවශ්‍ය තාවයන් හැකි උපරිම අයුරින් සපුරාලීම, ඔවුන්ට තම සේසතෙන්, පහසුකමෙන් තමන්ට සපුරා ගන්නට නොහැකි කටයුත්තන් තම බලම හිමය සහ තත්ත්වය භාවිතා කර කර දීම, හොද සහ යහකම්හී නිරත වන ලෙස සාමුහිකව ඔවදන් දීම වැන්නන් වන්දනාමානයන්හී උතුම් ඒවායැයි තීරණය කර ගනිමින් කටයුතු කරමින් ඒ අභිමතය අනුව කල් ගෙවති. ඔවුන්ගේ ඒ මතය සහ අදහස මුහම්මද් නබි තුමාගේ මතු සඳහන් ඔවදන නියෝජනය කරන බවද ඔවුන් නිරසරව පවසයි. 'අල්ලාහ් දෙවිඳුගේ නිර්මාණයේ ඇති සියල්ල අල්ලාහ්ගේ කුඩුම්පයේ අයයි. ඔවුන්ගෙන් අල්ලාහ් වඩාත් ප්‍රිය වන්නේ ඒ කුඩුම්

පය තුල ඇති අයට ඵලදායි අන්දමින් කටයුතු කරන්නාය'. (අබූයඃලා)

ඒ අදහසේ පසු වන්නන් 'අවංකව වන්දනාමානයේ පසු වන කෙනෙකු තමා වෙනුවෙන් පමණක් තම ගැලවීම වෙනුවෙන් පමණක් පින් කරගන්නේය, මෙයට ඉදුරාම වැද්ධය විවෘත සිතින් තම වන්දනාමාන කටයුතුවල නිරත වන්නා තමාටත් ප්‍රයෝජන වන අයුරු කටයුතු කරන අතර ඒ කටයුත්ත තුලින් අනුන්ටත් ඵලදායි අන්දමින් කටයුතු කෙරේ' යනුවෙන් ද විස්තර කරති. එසේ නම් මේ ඔවුන්ගේ අදහස් උදහස් සන්සන්දනය කර බලද්දී මේ දෙපිරිසෙන් උතුම් සහ උසස් අය කවරෙක්ද? මේ අදහස සළකා බලන කළ ප්‍රඥයෙකු උගතෙකු ආගම දැහැම ගැන මනා දැනුමක් ඇත් නෙක් එය අනුන් හට බෙදා දෙන්නෙක් වන්දනාමාන කරන්නාට වඩා ඇති වැදගත් කර පවසන කළ 'අමරේ තරු පෙල අතර පුන්සඳට කුමන වැදගත් බවක් වේදෝ ඒ සමාන වැදගත්කමක් වන්දනාමාන කරන්නන් අතර පසුවන ඒ ප්‍රඥා වන්තයාට තිබේ' යනුවෙන් විස්තර කරති.

ඔවුන්ගේ ඒ අදහස තවත් තර වනුවස් ඔවුන් මතු සඳහන් සම්භවය උපුටු දක්වන්නට ඉදිරිපත් වෙති. වරෙක මුහම්මද් නබි තුමා අලී බින් අබීතාලිබ් අමතා 'ඔබගේ මග පෙන්වී මකින් කෙනෙකු සුමගට පත්වන්නේ නම් ඔබට රතු මටු වන් සියයක් ලැබෙනවාට වඩා අගනේය' යනුවෙන් දෙසූහ. මුහම්මද් තුමා මේ ඔවදන ඔවුන්ට පහදා දුන් හේතුව ගැන මදක් විවෘතව සිතා බලද්දී මිනිසා සදා අනුන්ට ප්‍රයෝජනවත් අන්දමින් කටයුතු කළ යුතුය යන්න වටහා දීමේ අදහසින් බව ඔවුන් තර්ක කරති. මුහම්මද් තුමාගේ තවත් කියමන ක්ද මෙසේ වෙයි : 'යමෙකු නවකෙකු යහමග කෙරෙහි අමතන්නේද ඔහු ඒ ඇමතුම පිළිගෙන ඒ අනුව කටයුතු

කරමින් පසුවන තෙක් අල්ලාහ් කුමන පිනක් ඔහුට ලබා දෙයිද ඒ හා සමාන වූ පිනක් ඇමතූ කෙනාටද ලැබෙනු ඇත. එසේ ලැබුණද පින් කළ තැනැත්තාගේ පිනෙන් කිසිවක් අඩු වන්නේද නැත'. මුහම්මද් තුමාගේ මේ මුදු වදනද මිනිසා කවදත් හොඳ කටයුතුවල නිරතවිය යුතු බව සක්සුදක්සේ පැහැදිළි කරන බව ඔවුන් විස්තර කරති.

එසේම මුහම්මද් තුමාගේ තවත් ඔවදනක 'අල්ලාහ් සහ ඔහුගේ කීකරු සුරදූතයන්ද, මිනිසුන්ට යහපත් දේ ගැන පහදා දෙන්නන්ට සලවාත් හෙවත් සුභාශිංසනය කරති' යනුවෙන්ද, තවත් කිමනයක උගතුන්ගේ ගුණ වර්ණනා කර පවසන කළ මෙසේද පැවසූහ : 'අඹරේ පසුවන්නන්ද, දෙරණේ පසුවන්නන්ද, මහසුයුරේ පසුවන මත්සයන්ද, මහ පොළොව විද එහි වසන කුහුඹුවන්ද දහම හදැරූ පතණ්ඩියන් වෙනුවෙන් පව් සමා අයැදින්නේය'.

මුහම්මද් තුමාගේ තවත් කියමනක් : 'වන්දනාමාන කරන් නෙකු ජීවිතක්ෂයට පත් වන්නේ නම් ඒ සමග ඔහුගේ දැමිටු ක්‍රියාවන් කරන අවස්ථාවන් සම්පූර්ණයෙන්ම අවසන් වන්නේය. නමුදු යමෙකු මියදෙන්නට පෙර අනුන්ට ප්‍රයෝජන වන අන්දමින් නිම කර තබා යන සෑම දැහීම ප්‍රයෝජනය පවතින තාක් කල් එය වන්දනාමානයන් ලෙස පසුවනු ඇත'.

මිහිපිට බිහිවූ වක්තෘ වරුන් සහ දිව්‍යප්‍රසාදි වරුන්, අල්ලාහ් විසින් ඒ අය මිහිපිටට නියෝජිතයන් ලෙස පත් කරන විට ඔවුන් පමණක් දැමිටුකමිහි නියැළී කටයුතු කිරීම පමණක් නොව සමාජය තුල ඇති දුදනද සුඩ කර ඔවුන්ට යහමග ගැන වටහා දෙන පිණිස වූ වැදගත් වගකීමක්ද නියම කළේය. ඒ අර්ථසාරයෙන් මුහම්මද් තුමාගේ සමයේ ජීවත් වූ එතුමාගේ සමහර කළ්‍යාණ මිත්‍රරයින් තම ජීවිතයේ මහත් පරාසයක් හුදෙක් වන්දනාමාන පිණිස පමණක්

වෙන්කර ගැනීමට වෙර දරු කළ එසේ සීමා නොකර සමාජයටද සෙතක් වන අයුරෙන් ජීවිතය හැඩ ගස්වා ගත යුතු බව මුහම්මද් නබි (සල්) තුමා මවදන් දුන්හ. මන්දයත්කෙනෙකු අල්ලාහ්ට කීකරු වී ඔහුගේ අණ පනත්වලට අනුගතව තමාගේ ගැලවීම වෙනුවෙන් පමණක් ජීවත්වීමට වඩා තමාත් ජීවත්වී අනුන්ටද පිළිසරණ වන අයුරු ජීවත්වීම සුවිශාල ප්‍රගතියක් ගෙන දෙන ජීවිත රටාවක් බව මුහම්මද් තුමා විසින් පෙන්වා දුන් ආදර්ශමත් ජීවිත රටාවේ මුඛ්‍ය අභිමතාර්ථයකි.

අවස්ථාවෝචිත වන්දනාමනය : මේ අදහසින් අවස්ථාවක් ලැබුණු කළ පමණක් වන්දනාමාන කටයුතු වල නිරත වීම සැහේ යනුවෙන් පැවසීම සිව්වැනි කොටසට අයත් අය වේ. මොවුන්ගේ අදහස අනුව ඒ ඒ අවස්ථාවට උචිත වන්දනාවන් කුමක්දෝ ඒවාහී නියැළීම, අල්ලාහ් ප්‍රිමනාප වන වැදගත් වන්දනාමාන ලෙස පවසති. එයට උචිත හේතු කාරණා විස්තර කරණ විට ජිහාද් කරන්නට අනිවාර්යය වූ අවස්ථා වක් උදා වන්නේ නම් උපරි දේව නැමදුම් සහ උපවාස ශීලයන්ද අත්හැර දමා ජිහාද්හී යෙදිය යුතුය යන අයුරෙන් කටයුතු කිරීම වඩා හොඳ වන්දනාමානයක් ලෙස විස්තර කරති.

එසේම සත්කාරයට සුදුසු ආගන්තුකයෙක් නිවසට පැමිණ කළ තම පවුලේ අයට කළයුතු යුතුකම් ලිහිල් කර පැමිණි අමුත්තාට මනා අන්දමින් ඇපඋපස්ථාන කිරීමද, තමා නිදි නැතිව පසුවන කළ දේව වන්දනයෙහි යෙදීම, අල්කුර්ආනය පාරායනය කිරීම, ප්‍රාර්ථනාවන්හී නිරතවීම, අල්ලාහ් දික්ර් හෙවත් දෙවිඳු ස්තෝස්ත්‍ර කිරීම, පව්සමා අයැදීම වැනි වන්ද නාමානයන්හී නියැළීමද කෙනෙකු නොදන්නා කරුණක්, විෂයක් ගැන ප්‍රශ්න කිරීමේදී ඒවා කියා දී පැහැදිලි කිරීමද, නුගතුන්ට අධ්‍යාපන කටයුත්තන්හී පිහිට වීමද, දෛනික

දෙවනැමදුම පිණිස ඇමතු කළ එයට පිළිවදන් දීමද, දෛනික පස්වතා නැමදුම පිණිස කල්වේලා ඇතිව මස්ජිදයට ගොස් ඒවා මනා ලෙස ඉටු කිරීමද, මෙවන් අනෙකුත වන්දනාමානයන් යුතුකම් අවසථාවෝචිතව ඉටුකිරීම වැනි කටයුත්තාන් ඉතා හොඳ වන්දනාමානයන් ලෙස විස්තර කරති.

පෙර සඳහන් කළ අයුරු කළයුතු කටයුතු ඒ ඒ වේලාවෙහි නොපමාව ඉටු කරන අතර උවමනාවන් ඇති අයට හැකි අයුරෙන් මුදල් වැනි උවමනා සම්පත් මගින් උදව් උපකාර කිරීමද, අල්කුර්ආනය පාරායනය කරන විට අල්ලාහ් තම පරමාධිපත්‍ය විධායක නීතිරීති ආඥාදායීව පවසනවා යනුවෙන් වූ ස්ථිර අධිෂ්ඨානයකින් හදමනස චින්තනය සහ අවධානය එකතැන් කර හැකි අයුරෙන් එහි අර්ථය සහ අදහස වටහා ගන්න වෙර දැරිය යුතුය. එසේම ඒ අර්ථානුසාරයෙන්ම හැකි අයුරින් තම දිවි මගේ ඒ නීතිරීතීන් සාක්ෂාත් කිරීමට උත්සාහ කිරීමද, හජ් කටයුත්ත නිම කරන්නට උත්සාහ කරන්නන් එහි නවවන දින වන අරෆා දිනයේදී උප වාස ශීලයේ නොයෙදී අරෆා මිටියාවතේ එක් වී පහත් අවංක සිතෙන් අල්ලාහ් සිහිකිරීම ස්තෝස්ත්‍ර කිරීමද, පශ්චාත්තාපවී පවසමා අයැදීම වැනි කටයුතුවල යෙදීමද, දහවන දිනයේ වැඩිවැඩියෙන් අල්ලාහ් සිහි කිරීම පිණිස තක්බීර් වැනි කටයුත්තාන්හී නිරතවීමද වැනි කටයුත්තාන් කාලෝචිත උසස් වන්දනාමානයන් සණයෙහිලා සැළකෙයි.

තවද රමළාන් මාසයේ අවසන් දින දහය ඉඃතිකාෆ් රැඳීම වෙනුවෙන් අධිෂ්ඨාන සහගතව පිරිසිදු චේථනාවෙන් දේවස්ථානයේ රැඳී ඒහි වන්දනාමාන කටයුතුවල යෙදෙන අතර තම දැනුම වඩවා ගැනීම පිණිස උනන්දු විය යුතුය. එසේම එහි පසුවන කල්හී තමාට හැකි අයුරෙන් අනුන්ටද දහම දැනුම ලබා දීමට උත්සාහ කිරීමද, අනෙකුත් දහමාශ්‍රිත

කටයුත්තන් හී තම අවධානය යොමු කිරීමද, රෝගාතුරයා බැහැදැක නිසිරිසි ගිලානෝපස්ථාන කිරීමද, එසේම මරණ කටයුතුවලට සහභාගිවීම, මලගිය ඇත්තා වෙනුවෙන් පව් සමා අයැදීම සහ මල ගෙදර බැහැදැක එහි අය සැනසිල්ලක් අස්වැසිල්ලක් වන ලෙස කතාබස් කිරීමද, යමෙකුට දුකක් කරදරයක් විත්තැහියක් ඇති වූ කළ ඇඟ පඹරා ගනු වස් එයින් ඉවත් නොවී ඔහු සමග එක්වී ඔහුගේ දුක් කරදර සහ මනැඑපාකම්හී හවුල් වෙමින් කටයුතු කිරීමද, එවාට ඇපඋපස්ථාන කරමින්ද, සැනසිල්ලක් වන අයුරින් ඔවුන්ට ඔවදන්දී කටයුතු කිරීමද උසස් සණයේ වන්දනාමානයෙහිලා සැළකේ. එසේම අනුන්ගේ දුක්කරදර සහ භාහිර කටයුත්තන්හී තම දායකත්වය දෙන්නා ඒ අවස්ථාවේ ඔවුන් හට වෙනත් දුක්කරදරවලට භාජනය නොකරද ඔවුන්ගේ සිත්සතන වැලපෙන අයුරු කටයුතු නොකර සිටීමට වගබලා ගැනීම, සමහර අවස්ථාවන්හී ඔවුන්ගේ සමහර ක්‍රියාවන් තමාට යම්යම් අකරතැබ්බක් කරදරයක් ඇති කළද ඒ වෙනු වෙන් උරන නොවී ඉවසිල්ලෙන් සන්සුනෙන් කටයුතු කිරීමද ඒ වෙනුවෙන් ඔවුන්ගේ සිත පැරෙන අයුරු උවදුරු වන අයුරු ප්‍රතික්‍රියා කිරීමෙන් වැළකී සිටීමද සත්‍ය විශ්වාස වන්තයෙකුගේ වැදගත් යුතුකමකි.

මෙමැයෙන් කරුණු වහා ගත් කළ අපට වැටහී යන්නේ දුෂ්කර වූවද සමාජ වැසියන්ගේ දුක්දොම්නස් සයන් සහ මනැඑපාකම්වලට අල්ප ප්‍රමාණයකින් හෝ දායක වීම එය තමාගේ යුතුකමක් නොවෙයි යනුවෙන් එයින් ඉවත් වී සිටීමට වඩා අගනේය යන්නය. එසේම තම හිතවතා, සහෝදරයා නොවන්නට පිටස්තරයෙක් කරනා නොමනා කට යුතු සහ අනෙකුත් නුසුදුසු ක්‍රියා වන් හට හවුල් නොවී ඒවාට පිටිවහල් නොවී එයින් ඉවත් වී සිටීමද සමාජ

ප්‍රගතිය උදෙසා කරන වන්දන මාතයක් ලෙස සැළකිය හැකිය. නොවන්නට ඔවුන් නොමනා කටයුතුවල නියැළෙන විට ඒවායේ ඇති දැමිටු කම කුසල සහ විත්තැහිය ගැන වටහා දී ඔවුන් ඒවා යෙන් වළකන්නට වෙර දැරීමද, තමා ඔවුන් සමග එක් වී සිටින විට ඔවුන් එවන් වැරැදි ක්‍රියාව න්හී නියැළීමට අකැමැති වනු ඇතැයි තමාට වැටහෙන්නේ නම් එවැනි අවස්ථාවන්හී ඔවුන්ගෙන් ඉවත්වී සිටීමට වඩා එක්වී සිටීමට වගබලා ගැනීම වඩා හොඳය. මන්දයත් එසේ ඔවුන් හා එක්වී සිටිනවිට ඔවුන් ඒ දුදන ක්‍රියාවෙන් ඉවත් වී සිටීමට ඇති අවස්ථා අපමණය.

එහෙයින් ඒ පාර්ශව්කයන් පවසන අයුරු කාලය අවස්ථාව කුමක් වූවද ඒ මොහොතේදී අල්ලාහ් කුමක් අපේක්ෂා කරන වාද ඒ අනුව කටයුතු කිරීම උසස් සණයේ වන්දනාමාන ලෙස වන්නේය. මේ දක්වා අප විසින් විස්තර කරන ලද සිව් කොටස් අනුව එහි තුන් වන කොටසේ අය එක්තරා වන්දනාමානයන්හී නිරත වන අය ලෙසද සිව්වැනි කොටස කුමන මාදිලියේ වන්දනාමානයක් වූවද එයට අවස්ථාව කාලය උදාවේ නම් ඒවා ඉටුකරන කළු එය හුදෙක් වන්දනාමයෙහි නිරතවන අය ලෙස සැළකිය හැකිය. මේ දෙකොටසේ අය ඔවුන් කරන්නට උවමනා දේ සුළුවෙන් හෝ අත පසු වූවද නොවන්නට වැරදුනද එවිට තමන් තම ඇදහිලි නිසිලෙස නොකළු බවට තමා විසින් ඉටුවිය යුතු යුතුකමක් පැහැර හැරිය අය ලෙසද තමා ගැනම සන්සන්දනය කර ගනියි.

හුදෙක් වන්දනාමාන කරන්නන් ඒ තුළින් තමා මෙන්ම අනුන්ද ඵලප්‍රයෝජන වන අයුරු කටයුතු කිරීමෙන් වළකී තමාට පමණක් එයින් සෙතක් අපේක්ෂා කරයි. වෙනුවට කුමණ අන්දමේ කටයුත් තක්වූවද එය ඉස්ලාම් දහමේ සංකල්පනය අනුව සුදුසු කටයුත්තක් නම්, එයින් අනෙක්

අයටද ප්‍රයෝජනයක් වේනම්, එය අල්ලාහ්ගේ ප්‍රියමනාපය සහ සමීපවීම ලඟා කර දෙන්නේ නම්, එවැනි අවස්ථාවක් කුමන තැනක ලැබුණද එය වහා ඉටුකිරීමට උනන්දු වෙයි.

මේ කොටසට අයත් අය සීමිත සීමාවක තමා විසින් තීරණය කරගත් ඇදහිලිවල පමණක් නිරත නොවී තමාට ලැබෙන සියළු අවස්ථා ප්‍රයෝජනයට ගෙන ඇදහිලිවල නිරත වන්නට සූදානම් කර ගනී. ඔවුන් යම් අවස්ථාවෝචිත යුතුකමක් ලබා එය අල්ලාහ් විසින් අනුමත වූ, එකක් බව වටහාගත් කළ නවත් වන්දනාමාන අවස්ථාවක් ලැබෙන තුරු තමා ලබාගත් වන්දනාමාන අවස්ථාව තුලම තම සිත යොමු කිරීමෙන් කිසි සේත් ඉවත් වන්නේ නැත. සමහරවිට තම දැනුම වඩාගනු වස් ඥානා න්විතයන් සමගද, තවත් සමහර අවස්ථාවන්හී අනෙකුත් වන්දනාමාන කටයුතුවල නිරවන්නන් සමගද, තවත් සමහර අවස්ථාවන්හී අල්ලාහ්ගේ සිත කය වෙහෙසා ජිහාද් හී පසු වන්නන් සමග ඒකවීද, තවත් සමහර අවස්තාවන්හී යහකම් කරන්නන් සහ අල්ලාහ් සිහිකරමින් දික්ර්හී නිරත වන්නන් සමග පසුවීමද මොවුන්ගේ සාමාන්‍ය ක්‍රියාවකි.

එහෙයින් අප පෙර බොහෝ තැන්වල සඳහන් කළ පරිදි වන්දනාමානයන් යනු එක්තරා සීමා කොටුවකට පමණක් සීමා වී, කරන ඒවා තම නෙත් සිත් පිනවයි යන තම පින්පත ගණවෙයි යන අදහස් තුල පමණක් පාෂාණිභූත නොවී, තම නෙත්සත් පිනවිය හැකි අල්ලාහ් දෙවිඳුගේ ප්‍රියමනාපය ලැබිය හැකි කටයුතු කුමන මාදිලියේ කුමන වේසයේ වූවද ඒවා සියල්ල අල්ලාහ් වෙනුවෙන් කරන වන්ද නාමානයෙහිලා සළකා කටයුතු කිරීම සත්‍ය අදැහිලි වන්තකම යනුවෙන් ගිනිය කළ හැකිය. ඒ ගැන පරිශුද්ධ අල්කුර්ආනයම අප ඉදිරියේ මෙසේ විස්තර කරයි: *ඔබම වඳිමු. ඔබගෙන්ම උදව් උපකාර පතමු.* (1 : 5)

අල්ලාහ් දෙවිඳුගේ ආඥා අනපනත්වලට අවංකව කීකරුවී කටයුතු කරන්නා පෙර සඳහන් පරිශුද්ධවූ අල්කුර්ආන් වදන විස්තර කරන 'ඔබගෙන්ම උදව් උපකාර පතමු' යන වචනය අර්ථ කථනය කරන, එහි යථාර්තය බලාපොරොත්තු වන අන්දමටද ඔහු අඳින අඳුම්ද, වළඳන ආහාර, කුමක් වුවද අවස්ථාව ස්ථානය ගැන කිසිදු නැකීමකින් තොරව කිසිවෙකුගේ බලකිරීමකින් හෝ ආඥාවකින් හෝ තොරව නිදහස් සිතින් අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් සහ අනපනත් ඉටු කිරීමට තමා සූදානම් කරගෙන සිටී.

යමෙකු මෙසේ කටයුතු කරනවිට දූනද ක්‍රියාවන්හී නිරත වන්නන්, ඒ ඇදැහිලි වන්නයාගෙන් ඉවත්වීද සුදන ක්‍රියාවන් ප්‍රියවන්නන් ඔහු හා එක්වී කටයුතු කිරීමටද බොහෝසෙයින් තම කාලය මිඩංගු කරන අදිටනින් කටයුතු කරති. ඔහු මේසා ඇදිහිලකමේ තමා සාරවත් නිරත වන හෙයින් ඔහු කුමන ස්ථානයකට සිටියද කුමන මාදිලියේ පුද්ග ලයන් අතරට ගියද නිස්සාර පොළොවට අඹරෙන් ගලා බසිනා වැසි විලසින් ඔවුන්ටද ප්‍රයෝජනය වන සේ දිදුළුන්නේය.

පොල් ගසක රටඉඳි ගසක සියළු කොටස් ප්‍රයෝ ජන වන සේ මොහුගේ සමාජ වැසියන්ද මොහුගේ සියළු අවස්ථාවන් ගෙන්ම ඵලප්‍රයෝජන ලබනවා ඇත. එසේම අල්ලාහ්ගේ ආඥාවන් පටහැනිව තම සිතට වහල්වී ක්‍රියාකරන්නන් සහ දුදන ක්‍රියාවන්හී තම කාලය මිඩංගු කරන්නන් මොහු ඉදිරියෙහි සම්මුඛවීමට නොහැකිව ඔහුගේ ද්වේශයටද කෝපයටද පත්වන අයෙකු ලෙස වන බව නොකිව මනාය.

සියල්ල මනාව දන්නේ සර්ඥාන අල්ලාහ් පමණි.

وصلى الله تعالى على نبينا محمد وآله وصحبه وسلم.

مطابع الحميضي ت 4581000 ف 4592217 الرياض

# مجالات

# العبادة في الإسلام

## باللغة السنهالية

إعداد

القسم العلمي في الدار

الترجمة

عبد الحكيم محي الدين

المراجعة

محمد ناصم



# مجالات
## العبادة في الإسلام

**تأليف :**
القسم العلمي بالدار

**ترجمة :**
عبدالحكيم محي الدين

ردمك: ٩-١٠-٩٥٤٩-٩٩٦٠

دار الوطن للنشر
الرياض - الشفا - هاتف : ٤٠١١٧٧ - فاكس : ٤٠٢٨٨٣٧

Designed By : BANAN 012673455